



# ථූපවංස කථා

<u>පටුන</u>

1 <u>මහානාග යුවරජ</u>

2 <u>කාවන්තිස්ස රජු හා විහාරමහා දේවිය</u>

3 <u>ගැමුණු කුමරු පිළිසිඳ ගැනීම</u>

4 <u>දොළ උපත</u>

5 <u>දශ මහා යෝධයෝ</u>

6 <u>නන්දිමිත්‍ර යෝධයා</u>

7 <u>සුරනිර්මල යෝධයා</u>

8 <u>මහාසොණ යෝධයා</u>

9 <u>ගොඨයිම්බර යෝධයා</u>

10 <u>ථෙරපුත්තාභය යෝධයා</u>

11 <u>මහා භරණ යෝධයා</u>

12 <u>වෙළුසුමන යෝධයා</u>

13 <u>ඛඤ්ජදෙව යෝධයා</u>

14 <u>උන්මාද ඵුස්සදෙව යෝධයා</u>

15 <u>ලභිය වසභ යෝධය</u>

16 <u>යෝධයන්ගේ පින්කම්</u>

17 <u>කාවන්තිස්ස රජුගේ මරණය</u>

18 <u>දෙබෑයන්ගේ යුද්ධය</u>

19 <u>දුටුගැමුණු රජු පලා යෑම</u>

20 <u>නැවත සටන් කිරීම</u>

21 <u>තිස්ස කුමරු විහාරයට ගොස් වැදීම</u>

22 <u>මහා සංඝයා දෙබෑයන් සමගි කරවීම</u>

23 <u>දෙමළුන් හා සටනට සැරසීම</u>

24 <u>මියුගුණු දාගැබ් කථාව</u>

25 දෙමළ කඳවුරුවලට පහර දීම

26 සත්‍යක්‍රියාව

27 විජිතපුර සටන

28 කඩොලැතු යදොර බිඳීම

29 අනුරාධපුරයෙ හි සටනට නික්මීම

30 දීඝජන්තු යෝධයා

31 එළාර රජු ගේ මරණය

32 දුටුගැමුණු රජ ලක එක්සත් කිරීම

33 හල්ලුක යෝධයා

34 ඵෙරපුත්තාභය යෝධයා මහණ වීම

35 රජු ගේ දොම්නස

36 මිරිසවැටි විහාරය කරවීම

37 විහාර පූජාව

38 ලෝවාමහාපායේ සැලැස්ම

39 ලෝවාමහාපාය කරවීම

40 ලෝවාමහාපාය සංඝයා වහන්සේට පිළිගැන්වීම

41 මහ සෑයට උළු ලැබුණු අයුරු

42 රන් පහළ වීම

43 තඹ පහළ වීම

44 මැණික් පහළ වීම

45 රිදී පහළ වීම

46 මුතු හා පබළු

47 මැණික් සතරක්

48 කර්මාන්ත පටන් ගැනීම

49 නුවර බෙර ලැවීම හා සැරසීම

50 රජු දගබ බඳින තැනට පෙරහරින් යෑම

51 රැස්වූ මහා සංඝයා වහන්සේ

52 දා ගැබෙහි ප්‍රමාණය ගත් සැටි

53 මඟුල් උළු පිහිටුවීම

54 සත් දවසක් මහ දන් දීම

55 උළුවඩුවන් රැස් කරවීම

56 දාගැබ් කර්මාන්තයට සහභාගිවීමට ගිය තෙර නමක්

57 තවත් තෙර නමක්

58 දාගැබ් කර්මාන්තයෙන් බැඳි කොටස පොළොවෙ හි ගිලීම

59 උතුරුකුරු දිවයිනෙන් ගල් ගෙන්වීම

60 ධාතුගර්භ වර්ණනාව

61 භාතිය රජු ගේ චෛත්‍යය පූජාව

62 ධාතුගෙන ඊට සොණුත්තර හෙරණපාණන්ට පැවරීම

63 ගැමුණු රජ ධාතු නිධාන ස්ථානයට යෑම

64 සොණුත්තර හෙරණපාණන් නා ලොවට වැඩම වීම

65 දාකරඬුව සැඟවීම

66 නාලොව සත් රුවන් දාගැබ හා දාගෙය

67 හෙරණපාණන් ඍද්ධි බලයෙන් දාකරඬුව ගැනී

68 නාගයන් හඬාවැලපීම

69 දෙවියන් ගේ පුද සත්කාර

70 රජු ධාතූන් වහන්සේ වැඩමවීම

71 ලංකා රාජ්‍යයෙන් ධාතූන් වහන්සේ පිදිම

72 ධාතු නිධානය හා ප්‍රාතිහාර්යයය

73 ධාතු පූජා

74 ධාතු ගර්භය වැසීම

75 <u>ගැමුණු රජු ගේ ව්‍යාධිය හා කුමරු ගේ පැමිණීම</u>

76 <u>ථෙරපුත්තාභය හිමියන් රජුට බණ කීම</u>

77 <u>පින් පොත කියැවීම</u>

78 <u>මරණාසන්න මොහොතෙ හි සිත පැහැදවූ දාන දෙක</u>

79 <u>රජුගේ ආයාචනය හා අනුශාසනය</u>

80 <u>ස්වර්ග ප්‍රාප්තිය</u>

ඉක්බිති දෙවෙනිපෑතිස්ස රජ්ජුරුවන් බොහෝ පින්කම් කොට සතළිස් අවුරුද්දක් රාජ්‍යය කොට මළ කල උන් ගේ මලණුවෝ උත්තිය නම් රජ්ජුරුවෝ රජ පැමිණ දස අවුරුද්දක් රාජ්‍යය කළෝ ය. උන්ට ඉක්බිතිව උන්ගේ මළණුවෝ මහාසීව රජ්ජුරුවෝ දස අවුරුද්දක් රාජ්‍යය කළෝ ය. උන්ගේ මලණුවෝ සූරතිස්ස රජුපුරුවෝ දස අවුරුද්දක් ම රාජ්‍යය කළෝ ය. සූරතිස්ස නම් රජ්ජුරුවන්ට ඉක්බිති අස් නැවියකුගේ පුත් වූ දෙමළ දෙන්නෙක් සූරතිස්ස රජ්ජුරුවන් මරාපියා දෙවිසි හවුරුද්දක් දැහැමින් රාජ්‍යය කළෝ ය. පසුව උන් දෙන්නා අල්වා ගෙන මරාපියා මුටසීව නම් රජුගේ පුත් අසෙල නම් රජෙක් දස හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. පසු ව සොළිරට එළාල නම් රජෙක් අසෙල නම් රජු මරාපියා සූසාළිස් අවුරුද්දක් රාජ්‍යය කෙළේ ය. එළාල රජු හා සටන් කොට දුටුගැමුණු නම් රජ එළාල රජු මරාපියා රජු විය. ඒ දුටුගැමුණු රජ්ජුරුවන්ගේ පූර්ව පිළිවෙළ කථාව යි.

## මහානාග යුවරජ

දෙවෙනිපෑතිස්ස රජ්ජුරුවන් ගේ දෙවෙනි මල් මහානාග නම් යුව රජ්ජුරු කෙනෙක් ඇත. ඉක්බිති රජ්ජුරුවන් ගේ අග මෙහෙසුන් බිසවු තමන් ගේ පුතණුවන්ට රාජ්‍යය දෙනු කැමති ව සරස්නා වැව බඳවන සුළුගෙයි යුවරජ්ජුරුවන්ට අඹයෙ හි සිරිහි ලාලා තෙසු අඹ හා සැළියේ ලා සිරිහි ලූ අඹය මතුපිට තබා යවූ ය. බිසවුන් ගේ පුතාත් කුඩා පියාණන් හා සමග වැව බඳිනා තෙනට ගියේ ය. එ වේලෙ හි අඹ ගෙන ගිය බඳුන අස් කඩන්නා හා ම කුමාරයා මතුපිට විෂ මිශ්‍ර කොට තුබූ අඹ ගෙඩිය අතට ඇරගෙන කා එවිට ම මළේ ය. යුවරජ්ජුරුවෝ ඒ කාරණය දැක බෑණන් කෙරෙහි ආසා සිදි කරන රාජ්‍යය ලොභයත් හැර දෙවින් කෙරෙහි හයින් බෑණන්ට නො කියා එතැන සිට තමන් ගේ බිසවුන් හා සේනාවත් හැරගෙන රුණට පලා අවු ය. එ සේ එන රජ්ජුරුවන්ගේ බිසවු අතර මහ යටාල නම් විහාර යෙහිදි පුතණු කෙනකුත් වදාපී හ. ඒ වැදූ පුතණුවන්ට තමන් ගේ බෑණන් ගේ නම ම තුබූ හ. පසු ව බිසවුන් නාපී කල ඉන් නික්ම මාගම වසන රජ රුණ ම රාජ්‍යය කෙළේ ය.

උන්ගේ අයාමෙහි උන්ගේ පුත් වූ යටාලතිස්ස කුමාරයෝ මාගම ම රාජ්‍යය කළෝ ය. උන්ට ඉක්බිති ව උන් ගේ පුතණුවෝ ගොඨාභය නම් රජ්ජුරුවෝ එ ම මාගම රාජ්‍යය කළෝ ය.

## කාවන්තිස්ස රජු හා විහාරමහාදේවිය

ගොඨාභය රජ්ජුරුවන් ගේ පුතණුවෝ කාවන්තිස්ස රජ්ජුරුවෝ එ ම මාගම ම රාජ්‍යය කළෝ ය. ඒ කාවන්තිස්ස රජ්ජුරුවන් ගේ වනාහි විහාර මහාදේවි නම් බිසෝ කෙනෙක් ඇත. උන් කෙ සේ වූ කෙනෙක් ද යත්, කැලණිතිස්ස නම් රජ්ජුරු කෙනෙක් ඇත. උන්ගේ උත්තිය නම් මලණු කෙනෙක් ඇත. ඒ මලණුවෝ කැලණිතිස්ස රජ්ජුරුවන් ගේ අගමෙහෙසුන් බිසවුන් හා සංවාසයක් ඇති ව වසන්නෝ ය. ඒ සැළ ව ගිය තැන දී බෑණන් කෙරෙහි හයින් පලා ගොස් තමන්ට පාසු තෙනක වසන්නෝ බිසවුන් කෙරේ කළ සොකයෙන් බිසවුන්ට සොරා පත්හස්නක් යවූ ය. ඒ කෙ සේ ද යත්, එක් පුරුෂයකු කැඳවා ඌ සිවුරු පොරොවා පත ඌ අතට දී කැලණියට යවූ හ. ඒ සොරාත් පත හැරගෙන ගිය තැනැත්තෝ, රජ්ජුරුවන් ගේ රජ ගෙට අවුත් වන. ඒ රජගෙයි නිරන්තරයෙන් රහත් තෙර කෙනකුන් වහන්සේ වළඳන්නට වඩනා සේක. එ සේ වඩනා තෙරුන් වහන්සේට නො හඟවා ඒ පත ගෙන ගිය සොරා ඔබ හා කැටිව ඇතුළ

රජගෙට වැද කෙළවර හස්නේ හිඳ වළඳා වැළඳූ අන්තයෙහි රජ්ජුරුවන් තෙරුන් වහන්සේ ට පසුගමන් කරන්නට නික්මුණු කල තෙමේ පසු වූයේ පසු ව ලා එන බිසවුන්ට පෙනෙන සැටියේ පත බිම හෙළා ලී ය. තෙරුන් වහන්සේට ආදර සිතින් අත දි ලා ඉදිරියෙ හි යන රජ්ජුරුවෝ පත බිම හුණු හඬ අසා පිටිපස්ස බැලූ හ. රජ පත දැක, නුවණ නැති කම් කළ ඒ කැලණිතිස්ස රජ, "මේ පත අකුරු අනික් කෙනකුන් අත අකුරු නො වෙයි. මේ තෙරුන් වහන්සේ අත අකුරු ය" යි කියවා කොපයෙන් තමාගේ මලුගේ අත අකුරු දැන ගත නුහුණුයේ පත ගෙන ගිය සොරා මරා මුදුදියට දමාපියා, "තෙරුන් වහන්සේ ගනුව" යි කියා තෙල්කටාරයේ ලා තෙල් කකියවන්නේ තෙල් හුණු කොට ගත නුහුණුයේ ය. තෙරුන් වහන්සේ තෙල් කටාරයේ වැඩ හිඳ තෙල් හුණු නොවන්නට කාරණ කිම්දෝ හෝයි දිවසින් බලන සෙක්, යටගිය ජාතියෙ හි ගොපලු ව තමන් වහන්සේ උපන් තෙන දී කකියන හුණු කිරි සැළක මැස්සකු හෙළා මැරු ලෙස දැක, "රජු ගේ වරද නැත. යටගිය ජාතියෙ හි මා කළ කර්මය" යි දැන වැඩහුන් පසු තෙලෙ හි ම කකියා පිරිනිවන් පෑ වදාළ සේක. එ වෙලෙ හි දේවතාවෝ තෙරුන් වහන්සේ කෙරෙහි කළ ශොකයෙන් කිපී, "මේ රජුත් මේ රජුගේ රටත් ගලා මරම් හ" යි මුද උත්පාතික කොට ඕහුගේ නුවර ගලන්නට පටන් ගත් හ. එ වේලෙ හි කැලණිතිස්ස රජ තමාගේ රාජ වංශයෙ හි උපන් විශේෂ රූ ඇති තමා ගේ දියණිය දිව්‍යාංගනාවක සේ සරහා සැළෙක හිඳුවා බිසවුන් නියාවට සැළ අකුරු ලියවා මුදුදියට සැළ හැරපි ය. එ ලෙස බිසවුන් නැඟි සැළ කාවන්තිස්ස රජ්ජුරුවන් ගේ කෙවුළෝ දැක ගොසින් කාවන්තිස්ස රජ්ජුරුවන්ට කී හ. රජ්ජුරුවෝ එ බස් අසා සතුටු ව අවුත් බිසවුන් දැක බිසවුන් නියාවට සැළ අකුරු කියවා බිසවුන් හැරගෙන මහ පෙරහරින් මාගමට ගොස් සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නාවා රන් සළු හඳවා සර්වාභරණයෙන් සරහා රුවන් රුසක් පිට සිටුවා රුවන් සකින් අභිෂෙක ජලය දී නැඟි තොට විහාර කරවූ හෙයින් විහාර මහාදේවී ය යි යන නමින් ප්‍රසිද්ධ කොට අග මෙහෙසුන් තැන තුබූ හ. ඒ විහාරමහාදේවී කාවන්තිස්ස රජ්ජුරුවන්ට ඉතා ප්‍රියයෝ ය. මන වඩති. ඒ දෙදෙනා සුවසේ වසන කල එක් දවසක් විහාරමහාදේවී රජගෙයි දී බොහෝ සංඝයා වහන්සේට මහ දන් දී වළඳවා වැළඳූ අන්තයෙ හි සුවඳ මල් තෙල් බෙහෙත් බඩු මේ ආදීය ගෙන්වාගෙන මහ පෙරහරින් විහාරයට ගොස් ගෙන්වා ගෙන ගිය බෙහෙත් සත් ආදිය මහා සංඝයා වහන්සේ ට දන් දී ඔබ ගේ ශ්‍රී පාදය වැඳ, "දුන් දනෙ හි අනුසස් අසනු කැමැත්තෙමි" යි ආරාධනා කොට එකත්පස් ව සහපිරිවරින් බණ අසන්නට උන් හ. එ වේලෙ හි එ සේ හුන් විහාරමහාදේවීන්ට ධර්මදේශනා කරන තෙරුන් වහන්සේ මෙ සේ වදාළ සේක, කෙ සේ ද යත් "යටගිය ජාතියෙ හි තොප කළ සුචරිත පින්කමින් මෙවෙනි සම්පත් ලදුව. දැනුත් අප්‍රමාද ව පින් කළා නම් මතු මෙයට වඩා සම්පත් ලැබ නිවන් දක්නාවා දැ" යි වදාළ සේක. එ බස් ඇසූ විහාරමහාදේවී තෙරුන් වහන්සේට මෙ සේ කීවාහු ය, "ස්වාමීනි, මා වඳ වූව, දරු කෙනෙක් මට නැත. සම්පත්තීන් කාරිය කිම්දැ, යි කිවු ය. එ බස් ඇසූ සර්වඥ පුත්‍ර වූ ප්‍රතිපත්තියට දිවි පුදන්නා වූ අෂ්ටායී පුද්ගල වූ තෙරුන් වහන්සේ, "මේ දේවීන්ට පුත්‍ර ලාභයකට හේතුවෙක් ඇද්දෝ හෝ" යි දිවසින් බලා වදාරන සේක්, දරු කෙනකුන් ලබන නියාව දිවසින් දැක බිසවුන්ට මෙසේ වදාරන සේක්, "මහ පිනැති දේවිනි, තෙල ගෙයි වසන ගිලන් වූ මියන්නට ආසන්නව සිටි සාමණෙරයන් හා කථාකරව" යි වදාළ සේක.

## ගැමුණු කුමරු පිළිසිඳ ගැනීම

එ බස් ඇසූ බිසවු ලැගුම් ගෙට ගොස් ඒ ලැගුම් ගෙයි වැද හොත් සාමණෙරයන් වහන්සේ සමීපයට එළඹ වැද" දොහොත් මුදුනෙහි තබා ගෙන මෙසේ දැන්වූ ය. "ස්වාමිනි, මාගේ සම්පත් ඉතා මහත. මේ අත්බැවින් චුත ව මට දරු වුව මැනවැ" යි ආරාධනා කළෝ ය. එ බස් ඇසූ සාමණෙරයන් වහන්සේ, "මිනිසත් බව ඉතා ප්‍රතිකූල ය" යි සිතා නො ඉවසා වදාළ සේක. නුවණැත්තා වූ ඒ විහාරදේවී එ බව දැන බොහෝ සුවඳ මල් ගෙන්වා ගෙන සාමණෙරයන් අත පහරවා මල් පුදා නැවතත් දරු වන්ට ආරාධනා

කළෝ ය. සාමණෙරයන් වහන්සේ නො ඉවසත් ම සාමණේරයන් වහන්සේගේ ඉඟි දත් ඒ විහාරදේවී එ විට ම අරළු උක්සකුරු හෙළ ගිතෙල් මේ ආදී බොහෝ බෙහෙත් බඩු ද නැවත බොහෝ සිවුරු සළුපිළි ද ගෙන්වා ගෙන සාමණෙරයන් වහන්සේ අත පහරවා, "ස්වාමීනි, නුඹ වහන්සේ නමට දන් දෙමි" යි කියා මහා සංඝයා වහන්සේට පිළිගන්වා නැවතත් දරු වන්ට ආරාධනා කළෝ ය. එ වේලෙ හි සාමණෙරයන් වහන්සේ, "දුක්පත් ව උපනොත් පින් කොට ගන්ට බැරි ය. මේ බිසවුන් බඩ පිළිසිඳ" රජ ව ඉපද ගත්තොත් බොහෝ පින් කොටගත හැක්කැ" යි සිතා, එ විට, "මම දරු වෙමි" යි බිසවුන් මුහුණ මෛත්‍රියෙන් බලා ඉවසා වදාළ සේක.

එ විට සතුටු සිත් ඇති බිසවූ වැඳ සමුගෙන යානාවට නැඟී නික්මුණු ක්ෂණයෙ හි ම සාමණෙරයන් වහන්සේ ද නිරුද්ධ ව බිසවුන් මාළිගාවට නො යන තෙක් ම බඩ විදුරු පුරාපී කලක් මෙන් බිසවුන් බඩ පිළිසිඳ" ගත් සේක. එකෙණෙහි බිසවූ සාමණෙරයන් වහන්සේ මළ බැව් දැන, යන ගමන් වැළකී විහාරයට පෙරළා අවුත් සාමණෙරයන් වහන්සේ මළ පවත් කාවන් තිස්ස රජ්ජුරුවන්ට කියා යවා රජ්ජුරුවන් ගෙන්වා ගෙන දෙමහල්ලෝ ම බොහෝ පූජා සත්කාර කොට සාමණෙරයන් වහන්සේට ආදාහන පූජා කරවා බිසවූ රජ ගෙට නො ගොස් විහාරයෙහි ම වැස මහා සංඝයා වහන්සේ ට මහ දන් දුන් හ.

## දොළ උපත

නැවත මහ පිනැති බිසවුන්ට මේ නියා දොළෙක් උපන. කෙ සේ වූ දොළෙක් ද යත්, සියක් රියන් දිග ඇති මහත් මීවැදැල්ලක් සමීපයෙහි හිස තබා ගෙන වමැලයෙන් යහන්පත් ව දොළොස් දහසක් මහා සංඝයා වහන්සේ ට මී දන් දී ඉතිරි මී තමා අතින් කඩා ගෙන කන්නට ද, නැවත අනුරාධපුර නුවර රජ කරන එළාල රජ්ජුරුවන් ගේ විසිමහා යොධයන් අතුරෙන් නායක යොධයා ගේ ඉස කැපූ කඩුව දෙව ඒ පැන් ඔහු ගේ හිස මැඩ ගෙන බොන්නට ද, නැවත අනුරාධපුර නුවර දෙමළ රජු ගේ තිසා වැව මානෙල් කෙතින් නො මලා ගිය මානෙල් මල් පලඳින්නට ද, යන මෙතෙක් දොළ දේවීන්ට උපන. කාවන්තිස්ස රජ්ජුරුවෝ විහාරදේවින්ට උපන් දොළ අසා නිමිත්ත දන්නවුන් ගෙන්වා ගෙන වීචාළෝ ය. එබස් ඇසූ නිමිත්ත පාඨකයෝ තමන්ගේ නුවණින් පරීක්ෂා කොට දිවසින් දුටුවන් මෙන් කියන්නෝ, "දෙවයන් වහන්ස, නුඹ වහන්සේ ගේ මේ බිසවුන් බඩ පිළිසිඳ ගත්තේ මහ පිනැති පුතණු කෙනෙක. ඌ තුමූ දසළුකඩ මසින් බිහි ව වැඩිවිය පැමිණ මතු මේ ලංකාද්වීපය පුරා ගෙන හුන් දෙමළුන් මරා ලක්දිව බුදුසසුන් පවත්වති" යි කිවු ය. එ බස් ඇසූ රජ්ජුරුවෝ මාගම බෙර ලවන්නෝ මෙ සේ කියා බෙර ලැවූ ය. කෙසේ ද යත්, "සියක් රියන් දිග ඇති මී පටලයක් දැක මට කී කෙනෙක් ඇත්නම්, බොහෝ සම්පත් මාගෙන් ලැබෙති" යි කියා බෙර ලැවූ ය.

ඉක්බිති ගොළු මුහුද වෙරළ මුණින් නමා තුබූ මාලු නැවක මීමැස්සෝ මී බැඳ තුබූ ය. මිනිසෙක් ඒ මී දැක කාවන්තිස්ස රජ්ජුරුවන්ට දැන්විය. රජ්ජුරුවෝ එ බස් අසා සතුටු ව මහ පෙරහරින් බිසවුන් එතැනට ගෙන ගොස් එතැන් හි යහපත් කොට මඩුවක් ලවා ඒ මඩුව සරහා යහන් පනවා බිසවුන් මී අනුභව කරවන්නට දොළොස් දහසක් රහතුන් වහන්සේ ට ද මී දන් දුන් හ. නැවත ඉතිරි දොළ බිසවුන්ට දෙනු කැමැති කාවන්තිස්ස රජ්ජුරුවෝ වෙළුසුමන නම් යොධයා කැඳවා දොළ ගෙනෙන්නට නියෝග කළෝ ය. ඒ යොධයා රජ්ජුරුවන් කී බස් ගිවිස මාගමින් නික්ම අනුරාධපුර නුවරට එ දවස් ම ගොස් දෙමළ එළාල

රජුගේ මඟුලසු රකිනා අස්සලයා හා මිත්‍ර ව ඔහු කරන සියල්ල ම තෙමේ කොට නැවත වෙළුසුමන තෙම අස්සලයා තමාට නො වෙනස් බව දැන එක් දවසක් උදැසන ම මානෙල් කෙතින් මානෙල් මල් කඩා ගෙන කොළොම් ඔය සමීපයේ මලුත් කඩුවත් සඟවා තබා කිසි කෙනකුන් කෙරෙහි භයක් සැකක් නැති ව වෙළුසුමන එළාල රජුගේ මඟුලසු පිට ට පැන නැඟී තමා ගේ යෝධ නම් අස්වාලා, "සුරෙක් මා අල්වා ගනුව"යි කියාලා අශ්ව වේගයෙන් නික්මිණ. ඒ ඇසූ දෙමළ රජ වෙළුසුමනයන් ගන්නා පිණිස යොධයන් විසි දෙනාගෙන් නායක යොධයාට තමා නැඟෙන දෙවෙනි මඟුලසු දී, "ඌ ගනුව" යි සමු දින. එ වේලෙ හි වෙල්දෙව නම් දෙමළ යෝධයා රජ්ජුරුවන් වැඳ සමුගෙන අසු පිටට පැන නැඟී අශ්ව වේගයෙන් ඔහු අඹා දිවී ය. එ වේලෙ හි වෙළුසුමන තමා පසුපස්සෙ හි අඹා දිවන දෙමළ යෝධයා දැක කැලයක් මුවාව ගෙන අසුපිට හිඳ වේගයෙන් දිවන්න වුට කඩුව සරස් කොට පෑ උ ගේ හිස කපා හිස අසුපිට තබා ගෙන ඌ ගෙනා අසුත් හැර ගෙන එ දවස් ම සවස් වේලෙ හි මාගමට ගොස් වන. එ වේලෙ හි කාන්තිස්ස රජ්ජුරුවෝ සතුටු ව බිසවුන් රුචි වූ පරිද්දෙන් දොළ දෙවා දොළ පහ කොට වෙළුසුමනයන්ට බොහෝ සම්පත් දුන් හ. ඉක්බිති බිසවු වැදුව මනා සමයෙ හි මහ පිනැති උතුම් කුමාරයන් වැදූ ය. එ දවස් කුමාරයන්ගේ පිනින් රුවන් පිරූ නැව් සතෙක් අවුදින් තොටට බට. තව ද කුමාරයන් ගේ පිනින් හිමාලයෙ හි ඡද්දන්ත විලින් එක් ඇතින්නක් තමා ගේ පුතු ඇලි ඇත් පැටවකු ගෙනහැර හෝ තෙර ලාපියා පලා ගියා ය.

එ තැන සිටි ඇලි ඇත් පැටවු බිලි බාන්නට ගිය කඩොල් නම් බිලී වැද්දෙක් දැක රජ්ජුරුවන්ට කී ය. එ බස් ඇසූ රජ්ජුරුවෝ ඇත්තලයන් යවා ඇත් පැටවු ගෙන්වා ගෙන පෙරහර තබා දුන්හ. කඩොල් නම් බිලී වැද්දවු දුටු විසින් ඒ ඇතුට කඩොලැතා යයි නම් විය. නැවත කුමාරයන් උපන් දවස් ම රන් වළන් පිරූ නැවකුත් තොට ට බට. රජ්ජුරුවෝ එයින් ගෙන්වා ගෙන තැබූ ය. කාවන්තිස්ස රජ්ජුරුවෝ පුතණුවන්ට නම් තබන මඟුලෙ හි දොළොස් දහසක් සංඝයා වහන්සේ රැස් කරවා, "මාගේ පුතණුවෝ සියලු ලංකාද්වීපයෙ හි දෙමළුන් සාධා බුදුසසුන් ඇති කෙරෙත් නම්, ගෝතම නම් තෙර කෙනකුන් වහන්සේ මා ගේ පුතණුවන් අත අල්වා ගන්නා සේක්ව" යි, "උන්වහන්සේ ම සරණ ශීලයෙහි පිහිටුවන සේක්ව" යි සිතූ හ. රජ්ජුරුවන් සිතූ සැටි ම විය. ඒ සියලු නිමිත්ත දැක රජ්ජුරුවෝ සතුටු ව සංඝයා වහන්සේට කිරිබත් දන් දී පුතණුවන්ට ගැමුණු කුමාරයෝ ය යි නම් තැබූ ය. නැවත බිසවුන් හා පුතණුවන් හැරගෙන විහාරයෙන් රජගෙට ගිය හ. එ සේ රජගෙට ගෙන ගිය නව දවසකින් දේවින් හා කැටීව සංසර්ග වූ හ. ඒ සංසර්ගයෙන් නැවතත් පුතණු කෙනකුන්ට උපතක් සිටියේ ය. ඒ උපත සිට වැදූ කුමාරයන්ට තිස්ස ය යි නම් තැබූ හ. මෙ සේ මහ පෙරහරින් දෙබෑයෝ වැඩුණාහු ය. රජ්ජුරුවෝ දරුවන් දෙන්නා ගේ සියලු මඟුලෙ හි ම පන්සියයක් පන්සියයක් මහණ වහන්දැට කිරිබත් දන් දුන් හ. නැවත කුමාරයන්ට බත් කවන මඟුලෙ හි එ සේ ම පන්සියයක් දෙනා වහන්සේ පවරා වළඳවා වැළඳූ අන්තයෙ හි රන් තලිය ගෙන හැර දෙමහල්ලෝ ම පන්සියයක් දෙනා වහන්සේ ගෙන් පන්සියයක් බත් ආලොප ගෙන දරුවන් දෙන්නා ගෙන තබා බතට හිඳුවා මෙ සේ කිවු ය. "දරුවෙනි, තෙපි දෙදෙනා බුදුරජාණන් වහන්සේගේ සස්නෙහි පින් කරවු නම්, මේ බත තොපගේ කුසහෙ යෙහෙන් දිරාව" යි කියා දුන්නු ය. කුමාරවරු දෙබෑයෝ ඒ බත අමාවක් මෙන් කැවු ය. උන් දෙබෑයන් (දස) දොළොස් හැවිරිදි වූ කල දරු දෙන්නා විමසනු පිණිස පෙර සේ ම වහන්දෑ වරුන් වළඳවා වැළඳූ අන්තයෙ හි වැළඳූ බත් තලියෙ හි ලා ගෙන දෙබෑයන් හිඳුවාලා තලියේ බත් තුන් කොටසක් කොට ඒ කාවන්තිස්ස රජ්ජුරුවෝ දෙබෑයන්ට මෙ සේ කිවු ය. "තෙපි දෙබෑයෝ ම 'අපගේ කුල දෙවතා වූ සංඝයා වහන්සේට විමතියක් නො කරම් හ" යි කියා මේ බත් තුන් කොටසින් එක් කොටසක් කව" යි කිවු ය. එ වේලෙ හි එ බස් ඇසූ දෙබෑයෝ, "අපි දෙන්න ම නිරන්තරයෙන් ම සංඝයා වහන්සේට, පියාණන් වහන්ස, නුඹ වහන්සේ කී සැටියේ ම කරම් හ" යි කියා පළමු කොටස කැවු ය. නැවත රජ්ජුරුවෝ කියන්නෝ, "අපි දෙබෑයෝ ඔවුනොවුන්ට විපක්ෂ  නො වම් හ යි කියා දෙවෙනි කොටස කව" යි කිවු ය.

ඒ කොටසත් එ සේ ම කියා අමාවක් මෙන් කෑවු ය. තුන්වන කොටස, "දෙමළුන් හා සටන් නො කරම්හ යි කියා දිවුරා කව" යි කිවු ය. මෙ සේ රජ්ජුරුවන් කී කල් හි තිස්ස කුමාරයෝ තමන් අතින් ගත් බත් පිඩ පිට හෙළාපියා පලා ගියේ ය. ගැමුණු කුමාරයෝ ද එ සේ ම තමන් ගත් බත් පිඩ තලියේ හෙළාපියා තමන් වැදහෝනා තැනට ගොස් යානට පැන නැඟී අත පය හකුළුවා ගෙන වැද හොත්තේ ය. එ වේලෙ හි එ ලෙස හොත් පුතණුවන් දැක විහාරමහා දේවි ශෝකයෙන් කම්පා ව සුසුම් ලා මෙ සේ කියන්නා හ. "ඇයි, පුතණ්ඩ, ගැමුණු කුමාරයෙනි! මේ යහන සුව සේ අතපය දික් කොට වැද නො හෙව කුමක් පිණිස අතපය වක් කොට ගෙන බැණ නො නැගී වැද හෝනාවු ද පුතණ්ඩැ" යි කිවු ය. එ බස් ඇසූ ගැමුණු කුමාරයෝ, "කුමක් කියන සේක් ද මෑණියන් වහන්ස! ගඟින් එතෙර දෙමළුන් වුව, මෑතින් ගොළු මුහුද වුව, කෙ සේ ද මා අතපය දික් කොට සුවසේ වැද හෝනේ? දැ යි කිවු ය. එ බස් අසා ගැමුණු කුමාරයන් ගේ අභිප්‍රාය දත් මවුපියෝ මුයෙන් නො බිණූ ය. ගැමුණු කුමාර තෙම ක්‍රමයෙන් වැඩෙන්නේ සොළොස් හැවිරිදි වි ය. ඒ කුමර මහ පිනැතියේ මහත් යසසට පැමිණියේ ය. ධෛර්යෙන් ද තෙජසින් ද බල පරාක්‍රමයෙන් ද යුක්ත ය. හස්ති ශිල්ප අශ්ව ශිල්ප රථ ශිල්ප ඛඬ්ග ශිල්ප ධනු ශිල්පයෙ හි දක්ෂ ය. ඒ මහා බල ඇති ගැමුණු කුමාර තෙමේ මාගම විසී ය.

## දශ මහා යෝධයෝ

ඉක්බිති කාවන්තිස් රජ්ජුරුවෝ පුතණුවන් ගැමුණු කුමාරයන්ට සේනාවක් දී ඇති කරන පිණිස නන්දිමිත්‍ර යෝධයන් ඇතුළු ව දස දෙනකු දුන් හ. ඒ යෝධයෝ කිනම්හු ද යත්, නන්දිමිත්‍ර නම් යෝධයාණ කෙනෙක, සුරනිර්මල නම් යෝධයාණ කෙනෙක, මහාසොණ නම් යෝධයාණ කෙනෙක, ගොඨයිම්බර නම් යෝධයාණ කෙනෙක, ථෙරපුත්තාභය නම් යෝධයාණ කෙනෙක, භරණ නම් යෝධයාණ කෙනෙක, වේළුසුමන නම් යෝධයාණ කෙනෙක, ඛඤ්ජදේව නම් යෝධයාණ කෙනෙක, ඵුස්ස දෙව නම් යෝධයාණ කෙනෙක, ලභිය වසභ නම් යෝධයාණ කෙනෙක යන මෙ කී දශ මහා යෝධයන් පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. ඒ දශ මහා යෝධයන් ගේ උත්පත්ති ගම් බිම් උන් කළ කුසල් මෙ සේ දත යුතු. හේ කෙ සේ ද යත්,

## නන්දිමිත්‍ර යෝධයා

නන්දිමිත්‍ර නම් යෝධයා අනුරාධපුර නුවර නැගෙනහිරි දිශාවෙ හි රාජ්‍යය කරන එළාල රජ්ජුරුවන් ගේ මිත්ත නම් සෙනෙවිරත් කෙනෙක් ඇත. ඒ සෙනෙවි රදුන් හා එකකුස හෝත් නැඟණියන් ගේ පුතණුවෝ ය. ඌ අනුරාධපුර නුවරට නැගෙනහිර දිශාවෙ හි සිතුල් පවුව ය යි යන පර්වතයක් සමීපයෙ හි කඩදොර යන ගම උපන්නේ ය. එ සේ උපන් කුමාරයන්ට නම් තබන්නෝ මයිලණුවන් ගේ නම තබන්නාහු මිත්ත නම් තුබූ හ. ඒ මිත්ත නම් කුමාරයන් දණ හෙළා ඇවිදිනා කල දණ ගාගෙන කුමාරයා දුරට යන විසින් මෑණියෝ වලකා වෙහෙසි පියා "තට කියටි දනිමි" යි වරපටක් හැර ගෙන කුමාරයන් හිණ බැඳලා ඒ වරපට කෙළවර දාගල බැන්දෝ ය. ඒ කුමාර, "මෑණියෙනි, තොප බැඳ රුදෙවුවත් මා රඳන්නේ නැතැ" යි බැඳ ලූ දාගල ඇද ගෙන යන කුමාර එළිපත දක්වා ඇද ගෙන ගොස් එළි පත් පඩියේ දාගල වැද ගත් විසින්, එ සේ ද වුව ත් ගලත් ඇද ගෙන යෙමී" ගල අදිනාවූ හිණ බැඳි වරපට සිඳි ගියේ ය. වරපට සිඳි ගිය හෙයින් නන්දි මිත්‍රයෝ ය යි එ දා පටන් මේ නමින් ප්‍රසිද්ධ වූයේ ය. ඒ නන්දිමිත්‍ර කුමාර ක්‍රමයෙන් වැඩී අභිවෘද්ධියට පැමිණියේ ය. ඇතුන් දශ දෙනකුට බල දරන්නේ ය. උභු අනුරාධපුර නුවරට ගොස් මයිලණුවන් මිත්ත නම් සෙනෙවිරදුන්ට ම සේවාකම් කෙරෙති. එ සමයෙ හි අනුරාධපුර එළාල රජු ගේ

දෙමළු සවස උදැසන පලා ගොස් ථූපාරාම මළුවෙ හි හා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටි මළුවට ගොස් කිස අත්පස කරන දෙමළුන් දැක නන්දිමිත්‍ර නම් යෝධයා මෙ සේ සිති ය. "මා වැනි සැදැහැ ඇති තුනුරුවන් දස් එකක්හු මේ දැක දැක හිදිනා බව සුදුසු නො වෙයි" සිතා දිව ගෙන ගොස් විහාරය නසන දෙමළුන් අල්වා ගෙන හඬව හඬවා බලි සේ හෙළා ගෙන සල්ව සල්වා තමා ගේ දකුණු පයින් උන්ගේ කලවා මැඩ අතින් අනික් පය ඔසවා ගෙන මහත් බල ඇති නන්දිමිත්‍රයා දෙමළුන් දෙකඩක් කොට පළා පවුරෙන් පිටතට දමන්නේ ය. එ ලෙස ඇමු දෙමළුන් දැක, "නන්දිමිත්‍රයන්ට භය එති" යි සිතා දෙවියෝ අන්තර්ධාන කෙරෙති. මෙ සේ මරණ දෙමළුන් දවසකට පනසක් සැටක් බැගින් බොහෝ දෙමළුන් මැරූ කල දෙමළුන් ගේ විනාශය දැක අමාත්‍යයෝ එළාල රජ්ජුරුවන් කරා ගොස් මෙ සේ කිවු ය. "දේවයන් වහන්ස, යක්ෂ රාක්ෂයකු සිංහ ව්‍යාඝ්‍රයකු විසින් කන බව ත් නො දනුම් හ. එ සේ ඔවුන් කතොත් ඉසකේ ඇට ආදිය නො දකුමෝ ද? මීට කාරණ කිම් දැ" යි රජ්ජුරුවන් විචාළෝ ය. එ බස් ඇසූ රජ්ජුරුවෝ අමාත්‍යයන්ට මෙ සේ කිවු ය. කෙ සේ ද යත්. "තෙපි හැම දෙන රාත්‍රියෙ හි ඒ ඒ ස්ථානවල සැඟවී සිට ඒ උපද්‍රව කරන්න වුන් අල්වා ගෙන මා සමීපයට ගෙනෙව. උන්ට කළමනා දැ දනිමි" යි අමාත්‍යයන්ට සම්මත කළෝ ය. එතැන් පටන් නුවර පරීක්ෂා කරන්නා වූ අමාත්‍යයෝ පරීක්ෂා කොට දෙමළුන් මරන නන්දිමිත්‍රයන් අල්වා ගත නුහුණුවා හු ය. දෙමළුන් මරන නන්දිමිත්‍රයෝ එක් දවසක් මෙ සේ සිතූ ය. "මම මේ සැටියේ දෙමළුන් මරන්නම් මාගේ ආයු ප්‍රමාණයෙන් මරන්නා මුත්, මරා නිමවාගත නො හැක්කේ ය. එ සේ වූ දෙමළුන් මරා කවර දා බුදුසසුන් පවත් කෙරෙම් දැ" යි සිතා නැවත මෙ ස් සිතූ ය. කෙ සේ ද යත්, "රුණ රජ කරන බොහෝ රජදරුවෝ ඇත. ඒ රජදරුවන් අතුරෙන් රත්නත්‍රයෙ හි සැදැහැ ඇති රජ්ජුරු කෙනකුන්ට සේවාකම් කොට ලඞ්කාද්වීපයෙ හි පුරාගෙන හුන් මේ සියලු දෙමළුන් සාධා ඒ රජ්ජුරුවන්ට රාජ්‍යය ගෙන දී උන් ලවා බුදුරජාණන් වහන්සේ ගේ පස්වාදහසක් පවත්නා බුදුසසුන් බබුළුවමි" යි සිතා අනුරාධපුර නුවරින් නික්ම සවස මාගමට අවුත් ගැමුණු කුමාරයන් දැක මෙපවත් කියා ගැමුණු කුමාරයන් සමීපයෙහි ම වසන්නා හ. ගැමුණු කුමාරයෝ ද මෑණියන් හා කථාකොට නන්දිමිත්‍ර යෝධයන්ට බොහෝ සත්කාර කොට සම්පත් දුන්නු ය. ඒ නන්දිමිත්‍ර යෝධයෝ එතැන් පටන් ගැමුණු කුමාරයන් සමීපයෙහි විසූ ය. නන්දිමිත්‍ර යෝධයාණන් ගේ උත්පත්ති කථාව මෙ සේ දත යුතු.

## සුරනිර්මල යෝධයා

නැවත සුරනිර්මල යෝධයාණන් ගේ උත්පත්ති කථාව කෙ සේ ද යත්, කාවන්තිස්ස රජ්ජුරුවෝ දෙමළුන් ගඟින් මෙතරට ආ නො දි වලකනු පිණිස මාවැලිගඟින් මෙතර දිගට ම රැකවල් ලැවූ ය. එ සේ රැකවල් ලබන රජ්ජුරුවෝ තමන් බිසෝවරුන් අතුරෙන් එක් බිසෝ කෙනකුන් ගේ දීඝාභය නම් පුතණු කෙනකුන් කසාතොට ය යි යන තෙන රැකවල් ලැවූ ය. දීඝාභය නම් කුමාරයෝ ද තමන් උන් කසාතොට ට හාත්පසින් සතර ගව්වෙක ගම්වලින් "එ කි එකී මහ කුලයකින් තම තමන් ගේ එකි එකී පුතණු කෙනකුන් මා සමීපයෙ හි සිටිය මැනවැ" යි ගෙන්වූ ය. එ සමයෙ හි කෙළිවාපි ජනපදයෙ හි කඩවිටි නම් ගම බොහෝ සම්පත් ඇති සංඝ නම් කෙළෙඹියක්හුගේ පුත්තු සත් දෙනෙක් වූහ. රාජ කුමාරයෝ සංඝ නම් කෙළෙඹියාණන්ගේ පුතුන් සත් බෑයන් ඇති නියාව අසා, "එක් කෙනකුන් මට සේවාකම් කළ මැනවැ" යි පත් යවූ ය. සත් බෑයන් අතුරෙන් කිස්දොවුන් පුතණුවෝ නිර්මල නම් වූ හ. ඒ කුමාර ඇතුන් දශ දෙනකුට බල ඇත්තේ ය. එ  සේ බල ඇතත් කිසි කර්මාන්තයක් දෙමවුපියන්ට නො කරන්නේ ය. එ සේ හෙයින් අනික් සබෑයෝ නිර්මල නම් මලණුවන්ට "කාලා කිසි කර්මාන්තයක් නො කොට ගෙන් දොරට නො යෙයි. එ සේ වූ සොරු රාජ කුමාරයන් සමීපයට, එවූ පතට, යවුව මැනවැ" යි සබෑයෝ මලණුවන් නො කැමැති ව ම දෙමවුපියන්ට කිවු ය. මවුපිය දෙදෙන කෙනෙක් දරුවන් ඇතත් කිස්දොවුන් දරුවන් කෙරේ සෙනෙහ බොහෝ විසින් නිර්මලයන් යවනු නො කැමැත්තෝ ය. නිර්මල කුමාරයා මල් බෑයන්ට කිපී

උදැසන කඩවිටි නම් ගමින් නික්ම දොළොස් කව්වක් ගෙවා ගෙන හිරු නැගෙන වේලාවට කසාතොටට ගොස් දීඝාභය කුමාරයන් දුටුයේ ය.

කුමාරයෝ නිර්මලයන් දැක උන් ගේ ගමන් පරීක්ෂා කරනු පිණිස දුරු මෙහෙවරක් කියා යවා ගමන් පරීක්ෂා කළ මැනවැයි සිතා, "මිහින්තලා ගල ආසන්නයෙ හි ද්වාරමණ්ඩල නම් ගම මාගේ යහළුණුවන් කුණ්ඩල නම් බමුණාණන් සමීපයට ගොස් මා යවූ පත දීලා, උන් දුන් සඳුන් කපුරු කස්තුරු කළුවැල් තුවරලා මේ ආදී සුවඳ ගෙනෙව" යි කියා නිර්මලයන් බත් කවා බමුණානන් සමීපයට පත දී යවූ ය. ඒ කසාතොට අනුරාධපුර නුවරට සතිස් ගව්ව ය. නිර්මලයෝ ඒ සතිස් ගව්ව ගෙවාගෙන පෙරවරු ම ද්වාරමණ්ඩල නම් ගමට ගොස් බමුණානන් දැක පත දුන් හ. බමුණාණෝ නිර්මලයන් "කවර දා නික්මුණුදැ"යි විචාළෝ ය. එ සේ විචාළ බමුණාණන්ට නිර්මලයෝ "උදැසන ම බත් කා ආමී" යි කිවු ය. එ බස් ඇසූ බමුණාණෝ කියන්නෝ, "ආශ්වර්යය, තිසා වැවට ගොස් නාපියා බත් කන්නට පලා එව" යි කී හ. ඒ බස් ඇසූ නිර්මලයෝ අනුරාධපුර නුවරට ගොස් තිසා වැවින් නා පියා ශ්‍රී මහාබෝධින් වහන්සේට මල් පුදා වැඳ ථූපාරාම මළුවට ගොස් ථූපාරාමය ත් වැඳ ඇතුළු නුවරට වැද-නැඟෙනහිර වාසලින් බස්නාහිර වාසල දකින්නේ සතර ගව්වක් ගිය කල ය, දකුණුදිග වාසලින් උතුරු දිග වාසල දකින්නේ සතර ගව්වක් ගිය කල ය, එ සේ වූ සියලු නුවර නිර්මලයෝ බලා සතර වාසල් දොර ඇවිද පියා සල්පිළින් සුවඳ හැර ගෙන උතුරු වාසල් දොරින් නික්ම මානෙල් කෙතට ගොස් මානෙල් මල් කඩා පැලඳ ගෙන නැවත බමුණන්ගේ ගෙට ම පෙරවරු බත් වේලාවට ම ගියාහු ය. බමුණා "කොයි ගියා ද" යි විචාරා ගිය ගමන් අසා සතුටු ව විස්ම පත් ව මෙ සේ සිති ය. "මේ පුරුෂයා උතුම් පිරිමියෙක. ඉදින් එළාල රජ මොහු ගේ බල දත් නම් තමා සමිපයට හැර ගන්නේ ය. එ සේ හෙයින් දෙමළුන් ආසන්නයේ කල් යවා හිඳීම සුදුසු නො වෙයි. දීඝාභය කුමාරයන් ගේ පියාණන් සමීපයේ වසන්නට සුදුසු ය" යි සිතා කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයෙ හි හිඳිනා නියායෙන් පතක් ලියා නිර්මලයන්ට දින. නැවත පූර්ණවර්ධන නම් පිළී සඟළක් ද ඇතුළු වූ පඩුරු දී බත් කවා තමා ගේ යහළු වූ දිඝාභය කුමාරයන් සමීයට යැවී ය. ඒ නිර්මලයෝ ඒ දවස් සවස් වේලෙ හි ම රාජ කුමාරයන් ඇවිත් දුට හ. නැවත තමා ගෙන ගිය පත හා පඬුරු රාජ කුමාරයන් දින, රාජ කුමාරයෝ නිර්මලයන්ට මසුරන් දහසක් වටනා මාහැඟි ප්‍රසාද දී නිර්මලයන් හිසකේ කපා මාවැලි ගඟින් නාවා බමුණාණන් තමන්ට එවූ පූර්ණ වර්ධන නම් පිළිසහළ ද මල් සුවඳ ද නිර්මලයන්ට දී දුහුලින් නිර්මලයන් හිස වෙළා තමන් කන සැටියේ බත් කවා මසුරන් දහසක් වටිනා මාහැඟි යහනක් ද දුන් හ. ඉක්බිති නිර්මලයෝ තමන්ට දුන් සියලු ප්‍රසාද එක් කොටලා කිසිල්ලේ ගන්වා ගෙන දෙමවුපියන් හිඳිනා ගමට එදා ම ගොස් පිළි සහළ මෑණියන්ට දී මාහැඟි යාන පියාණන්ට දී දෙමෝපිය දෙදෙනා වැඳලා සමුගෙන නැවත ඒ දවස් ම රාත්‍රියෙ හි රැකවල් රකිනා තෙනට අවුත් උන් හ. රාජ කුමාරයෝ නිර්මලයන් දෙමෝපියන්ගේ ගම නො රඳා ඊයේ ම රැකවලට ආ නියාව උදැසන අසා සතුටුව මසුරන් දහසක් දී, "කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයෙහි වසව" යි සමු දුන් හ. නිර්මලයෝ මසුරන් දහසත් දෙමෝපියන්ට දි එ දවස් ම මඟ ගෙවා ගෙන මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන් දුට හ. රජ්ජුරුවෝ ඒ දැක සතුටු ව නිර්මලයන්ට බොහෝ ප්රිසාද දී සුරනිර්මල යෝධයා ය යි මේ නමින් ප්‍රසිද්ධ කොට පුතණුවන් ගැමුණු කුමාරයන්ට ම පාවා දුන් හ. එ තැන් පටන් ශෞර වීර්යය ඇති හෙයින් සුර නිර්මල නම් විය. මේ සුරනිර්මලයන් ගේ උත්පත්ති කථාව යි.

## මහාසොණ යෝධයා

නැවත මල්වතු මඬුල්ලෙ හි උදුර කරවිටි නම් ගම තිස්ස නම් කෙළෙඹි යක්හු ගේ පුත්තු අට දෙනෙක් ඇත. උන් අට දෙනා අතුරෙන් කිස්දොවුන් පුතා සත් ඇවිරිදි වයසේ දි ඉස් වට උස කොර තල් උදුරන්නේ ය. දස

ඇවිරිදි කල මහ තල් ගස් උදුරන්නේ ය. ක්‍රමයෙන් වැඩි සොළොස් ඇවිරිදි කල ඇතුන් දසදෙනකුට බල ඇත්තේ ය. එතෙම මහාසොණ නම් යෝධයා ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහු ගේ බල අසා දෙමෝපියන් දෙදෙනාට බොහෝ සම්පත් යවා, "තමන් ගේ තෙල පුතා තමන් සමීපයේ වසන්ට සුදුසු නො වෙයි. මාගේ පුතනුවන් ගැමුණු කුමාරයන් සමීපයේ වසන්නට සුදුසු ය යි කියා ගෙන්වා ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ මහාසොණ නම් වූ යෝධයාණන් ගේ උත්පත්ති කථාව යි.

## ගොඨයිම්බර යෝධයා

තව ද දොළොස් දහස් ගිරුවා හෝ බඩ නිටුල්විටි නම් ගම මහානාග නම් කෙළෙඹියක්හු ගේ පුතෙක් මිටි හෙයින් ගොඨ ය යි කියනු ලැබෙයි. එ සේ කියන බව මුත් ඇතුන් දස දෙනකුට බල ඇත්තේ ය. ඔහු ගේ වැඩි මහලු සබෑයෝ බාල මලණුවන්ට මිටි හෙයින් ගොඨයා ය යි පරිහාස කියා වෙහෙසා කෙළිනා හු ය. එක් දවසක් මාසට කුඹුරු ඉදි කරන්නා වූ සබෑයෝ උනුන් අතුරෙන් ගැණ ගැණලා ගස් මුල් කපන්නෝ බාල මලණුවන්ටත් භාගයක් තබා තුමු සදෙන ගස් මුල් කපා ගෙට අවුත් මලණුවන්ට සබෑයෝ කියන්නෝ, "ගොඨය, මෙතෙක් දා සේ ම ගෙයි කාලා වැද හුන්නා සේ ඉතිකින් වැද හිඳිම් යි නො සිතව. තොපටත් කුඹුරු කිරියක වපවල් තබාලා ආම් හ" යි කී හ. ගොඨයා ද මල් බෑයන් කී වාසි බස් අසා කුඹුරට ගොස් කුඹුරෙ හි තල් පොල් සා ඉඹුරු වනය තම්පලා පැළ උදුරන්නා සේ උදුරා කඳ වැට බැඳ කුඹුරේ වළ ගොඩ තැන් උදලු ගා සම කොට තනා ගෙට අවුත් තමාට වාසි කී සබෑයන්ට එ පවත් කී ය. සබෑයෝ එ පවත් අසා උනුන් මුහුණ බලා සිනා සී, "ගෙයි කාලා හිඳිනා ගොඨයා හිඳ නො දී මෙහෙයට යවුම් හ. උන් කළ මෙහෙවර බලාපුව මැනවැ" යි කුඹුරට ගොස් ගොඨයන් කළ ආශ්වර්යමත් කර්මාන්ත සබෑයෝ දැක මහත් වූ විස්මයට පැමිණියා හු ය. එතැන් පටන් ගොඨයා ඉඹුරු ඉදුරූ හෙයින් ගොඨයිම්බර යෝධයා ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ගොඨයිම්බරයන් ගේ බල අසා දෙමවුපියන් දෙදෙනාට ප්‍රසාද යවා ගොඨයිම්බරයන් ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ ගොඨයිම්බර යෝධයාණන් ගේ උත්පත්ති කථාව යි.

## ථෙරපුත්තාභය යෝධයා

නැවත කොළපවු පර්වත සමීපයෙ හි කැතිගම රොහණ නම් කෙළෙඹි යක්හු ගේ පුතෙක් උපන. ඌ උපන් තෙන දී ඌට නම් තබන්නෝ ගොඨාභය නම් රජ්ජුරුවන් ගේ නමින් අභා නම් කුමාරයා ය යි නම් තුබූ හ. ඒ කුමාරයා දොළොස් හැවිරිදි වූ කල මහත් ශක්ති ඇත්තේ ය. නැවත සතර පස් දෙනකු විසින් සොලවා ලිය නො හැකි වට ගල් කෙළිපෙඳවට සේ ඔසවා ගෙන සරු නැති ව දමන්නේ ය. සොළොස් හැවිරිදි කල ඔහු ගේ පියාණන් කරවා දෙන ලද අටතිස් අඟුලක් වට ඇති වඩුවෙන් සොළොස් රියනක් දිග ඇති යගදාවක් ගෙන තල් පොල් යගදාවෙන් ගසා හෙළන්නේ ය. එ සේ හෙයින් අභා නම් යෝධයා ය යි ප්‍රසිද්ධ විය. නැවත ඒ අභා නම් කුමාරයන් ගේ පියාණෝ රෝහණ නම් කෙළෙඹි පුත්‍රයා මහාසුමන නම් තෙර කෙනකුන් වහන්සේගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණ කෙළ පවු පර්වතයෙ හි වසන සුමන නම් තෙරුන් වහන්සේ සමීපයෙ හි මහණ වෙමි යි ගිහිගෙයි කළකිරි කාවන්තිස්ස රජ්ජුරුවන්ට කියා යවා අවසර ඉල්වා ගෙන මහණව භාවනා කොට රහත් විය. එ සේ හෙයින් ඒ කුමාරයාව රජ්ජුරුව න්ගේ නමින් අභය නම් හැර පියාණන් මහණව රහත් වූ හෙයින් ථෙරපුත්තාභය නම් යෝධයා ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ථෙරපුත්තාභය නම් යොධයාණන් ගේ පවත් අසා ඔහු ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ ථෙරපුත්තාභය නම් යෝධයාණන් ගේ උත්පත්ති කථාව

යි.

## මහා හරණ යෝධයා

නැවත කප්පඳුරු නම් ගම කුමාර නම් කෙළෙඹියක්හු ගේ හරණ නම් පුතෙක් උපන. ඒ හරණ නම් කුමාරයා දොළොස් ඇවිරිදි කල බලයෙන් ද ජවයෙන් ද යුක්ත ය. බාලයන් හා කැටිව වල ඇවිදිනේ සාවුන් ලුහුබඳවා ගෙන පයින් ගසා මරන්නේ ය. එ සේ ම සොළොස් හැවිරිදි කල ගම් වැස්සන් හා කැටිවවලට ගොස් මුවන් ගෝනන් ඌරන් ලුහුබඳවා කකුල් අල්වා ගෙන බිම ගසා මරන්නේ ය. මෙ සේ බල ඇති හෙයින් මහාහරණ නම් යෝධයා ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. ඉක්බිති කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහු ගේ බල අසා ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ මහා හරණ නම් යෝධයාණන් ගේ උත්පත්ති කථාවයි.

## වෙළුසුමන යෝධයා

නැවත ගිරිනිල් දනව්වෙ හි කෙළෙඹියඟණ නම් ගම වසභ නම් කෙළෙඹියක්හු ගේ පුතෙක් උපන. එ ම දනව්වෙ හි වෙළු නම් ගම වෙළු නම් (කෙළෙඹි පුත්‍රයකු හා සුමන නම් ජනපද නායකයකු හා දෙදෙන ඔහු) හා මිත්‍ර ව හිඳිනා හ. (ඔහු දෙදෙන) තමන් ගේ වසභ නම් යාළණුවන් ගේ පුතණු කෙනකුන් උපන් හ, යි අසා බොහෝ උපකරණ ගෙන්වා ගෙන යාළණුවන්ගේ ගමට අවුත් යාළුණුවන් ගේ පුතණුවන් දැක තමන් ගේ සුමන නම් වෙළු නම් දෙක එක් කොට වෙළුසුමන ය යි නම් තබා (සුමනයන් ගේ) ගමට කුමාරයන් ගෙන ගියෝ ය. ඉක්බිති වෙළුසුමන කුමාර වැඩිවිය පැමිණ මහත් යසසට පැමිණියේ ය. එ සමයෙ හි එක් සෙන්ධවයෙක් කිසි කෙනකුන් තමා පිටට නැංග නො දෙයි. ඒ සෙන්ධවයා වෙළුසුමනයන් දැක "මා පිටට නැඟෙන්නට සුදුසු සේවායෙකැ" යි සතුටුව වෙළුසුමනයන් මුණ බලයි. ඒ දැක කුඩා පියා වෙළුසුමනයන්ට "පුත, වෙළුසුමනයෙනි, තෙපි මේ අසු පිටට නැඟෙව" යි වෙළුසුමනයන්ට අසු දින. එ වේලෙ හි වෙළුසුමනයෝ කුඩා පියාණන් දුන් අසු පිට ට පැන නැඟී අසු විහිදුවා ලූ ය. ඒ වේලෙ හි ඒ සෙන්ධවයා ගේ ජව කෙ සේ ද යත්, අසුන්ගෙන් වටලා ලූ අස් වළල්ලක් මෙන් විය. එ සේ අසු විහිදුවා නැවත අසු දිග හැර දිවන අසු පිට තෙමේ සිට ගෙන ඌ කෙරේ මඳ ශඞ්කාවක් නො කොට තමා හැඳගත් සළු පටින් පට අසු දිවිය දී ම ගලවයි. නැවත පටින් පට ඇඳ ගන්නි. ඒ දැක බොහෝ දෙනා මහත් කොට ඔල්වර හඩ පැවැත්වූ ය. එ වේලෙ හි වෙළුසුමනයන් ගේ කුඩා පියාණෝ පුතණුවන්ගේ බල දැක සතුටු ව ඔ හට මසුරන් දහසක් දී, "මේ මා ගේ කුඩා පිත් මා කෙරෙහි ත් මාගේ යාළුණුවන් කෙරෙහි ත් වසන්නට සුදුසු නො වෙයි" සිතා ඌ කැඳවා ගෙන මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන්ට පාවා දුන් හ. කාවන්තිස්ස රජ්ජුරුවෝ ඕහට බොහෝ සම්පත් දී වෙළුසුමන යන් තමන් සමීපයෙ හි රැඳ වූ හ. මේ වෙළුසුමන යෝධයාණන්ගේ උත්පත්ති කථාවයි.

## ඛඤ්ජදේව යෝධයා

තවද අංජලි පවු සමීපයෙහි මීදෙණිය යන නම් ඇති ගම අභා නම් එක් කෙළෙඹි පුත්‍රයක්හු ගේ පුතෙක් උපන. ඒ උපන් පුතා මඳක් පිළු හෙයින් ඛඤ්ජදේව ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. ඛඤ්ජදේවයා මහත් බල ඇත්තේ ය. ඒ ගම්වැස්සන් හා කැටිව වලට මුව දඩ ගියේ, වල දිවන වල් මීවුන් දැක ඛඤ්ජදෙවයා ඔවුන්

දෙකකුල් අල්වා ගෙන තමා හිස සිසාරා බිම ගසා ඇට තුතු කොට වල් මීවුන් මරයි. කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහු ගේ බල අසා දෙමවුපියන්ට බොහෝ සම්පත් දී උන් ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට ම පාවා දුන් හ. මේ ඛඤ්ජදෙව නම් යෝධයාණන් ගේ උත්පත්ති කථාව යි.

## උන්මාද ඵුස්සදෙව යෝධයා

තව ද, චිත්තල පර්වත සමීපයෙ හි ගොඩිගමුව ය යි යන ගම් උප්පල නම් කෙළෙඹියක්හු ගේ ඵුස්ස (දේව) නම් පුතෙක් බාල කල තමා සේ ම සෙසු බාලයන් හා එක් ව විහාරයට ගොස් බොධීන් වහන්සේට පූජා පිණිස විහාරයෙ හි තුබූ සක තමා අතට හැර ගෙන පිඹපී ය. ඔහු පිඹපූ ඒ සඞ්ඛනාදය සිය ගණන් එක විට ගැසූ සෙණ හඬ මෙන් ශබ්ද පතළේ ය. ඒ ඇසූ බාල දරුවෝ භය පත් ව උන්මත් ව මුහුණින් කඩා ගෙන වැටියෙති. එතැන් පටන් ඒ කුමාරයා උන්මාද ඵුස්සදෙව ය යි නමින් ප්‍රසිද්ධ විය. ඉක්බිති ඵුස්සදෙවයා ගේ පියාණෝ පුතුට දුනු සිල්ප ඉගැන්වූ හ. ඒ කුමාර ශබ්දවෙධී ය. වැලි පිරූ ගැල් ද විද හිය පලවන්නේ ය. සමින් බඳනා ලද සම් ගැල් ද අටඟුල් සොළොසඟුල් බොල පියා පෝරු ද විද හීය පල වන්නේ ය. සතරඟුල් බොලයපට ද අතින් අතට විද පලවයි. ඔහු විසින් හරණ ලද ඊය ගොඩින් අට ඉස්බක් යන්නේ ය. දියෙන් ඉස්බක් පමණ යන්නේ ය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහු ගේ දුනු සිල්ප අසා දෙමෝපියන්ට සම්පත් දී ඔහු ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ උන්මාද ඵුස්සදේව නම් යෝධයාණන් ගේ උත්පත්ති කථාව යි.

## ලභිය වසභ යෝධය

තව ද, තරාල් පවු සමිපයෙ හි වේරවැගම මත්ත නම් කෙළෙඹියක්හු ගේ, නමින් වසභ නම් පුතෙක් උපන. ඒ වසභ නම් පුතා යහපත් ශරීර ඇති හෙයින් ලභිය වසභ ය යි මේ නමින් ප්‍රසිද්ධ විය. ඒ ලභිය වසභයා විසි හැවිරිදි වයසට පැමිණියේ ඇතුන් දස දෙනකුට බල ඇත්තේ ය. මිනිසුන් කීප දෙනකු හැර ගෙන මහ වැවක් බඳවන්නේ විසි තිස් දෙනකු විසින් ඔසවා ගත නො හැකි පස් පිඩි උදැල්ලෙන් දමා වැව බඳවා නිමවිය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ලභිය වසභයන්ගේ බල අසා ඔහු ගේ දෙමවුපියන්ට සම්පත් දී යවා ඌ ගෙන්වා ගෙන පුතණුවන් ගැමුණු කුමාරයන්ට පාවා දුන් හ. මේ ලභිය වසභ නම් යෝධයාණන් ගේ උත්පත්ති කථාව යි.

## යෝධයන් ගේ පින්කම්

මේ යෝධයන් දසදෙනාගෙන් නන්දිමිත්‍ර නම් යෝධයාණෝ මෙ ම කප බුදු වූ කොණාගමන නම් බුදුන් සමයෙ හි බොහෝ සම්පත් ඇති කුල ගෙයක ඉපිද, බොහෝ මිනිසුන් පැහැද සංඝයා වහන්සේට මහදන් දෙන්නා දැක, තුමු ත්, "එක් කෙනෙකුන් වහන්සේ ට දනක් දෙමි" යි සිතා, තුන් මසක දි හැරගෙන සුවඳ කවා තිබූ හැල් සාලින් බත් ඉදි කරවා, එක් රහත් කෙනකුන් වහන්සේට දන් දී ඒ ආත්ම භාවයෙන් චුත ව දිව්‍ය ලෝකයෙ හි ඉපද අනන්ත කාලයක් දිව්‍ය සම්පත් අනුභව කොට නැවත දෙව්ලොවින් චුත ව කාශ්‍යප බුදුරජාණන් වහන්සේ සමයෙ හි මනුෂ්‍ය ලෝකයෙ හි ඉපද සතලිස් දහසක් අවුරුදු සම්පත් අනුභව කොට සංඝයා වහන්සේට කිරිබතින් ලා බතක් දුන් හ. ඒ දුන් දනින් ඒ ආත්මභාවයෙන් චුත ව දෙව්ලොවින් චුත ව මේ අත්බැව් හි මෙ බඳු බල ඇති ව උපන. සුරනිර්මලයෝ කවර පින් කළෝ ද යත්, මෙ තනට

බුද්ධාන්තරයකින් යට බුදු වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ සමයෙ හි අනන්ත සම්පත් ඇති කුලයෙක ඉපද කිරිබත් වැනි කබල් ඇල් කල පොරෝනට පලස් යන බල වඩනට නිසි පින්කම් කොට දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් අනුභව කොට මේ ආත්ම භාවයෙ හි මෙ වැනි බල ඇතිව උපන. සෙසු යෝධයෝ ද තමන් බල වඩනට නිසි පින් කම් කොට මේ ආත්ම භාවයෙ හි මෙ සේ බල සම්පන්න ව උපන්නා හ යි, දත යුතු. කාවන්තිස්ස රජ්ජුරුවෝ ඒ දශ මහා යෝධයන්ට පුතණුවන්ට කරන සත්කාර හා සමග කොට සම්පත් දී පුතණුවන්ට බොහෝ සත්කාර කොට බලවාහන ද, දී දශ මහා යෝධයන් ගැමුණු කුමාරයන්ට ම පාවා දුන් හ. දෙවෙනි පුතණුවන් තිස්ස කුමාරයන් රට රකිනා පිණිස දිගාමුඩුල්ලට යවූ හ. ගැමුණු කුමාරයෝ තමන් ගේ අනන්ත වූ පාබළ සේනාව දැක, "මේ සේනාව හැර ගෙන දෙමළුන් හා සටන් කළ මැනවැ" යි සිතා පියාණන් වහන්සේට, "දෙමළුන් හා සටන් කරනු කැමැත්තෙමි" යි කියා යවූ ය. රජ්ජුරුවෝ, "පුතණුවන් සටනේ නැසී යෙති" යි යන ශෝකයෙන් පුතු රකිනා පිණිස, "ගඟින් මෑත අපට පමණ. සටනින් ශොක නැතැ" යි වැලකූ ය. ගැමුණු කුමාරයෝ ද සටනේ කළ ලෝභයෙන් තුන් වාරයක් පියාණන්ට කියා යවා තුන් වාරයෙ හි ම නො ගිවිස්නා හෙයින් සතරවෙනි වාරයෙ හි දි, "මාගේ පියාණන් වහන්සේ, පිරිමියෙක් වූ නම්, මෙ සේ කියා මා නො වලකන සේක. ගැහැනියක සෙයින් වේ ද, එ සේ කියන්නේ? අදවක් පටන් එකාවැල දහන්හු කටිසූත්‍ර ව රුවන්තෝඩු යන පිරිමි ආභරණ නො පලඳිනේ ය. පාමුදු පාඩගම් රුවන් තනපට පමුතිලිඩගම් පට්ටකාර මේ ආදී ගෑනු පලඳනා ම පලඳින්නේ ය" යි පියාණන්ට කියා යවූ හ. ඒ දැක කාවන්තිස්ස රජ්ජුරුවෝ ගැමුණු කුමාරයන්ට කිපි, "රන් හැකිලි ගස්වා මසා මුත් මාගේ පුතණුවන් රැක ගත නො හැක්කැ" යි කිපුණා හ. එ බස් ඇසූ ගැමුණු කුමාරයෝ පියාණන්ට කිපි නො කියා ම මායා රට කොත්මලේ ගිලිමලයට පලා ගොස් හිඳිනා හ. පියාණන්ට නො කියා කිපී ගෙන දුෂ්ට ව ගිය හෙයින් දුට්ඨගාමිණී ය යි මේ නමින් ප්‍රසිද්ධ විය.

## කාවන්තිස්ස රජු ගේ මරණය

කාවන්තිස්ස රජ්ජුරුවෝ, "දරුවන් දෙදෙනා මා නැති අතරෙක සම්පතෙ හි කළ ලෝභයෙන් හා රටට කළ ලොභයෙන් දබරෙක් වී නම් දශ මහා යෝධයෝ එක් කෙනකුන්ට පක්ෂ වූ නම් එක් කෙනෙක් බල නැතිව මියන්නා හ. දෙන්නා ගේ දබරෙහි දි දශ මහා යෝධයන් එක් කෙන කුන්ටත් සහාය නො වන පිණිස දිවුරවාපුව මැනවැ" යි සිතා දශ මහා යෝධයන් දිවුරවා පී හ. කාවන්තිස්ස රජ්ජුරුවෝ සූසැට විහාරයක් කරවා සූසැට ඔටුන්නක් පැලඳ මළෝ ය. තිස්ස කුමාරයෝ පියාණන් මළ නියාව අසා දිගාමඩුල්ලෙන් අවුත් පියාණන් දවා සොහොන් අස් කරවා පියාණන් මළ පවත් බෑණන්ට කියා නො යවා ම මෑණියන් විහාර දේවීන් ද, කඩොලැතු ද, වස්තුව ද හැර ගෙන බෑණන් කෙරෙහි හයින් ඔටුනු නො පැලඳ ම දිගාමුඩුලු නැඟී ගියේ ය. මාගම හුන් අමාත්‍යවයෝ ඒ බව ගැමුණු කුමාරයන්ට කියා යවූ ය. කුමාර යෝ අසුන් කියවා පියාණන් මළ ශෝකයෙන් හඬා වැලප උදෑසන කොත් මලයෙන් නික්මුණු තැනැත්තෝ පෙරවරු ම ගුත්හලට අවුත් වන් හ.

## දෙබෑයන් ගේ යුද්ධය

ඉක්බිති දිගාමඩුල්ලේ උන් මලණුවන් තිස්ස කුමාරයන් එන්නට පත් යවා තුමූ මාගමටගොස් ඔටුනු පැලඳ මෑණියන් හා කඩොලැතු එවන්නට තුන් වාරයක් පත් යවා තුන් වාරයේ ම යවූ පතට මලණුවන් නා විසින් ගැමුණු කුමාරයෝ, මෙවිට "මම ම යෙමි" යි සේනාව හැර ගෙන සටනට නික්මුණාහු ය. තිස්ස කුමාරයෝ ද, "මාගේ බෑණන් වහන්සේ වේ ද" යි නැකුලු කමෙක් වේ ව යි, නායක රජ්ජුරුවෝ වේදැ යි සැකයක්

නැති ව තුමූ ද සේනාව පිරිවරා ගෙන කඩොලැතු පිට ට පැන නැඟී සටනට සැරහී නික්ම සුළඟුණු පිටියේ දී දෙබෑයන් ගේ මහත් වූ සටන් විය. එ දවස් සටනේ දී, "දශ මහා යෝධයෝ ආදී ම දෙබෑයන් ගේ සටනෙක් වී නම් එක් කෙනකුන්ට නතු නො වම් හ" යි රජ්ජුරුවන්ට ශපථ කළ විසින් දෙබෑයන් ගේ සටන් නො ඉවසා සිටීයෝ ය. එ දවස් දුටුගැමුණු රජ්ජුරුවන් ගේ නොයෙක් දහස් ගණන් සේනාව යටතේ මිය වැගිර ගියා හ. දුටුගැමුණු රජ්ජුරුවෝ මලණුවන්ට සටනේ පැරද තිස්ස නම් අමාත්‍යවයකු හා දිසතුණී නම් වෙළඹක මෙ පමණක් හැර ගෙන බිඳී දිව ගත් හ. තිස්ස කුමාරයෝ ද බිඳී පලා යන බෑණන් පසු පස්සෙහි සේනාව හැර ගෙන, "කොල සේ ව සේ ව දිව්ව" යි කීහ. "සේව කොල, ගනුව, කොටව, වීදුව" යි කියා දිවන සේනාවට සරස රහතන් වහන්සේ ගල් කන්දක් මවා සේනාව වලකාපි සේක. ඒ ගල් කන්ද දැක තිස්ස කුමාරයෝ, "රහතුන් වහන්සේ කොට වදාළ දෙයෙකැ" යි දැන සේනාව හැර ගෙන දිගා මඩුලු නැඟී ගියෝ ය.

## දුටුගැමුණු රජු පලා යෑම

දුටුගැමුණු රජ්ජුරුවෝ ද බිඳී පලා ගොස් සප්පඳුරු නම් හොය දාවල් නාන තොට ට ගොස් ඇමැත්තහු බණවා. "බෑණෙනි, තිස්සයෙනි, සා දුකට වඩා මහත් දුකෙක් නැත. බතෙක් ඇද්ද" යි විචාළ හ. එ බස් ඇසූ තිස්ස නම් අමාත්‍යවයා, "ස්වාමීනි, රන් තැටියෙන් ගෙනා බතෙක් ඇත. මේ නිමවා වදාළ මැනවැ" යි කියා රන් තැටියේ බත් මැත් කොට රජ්ජුරුවන්ට දින. එ වේලෙ හි රජ්ජුරුවෝ බත දැක වේලා ඇති බැව් දැන, "සඟුරුවන්ට දන් දී මුත් මේ බත් නො කම්" යි සිතා, "බෑණෙනි, තිස්සයෙනි, සංඝයා වහන්සේ සිඟා වඩනට කලැ යි අඬගාව" යි සම්මත කොට ඒ බත තමන් අතට හැර ගෙන සඟුරුවන්ට දන් දෙන්නට ද, තමන් ට ද, ඇමැත්තවූ ට ද, වෙළඹට දැ යි සතර කොටසක් කොට බෙදා තුබූ හ. එ වෙලෙ හි හඬ ගෑ හඬ පුවඟු දිවයින කුටිම්බිය තිස්ස නම් තෙර කෙනකුන් වහන්සේ දිව කනින් අසා ඍද්ධියෙන් අවුත් රජ්ජුරුවන් ඉදිරියෙ හි වැඩ සිටි සේක. රජ්ජුරුවෝ "තෙරුන් වහන්සේ සයින් ඉන්ද දී මම මේ බත අනුභව කෙරෙම් ද" යි සිතා තමා ලත් බතුත් පිළිගන්වාපූ සේක. එ වේලෙ හි තිස්ස නම් අමාත්‍යතයා ද, "රජ්ජුරුවන් සයින් ඉන්ද දී මම මේ බත කම් ද" යි තමා ලත් බතුත් දන් දින. එ වේලෙ හි වෙළඹ ද තමා ලත් බත් කොටස ද දන්දෙනු කැමති ව සතුටින් රජ්ජුරුවන් මුහුණ බැලූ ය. ඇගේ අභිප්‍රාය දැන අමාත්‍යයා ඇ ගේ බත් කොටසත් දන් දින. තෙරුන් වහන්සේ ද පාත්‍රය නමාපියා පිළිගෙන ආකාශයට පැන නැඟී පුවඟු දිවයිනට වැඩ ගොතම නම් තෙර කෙනකුන් වහන්සේට දුන් සේක. ඒ ගෝතම නම් තෙරුන් වහන්සේ ඒ බත් පන්සියයක් දෙනා වහන්සේ හා සමග වළඳා නමකට බත් ආලොපයක් බැගින් පාත්‍රය පුරාලා, "මේ බත් පාත්‍රය ආකාශයෙන් ගොස් රජ්ජුරුවන් ඉදිරියෙ හි අත පොවා අල්වා ගත හැකි සැටියේ සිටීව" යි අධිෂ්ඨාන කොට වදාළ සේක. එ වේලෙ හි පාත්‍රය ආකාශයෙන් අවුත් ඉදිරියෙහි සිටියා දැක තිස්ස නම් අමාත්‍යයා පාත්‍රය ගෙන රජ්ජුරුවන් බත් කවා තෙමේ ත් බත් කා වෙළඹ ත් බත් කැවී ය. ඉක්බිති රජ්ජුරුවෝ, "පාත්‍රය සෝධා දිය සිඳ තමන් පෙරවි සන්නාහ සුඹුළුවක් කොට පාත්‍රය ඊ පිට තබා මේ පත්‍රය ගොස් තෙරුන් වහන්සේ අත පිහිටවා" යි සිතූ ය. රජ්ජුරුවන් සිතූ සිත හා සමග පාත්‍රය ආකාශයෙන් ගොස් තෙරුන් වහන්සේ අත පිහිටා ගියේ ය.

## නැවත සටන් කිරීම

නැවත රජ්ජුරුවෝ ඔය අස සැතපි මාගමට අවුත් සේනාව රැස් කොට ගෙන සැට දහසක් සෙනඟ ගෙන නැවත මලණුවන් හා සටන් කළෝ ය. එ දවස් කළ සටනෙහි තිස්ස කුමාරයන්ගේ නොයෙක් දහස් ගණන් සේනාව මළා හ. දුටුගැමුණු රජ්ජුරුවෝ සේනාව සටනෙහි මියන්නා දැක. "ඉදිරියේ මා කරන දෙමළ සටන් ඇත. සේනාව නැති කල සටන් කොට ගැන්ම බැරි වේ දැ" යි සිතා මලණුවන් හා සටන් නො කළ මැනවැ යි සිතා කඩොලැතු පිට හුන් තිස්ස කුමාරයන්ට කියා යවන රජ්ජුරුවෝ, "සටන් කොට සේනාව නො නසා මා සමීපයට නැඟී එව" යි මලණුවන්ට කියා යවූ ය. එ බස් ඇසූ තිස්ස කුමාරයෝ බෑණන්ට කිපී තෝමරය හැර ගෙන ඇතු ඉදිරියට මේ හෙයූහ. එ වේලෙ හි දුටු ගැමුණු රජ්ජුරුවෝ, "තිස්සයා එන ගමන් සැදැහැයෙන් එන ගමන් නො වෙයි" සිතා දීඝතුණී නම් වෙළඹ පිටට පැන නැගි කඩුව තරයේ ගෙන මල් රජු දැමූ තෝමරය වළහා ඇතු පිට හුන් මලු හිස පන්වා වෙළඹ විහිදවූහ. එ වේලෙ හි ඒ වෙළඹ පන්වා අත තුබූ කඩු පිටින් මලණුවන් පිට ලූ සන්නාහය පිටට ගැසූ හ. එ වේලෙ හි කඩොලැත් සිතන්නේ, "මා පිට හුන් තිස්ස කුමාරයා ගේ නො පිරිමිකමින් වේ ද පිරිමි රජු ගැනු වෙළඹ ලවා මා හිස පැන්වූයේ?" ය යි සිතා කිපී පිට හුන් කුමාරයා සලමින් ගෙන ගොස් ගසකට නැංවී ය. කඩොලැතාත් අවුත් ගැමුණු රජ්ජුරුවන් දිට.

## තිස්ස කුමරු විහාරයට ගොස් වැදීම

තිස්ස කුමාරයෝ ද ගසින් බැස දිවගෙන ගොස් විහාරයට අවුත් වන්හ. ඔවුන් දැක ගැමුණු රජ්ජුරුවෝ සේනාව ගෙන, "තිස්සයා නො මරා ගෙනෙව" යි කියා ලුහුබඳවා ගත්හ. එසේ දිවන කුමාරයෝ විහාරයට වැද තෙරුන් වහන්සේගේ ශ්‍රී පාදය වැඳ, "ස්වාමීනි, ගැත්තවූ රැකගත මැනවැ" යි කියා ගෙමැද සිට ගත නො හී බෑණන් කෙරේ ගත් භයින් තෙරුන් වහන්සේ සැතපුණු ඇඳ යට වන්හ. එවේලෙහි තෙරුන් වහන්සේ ඇඳ යට හුන් කුමාරයන් නො පෙනෙන නියායෙන් ඇඳ සිවුරු වසා වදාළ සේක. දුටුගැමුණු රජ්ජුරුවෝ පසු පස්සෙහි ලුහු බඳවා ගෙන අවුත් විහාරය වට කොට සේනාව සිටුවා තුමූ විහාරයට අවුත් තෙරුන් වහන්සේගේ ශ්‍රීවපාදය වැඳ, "තිස්සයා කොයි ද? ස්වාමීනි" යි විචාළෝ ය. එසේ විචාළ රජ්ජුරුවන්ට තෙරුන් වහන්සේ වදාරන සේක්, "දෙවයෙනි, තිස්සයා ඇඳ නැතැ" යි වදාළ සේක. රජ්ජුරුවෝ කියන්නාහු, "තිස්සයා ඇඳ නැති නියාව මමත් දනිම් ම ය. එතෙකුදු වුවත් කුල දෙවතාවන්ට පටහැණි ව විචාරීම අප සේ වූ තුනුරුවන් දස් ගැත්තවුන්ට සුදුසු නො වන්නේ වේදැ" යි සිතා නැවත ඔබගේ ශ්‍රීත පාදය වැඳ අවකාශ ඉල්වා ගෙන එතනින් නික්ම විහාරය වට කොට තරයේ රැක වල් ලවා රජ්ජුරුවෝ තුමූ දොරටුවේ රැකවල් ගත්හ. එවෙලෙහි තෙරුන් වහන්සේ කුමාරයන් ඇඳක ලා සිවුරු කඩින් වසා බාල සතර දෙනකු වහන්සේ ලවා මළ සඟුරුවනක් ගෙන යන පරිද්දෙන් කුමාරයන් විහාරයෙන් පිටත් කළ සේක. එවේලෙහි වහන්සේ වරුන්දැ කරින් ගෙන යන්න දැක දුටුගැමුණු රජ්ජුරුවෝ මෙසේ කීහ: "එම්බල තිස්සය, තා සේ වූ ගැත්තෝ කුලදෙවතා වූ ස්වාමීදරුවන් කරින් යෙද්දැ" යි කියා, "බලාත්කාරයෙන් ස්වාමීදරුවන් අතින් අදුරා ගැන්ම අපි සේ වූ බුදුසසනෙහි පහන් තුනුරුවන් දස් සැදැහැ ඇත්තවුන්ට තරම් නො වෙයි" සිතා, "තිස්සය, ස්වාමිදරුවන් තට කළ උපකාර මතු සිහි කරව" යි කියා සේනාව හැර ගෙන මාගමට යන රජ්ජුරුවෝ, "මෑණියන් වහන්සේ දැන් මාගමට ගෙන ගියෙන් නම් බලාත්කාරයෙන් ගෙන ගියා සේ තිබෙයි. ඒ මතු ඇසුවන්ටත් දුටුවන්ටත් නින්දාය" යි සිතා තුමූ මාගමට ගොස් නැවත ආදර සහිතව මහත් වූ පෙරහරින් දිගාමඬුල්ලේ හුන් මෑණියන් වහන්සේ ගෙන්වා ගත්හ.

## මහා සංඝයා දෙබෑයන් සමගි කරවීම

ඉක්බිති තිස්ස කුමාරයෝ ද ගොතම නම් එක් තෙර කෙනකුන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත් පස්ව සිට මෙ සේ දැන්වූ හ. "ස්වාමිනි, මම මා ගේ බෑණන් වහන්සේට බොහෝ අපරාධ කෙළෙමි. එ සේ හෙයින් මම ගොස් ඔබ වහන්සේ දැක ගත නො හෙමි. නුඹ වහන්සේ මා කැඳවා ගෙන ගොස් මා දක්වාලා ක්ෂමා කරවුව මැනවැ" යි කිවූ ය. එ වේලෙ හි එ බස් ඇසූ ගොතම නම් තෙරුන් වහන්සේ පන්සියයක් පමණ මහා සංඝයා වහන්සේ පිරිවරා තිස්ස කුමාරයන් කැඳවා ගෙන මාගමට ගොස් රජගෙට වැඩ හිඳ කුමාරයන් රඳවා පන්සියයක් දෙනා වහන්සේ පිරිවරා තෙරුන් වහන්සේ රජ්ජුරුවන් සමීපයට වැඩි සේක.

රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ ඇතුළු වූ පන්සියයක් දෙනා වහන්සේ වැඳ වඩා හිඳුවා පය සෝධවා වළඳන්ට කැඳබත් එළවූ හ. තෙරුන් වහන්සේ පාත්‍රව පතින් පාමුව වසා වදාළ සේක. එ වේලෙ හි රජ්ජුරුවන්, "කුමක් පිණිස ද ස්වාමිනි" යි විචාළ කල් හි, "මහ රජ, තිස්ස කුමාරයන් දක්වනු පිණිස ගෙන ආම් හ" යි වදාළ සේක. එ වේලෙ හි රජ්ජුරුවෝ, "ස්වාමිනි, නුඹ වහන්සේ කැඳවා ගෙන ආ තිස්සයා දැන් කොයි දැ" යි විචාළෝ ය. තෙරුන් වහන්සේ වදාරණ සේක්, "තිස්සයා හිණිහිස රඳවලා ආම් හ" යි වදාළ සේක. එ වේලෙ හි එ බස් අසමින් ම විහාරදේවී සෝක ව ගොසින් හිණිහිස සිටී පුතණුවන් දැක හඬා වැලප සිටීයෝ ය. දුටුගැමුණු රජ්ජුරුවෝ ද තෙරුන් වහන්සේට දන්වන්නෝ, "ස්වාමිනි, ගැත්තවූ කරා සත් හැවිරිදි සාමණේර කෙනකුන් වහන්සේ අත එවා නො වදාර මෙතෙක් සංඝයා වහන්සේ හැර ගෙන ස්වාමීන් වඩනට මා ගේ ගැතිකම ස්වාමිදරුවන්ට නැති නියා වේ ද" යි කියා නැවත මෙ සේ කියන රජ්ජුරුවෝ තෙරුන් වහන්සේට මෙ සේ දැන්වූ ය. "ස්වාමිනි, ගැත්තවුට මේ කරන අවවාද ආදිම කොට වදාළා නම් මෙතෙක් දහස් ගණන් සේනාව නො නස්නේ වේ ද? ගැත්තවුන් ගේ වරද නැත. ස්වාමිදරුවන් ගේ වරද ම ය" යි තෙරුන් වහන්සේට රජ්ජුරුවෝ කියා මලණුවන් ගෙන්වා ගෙන මහා සංඝයා වහන්සේ මධ්‍යයේ දෙබෑයෝ වැලඳ ගෙන පියාණන් ගුණ සිහි කොට හඬා වැලප ඉස් සෝධා නහා බත් කා මහා සංඝයා වහන්සේ වැඳ පුදා පසු ගමන් කොට අවකාශ ඉල්වා ගෙන මාළිගාවට නැගී ආ හ.

## දෙමළුන් හා සටනට සැරසීම

දුටුගැමුණු රජ්ජුරුවෝ එතැන් පටන් හැම දෙනා ම ගොයම් කරනු පිණිස සම්මත කොට මලණුවන් තිස්ස කුමාරයන් දිගාමුඩුලු යවා බොහෝ ගොයම් කරවන්ට සම්මත කොට රට රක්නා පිණිස සමු දී රජ්ජුරුවෝ තුමූ ද මාගම බොහෝ ගොයම් කරවූ හ. ඉක්බිති රජ්ජුරුවෝ සේනාවට රත්රන් පටකඩ පිළිකඩ ප්‍රසාද දී සේනාව සිත් ගෙන තමන් ගේ ජයකොන්තයට ධාතුන් වහන්සේ වඩා තුමූ ශක්‍රදෙවෙන්ද්‍රලීලායෙන් සැරහී සේනාව පිරිවරා තිස්ස නම් ආරාමයට ගොස් සංඝයා වහන්සෙ වැඳ මෙ සේ දැන්වූ ය. "ස්වාමිනි, බුදුසසුන් ඇති කරනු පිණිස මාවැලි ගඟින් එතර යෙමි. වැඳ පුදා ගන්නා පිණිස මා හා කැටි ව වඩනා භික්ෂූන් වහන්සේ දුන මැනවැ" යි කිවූ ය. එ බස් ඇසූ සංඝයා වහන්සේ ද පන්සියයක් දෙනා වහන්සේ දුන් සේක. දුටුගැමුණු රජ්ජුරුවෝ භික්ෂු සංඝයා වහන්සේ හැර ගෙන කඩොලැතු පිටට පැන නැඟී මෑණියන් විහාරමහාදේවීන් ද කැඳවා ගෙන නන්දිමිත්‍රයන් ආදී වූ දශ මහා යෝධයන් පිරිවර මහත් වූ බලකායෙන් යුක්ත වූ රජ්ජුරුවෝ මහත් වූ යස සිරින් මහත් වූ පෙරහරින් මාගමින් නික්ම කළුවළ අවුත් ලැගුම් ගත් හ. එයින් නික්මුණු රජ්ජුරුවෝ ඒහල ලැගුම් ගත් හ. ඒහල සැතපි සංඝයා වහන්සේ වැඳ පුදා දන් දී සේනාව හා සමඟ මහ පෙරහරින් අවුත් ගිකිත්තේ ලැගුම් ගත් හ. එයින් නික්මුණු රජ්ජුරුවෝ ගුත්හල අවුත් ලැගුම් ගත් හ. එයින් නික්මුණු රජ්ජුරුවෝ කිරිගම ලැගුම් ගත් හ. කිරිගමින් නික්මුණු රජ්ජුරුවෝ නියමුල්ලේ

ලැගුම් ගත් හ . එතනින් නික්මුණු රජ්ජුරුවෝ මැදගම උයන්තොට ලැගුම් ගත් හ. මැදගම උයන්තොටින් නික්මුණු රජ්ජුරුවෝ ගොසින් තුන්ගම කසටපිටියේ ලැගුම් ගත් හ. එතනදි සන්නාහ සන්නද්ධව අන්නට කොටන්නට විදින්නට සැරහි මුළු බැදිසිටි සේනාව කොපමණ ද යත්, සේනාව සිටි නැගෙනහිරි කෙළවර පටන් බස්නාහිරි කෙළවරට සතර ගව්වෙක පිරිස උරයෙන් උරය ගැසී සිටීයෝ ය. එ වේලෙ හි රජ්ජුරුවෝ සේනාව පෙළ බලා, "දෙමළ මහ සෙනඟ වූ නියාවට මේ සෙනග යම්තම් දෙනෙක. එකාන්තයෙන් බුදුසස්නෙ හි තර සැදැයෙක් මට ඇත්නම්, දෙමළුන් සාධා නටබුන් වෙහෙර සසුන් කරවමි යන මනදොළ මට හැම වේලෙ හි ම ඇත්නම් දෙවියෝත් මට වහල් වන්නෝ වේ දැ" යි සිතා එදවස් රෑ සැතපි උදැසන ධාතුන් වහන්සේ වැඳ පුදා පන්සියයක් රහතුන් වහන්සේට දන් දී රජ්ජුරුවෝ තුමූත් කා බී සැරහි දශ මහා යෝධයන් ඇතුළු වූ සේනාව කා බී පටකඩ පට්ටෝලි බැඳ සැරහී සිටි සේනාවට ප්‍රසාද දී ගැට බෙර පණා බෙර එකැස් බෙර මිහිඟු බෙර මද්දල පටහ ලොහො බෙර යුවළ බෙර මහ බෙර දැදුරු බෙර රෝද බෙර මිහිඟු බෙර කරඬි බෙර ඝෝෂා බෙර තලප්පර වීරන්දම් තම්මැට නිසාන රණරඬග ඝොෂා සමුද්‍ර ඝොෂා අනුක්කත්තුලි තිඹුලිවූ දවුල් මොරහු මල්ලරි සිරිවිලි තප්පු තත්සර ඩැක්කි උඩැක්කි මඬල නාගසර උච්චාංභයාඩිගි කොම්බු දළහම් සකුණවිරිදු සුරණ කාල දම් දාරා දළහම් ලෝහම් සින්නම් කින්නර කයිතාලම් සමුත්තාලම් ගිතාලම් පටහ ඩමරු මඩු ඩෙණ්ඩිම ධවනි මේ ආදි සිය ගණන් දහස් ගණන් හෙරි ජාතීන් ගස්වමින්, රන්සක් රිදිසක් රන් සින්නම් රිදි සින්නම් රන් දාරා රිදි දාරා දළ දාරා දළහං ලෝහං ගවරහං විජයොධවනි ඔත්තු තන්තිරි පටසිරි මෙකී කාහල ජාතීන් යුගන්ධර පර්වත සමීපයෙ හි සාගර නාදයක් මෙන් මහත් කොලා හලයෙන් කෙළිමින් අසුර පුරයට නික්මුණු ශක්‍ර්දේවෙන්ද්‍රියා පිරුවැරූ දෙවතා සමූහයක් මෙන් දුටුගැමුණු රජ්ජුරුවෝ මහ සෙනඟ පිරිවරා තුන්ගම කසට පිටියෙන් නික්ම මියුගුණු ගොස් මියුඟුණෙහි ඡත්‍රත නම් දෙමළා හා සටන් කොට ඌ මරා ගහ ලා මියුඟුණේ කසු දාගබක් කරවූ හ.

## මියුඟුණු දාගැබ් කථාව

ඒ මියුඟුණු දාගබ් වහන්සේ බැඳවූ නියාව කියනු පිණිස මේ කියන පිළිවෙළ කථාව යි. හේ කෙ සේ ද යත්, අප ගේ බුදුරජාණන් වහන්සේ බුදු වූ නවවෙනි මස දුරුතු මැදි පොහෝ දවස් මේ ලඞ්කාවට වැඩ මාවැලිගං බිත්තියෙ හි දොළොස්ගව්වක් දිග ඇති සතර ගව්වක් පළල ඇති මහානාග නම් උද්‍යානයෙ හි යක්ෂයන් ගේ සන්නිපාත ස්ථානයට අවුත් ඒ යක්ෂයන් ගේ හිස් මත්තෙහි මියුඟුණු දාගබ පිහිටුවන තැන ආකාශයෙ හි සර්වඥයන් වහන්සේ වැඩ සිට වැසි හා සුළං හා ඝනාන්ධකාරයක් මවා යක්ෂයන්ට භය උපදවා ඒ යක්ෂයන් විසින්, "අපට අභය දුන මැනවැ යි, ස්වාමිනි" දැන්වූ කල් හි, "මම වනාහි තොපට අභය දෙමි. තොපි හැම දෙන ම සමග මා හිඳිනා තැනක් දෙව" යි වදාළ සේක. ඒ යක්ෂයෝ, "ස්වාමිනි, මේ සියලු ලංකාද්වීපය නුඹ වහන්සේට අපි හැම දෙන ම එක් ව දෙම් හ. නුඹ වහන්සේ අපට අභය දුන මැනවැ" යි කිවූ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ උන්ට වූ භය දුරු කොට උන් හැම දෙනා විසින් දුන් බිම සම්කඩ අතුට ඒ සමකඩ වැඩ උන් බුදු රජාණන් වහන්සේ තේජෝකසිණ සමාපත්තියට සමවැද, "සම්කඩ හාත්පසින් ගිනිදැල් නික්මෙව" යි අධිෂ්ඨාන කොට වදාළ සේක. එ වේලෙ හි ඒ යක්ෂයෝ ගිනිදැල් දක්නාහු මරණ භයින් භය පත් ව සියලු යක්ෂයෝ මුහුදු වෙරළ රැස් වූ හ.

ඉක්බිති අසමසම වූ අප්‍රතිපුද්ගල වූ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධි බලයෙන් යක් ගිරිදිවයින නම් දිවයිනක් (මවා ඒ දිවයින) ගෙන්වා යක්ෂයන් ඊට නංවා ඒ දිවයින පෙර තිබූ තැන් හි ම

තබා සමකඩ අකුළුවා වදාළ සේක. එවේලෙ හි දේවතා සමාගමය විය. ඒ දෙවතා සමාගමයෙ හි බුදුරජාණන් වහන්සේ බණ වදාළ සේක. එ වේලෙ හි නොයෙක් කෙළ ගණන් දේවතාවෝ බණ අසා ශරණ ශීලයෙ හි පිහිටියාහු ය. අසංඛ්‍යයක් දෙවියෝ සෝවාන් වූ ය. සමන්තකූට පර්වතයෙ හි මහාසුමන නම් දේවේන්ද්‍රයෝ සෝවාන් ඵලයට පැමිණ සර්වඥයන් වහන්සේ ගේ ශ්‍රී පාදය වැඳ තමා වැඳ පුදා ගන්නට බුදුන්ගෙන් පූජා වස්තුවක් ඉල්වූ ය. එ වේලෙ හි සියලු සත්වයන්ට හිත වූ සර්වඥයන් වහන්සේ දක්ෂිණ ශ්‍රී හස්තයෙන් සිරස පිරිමැද මිටක් පමණ කේශධාතුන් වහන්සේ ඒ සුමන නම් දෙව්රජ්ජුරුවන්ට දුන් සේක. ඒ සුමන නම් දෙවේන්ද්‍ර ඒ කෙශධාතුන් වහන්සේ උතුම් රන් සුමුඟකින් පිළිගෙන සර්වඥයන් වහන්සේ වැඩහුන් තැන පිහිටුවා උසින් සත් රියනක් උස ඇති නොයෙක් සත් රුවනින් ඒ කේශධාතුන් වහන්සේට පූජා කොට ඉන්ද්‍රසනීල මාණික්‍යමය දාගබක් කෙළේ ය. නැවත බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල ධම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ අතවැසි සරභූ නම් එක් තෙර කෙනකුන් වහන්සේ දරසෑයෙ හි ගිනි නො නිවෙන තෙක් ම ග්‍රීවා ධාතුන් වහන්සේ ගෙන මහා සංඝයා වහන්සේ විසින් පිරිවරන ලදුව අවුත් ඒ මියුඟුණ දාගැබ ධාතුන් වහන්සේ නිධාන කොට ඒ වසා මෙවන් පාණින් දොළොස් රියනක් උස කසු වන් දාගබක් කොට වදාළ සේක. ඉක්බිති දෙවෙනි පෑතිස්ස රජ්ජුරුවන්ගේ මලණුවෝ චූලාභය නම් රජ්ජුරුවෝ ආශ්වර්යමත් ඒ දාගබ දැක උසින් තිස් රියනක් කොට දාගබ බැන්දේ ය. දැන් මේ දුටුගැමුණු රජ්ජුරුවෝ මියුඟුණ අවුත් එ හි උන් දෙමළුන් මරා (ඒ දාගබ වසා) අසූ රියනක් කොට දාගබක් බැන්දෝ ය. මෙ සේ ඉක්මන් ඉක්මන් ව සටන් කරන්නෝ ද පවා ගුණයට ආකර වූ, සංසාර භයින් භයපත් වූවාහු, පින්කම් කොට දිව්‍යජලොක සම්පත් අත්පත් කොට ගත්තෝ ය. එ සේ හෙයින් සියලු සත්වයෙනි, හැම වේලෙ හි ම නොපමා ව කුසල් කළ යුතු මියුගුණු දාගබ් කථාව නිමි.

## දෙමළ කඳවුරුවලට පහර දීම

ඉක්බිති ගැමුණු රජ මියුගුණෙන් නික්ම අඹටුවට ගොස් අඹටු දෙමළා හා සටන් කොට සාර මසකින් අඹටු දෙමළා සාධා ඒ නුවරින් නික්ම මහා සේනාව පිරිවරා මහත් බල ඇති සත්බෑකොට්ටය වටලා ගෙන සත්බෑ දෙමළුන් ඇතුළු වූ බොහෝ දෙමළ සේනාව එක දවස් ම සාධා දුටුගැමුණු රජ සේනාවට රන් ප්‍රසාද දී සේනාව සිත් ගෙන එයින් නික්ම අතුරොබට ගොස් මහාතුණ්ඩ නම් දෙමළා හා සටන් කොට ඒ දෙමළා මරා දෙණගම ගොස් ගවර නම් දෙමළා සාධා එයින් නික්ම කඩොලැතු පිටට පැන නැඟී මහා බල සේනාව පිරිවරා කෙළිමින් සෙමින් හාලකෝල නම් නුවරට ගොස් ඒ නුවර වසන මහාතිස්ස නම් දෙමළා හා සටන් කොට ඒ දෙමළා සාධා එයින් නික්ම පොල්වත්තේ නාළික නම් දෙමළා සාධා දීඝාභයගල්ලට ගොස් දීඝාභය නම් දෙමළා සාධා එයින් නික්ම කසාතොට ය යි. යන තෙන වසන කිංවිසීහ නම් දෙමළා හා සටන් කොට ඒ දෙමළා සාර මසකින් සාධා එයින් නික්ම වෙය නම් නුවර වෙය නම් දෙමළා සාධා භාණක නම් ගම භාණක නම් දෙමළා ද වෙය්‍යක නම් ගම වෙය්‍යක නම් දෙමළා ද ගාමිණී නම් ගම ගාමිණී නම් දෙමළා ද කුම්භ නම් ගම කුම්භ නම් දෙමළා ද නන්දික නම් ගම නන්දික නම් දෙමළා ද බානුක නම් ගම බානුක නම් දෙමළා ද තඹුන්න නම් ගම තඹුන්න නම් දෙමයිල් දෙමළුන් දෙන්නා හා සටන් කොට බොහෝ දෙමළුන් ද මරා එයින් නික්ම දඹුන්නරුවේ දෙමලා හා සටන් කරන වේලෙහි, "සිය සේනාව ය සතුරු සේනාව ය" යි වෙනසක් නැති ව එක සැරහුම් හෙයින් ඒ දවස් දුටුගැමුණු රජ "තමා ගේ සේනාව ඔවුනොවුන් තෝරා ගත නො හී මරති" යනු අසා ඒ සටන් බිමදී රජ මෙ සේ වූ සත්‍යක්‍රියාවක් කෙළේ ය. ඒ කෙ සේ ද යත්,

## සත්‍යක්‍රියාව

"මම කිසි කලෙකත් මට රාජ්‍යය සුවයක් පිණිස සටන් කරන්නෙම් නො වෙමි. සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ ගේ පස්වා දහසක් පවත්නා ශාසනය පිහිටුවන පිණිස ය, යි යන මනදොළෙක් හැම වේලෙ හි ම ඇත් නම් ඒ සත්‍යක්‍රියායෙන් මේ මාගේ සේනාව හන් පිළි ද පලන් ආභරණ ද ගත් එලකායුධ ද යන මේ සියල්ල ගිනි ගෙන දිලිසේව යි, දෙමළුන්ට ඒ සැටි නො වේ ව" යි සත්‍යක්‍රියා කෙළේ ය. එ කල් හි ඒ රජුගේ සත්‍යක්‍රියාව ඒ පරිද්දෙන් ම විය. ඒ සැටියේ ඒ නුවර සාධා සේනාවට රන් ප්‍රසාද දී දුටු ගැමුණු රජ්ජුරුවෝ දසමහා යෝධයන් ඇතුළු වූ මහ සෙනඟ පිරිවරා ගංගා තීරයෙ හි පටන් දෙමළ කඳවුරු තාක් පැහැර විජිතපුරයට නික්මුණා හ.

## විජිතපුර සටන

ඉක්බිති බුන් බුන් නුවර ගැලවුණු දෙමළු අවුත් මහ බල ඇති විජිතපුරයෙහි රැස්වූ හ. එ සමයෙ හි දුටුගැමුණු රජ්ජුරුවෝ විජිත පුරය සමීපයෙ හි කඳවුරු බැඳ ඒ පුරය ගන්නා කැමති ව දස මහා යෝධයන් ගේ බල විමසනු පිණිස දක්නට එන නන්දිමිත්‍ර නම් යෝධයා ඉදිරියට, තමන් ගේ කඩොලැතු රා පොවා කිපෙන්නට සුදුසු බස් බැණ නියපිට ගල් ගසා වඩබා මුඛයෙන් පිටත් ව ගිය අවීචියෙ හි ගිනි කඳක් සේ රළු වූ ඒ කඩොලැත් මහ පොළොව යදඬෙන් ගසා ලූ ලෝතලියක් සේ අනුරාව කෙරෙමින්, ගිගුරු හඬින් තතනවමින්, කෝපයෙන් පය ඇද ලූ කෙණෙහි මකුළු හුයක් කඩන්නා සේ බැඳ ලූ යදම් සුනු විසිනු කෙරෙමින් නෙලුම්බු දැලියක් උපුටා ගන්නා සේ බැඳ ලූ කඹය පෙරළී සිට ඇන තුතු කෙරෙමින් සිටි ඇත්හල පැහැර ධූලි කෙරෙමින්, බිඳපු කඹය හකුළුවා දළ අස්සේ තබා ගෙන තමා ගේ සේයට ඇන ලූ ඇන්මෙන් ම පොළොව දැදුරු කෙරෙමින්, දිව ලුහු බඳවා පළාපු මිනී දළග අවුණුවා නගමින්, ලෙහෙයෙන් රැඳී ගිය මුහුණින් ලෙහෙයෙන් රැඳී ගිය දළින් ගෙරින් මීවුන් ලුහුබඳවා ඇන පළමින්, ඔවුන් අතුණුබහනින් බැලු බැලූවන් කොපයෙන් ඇස් පියවමින්, සොඬ කට ලා හිස සල සලා ගුගුරමින් මෙලෙසින් කඩොලැත් අවුත් වීථියට වන. එ වේලෙ හි නන්දිමිත්‍ර නම් යෝධයා ඇතු කෙරෙහි කළ හයින් සේනාවා ඒ ඒ අත දිවන්නවුන් දැක මෙසේ සිතී ය. "මේ කඩොලැත් ඡද්දන්ත කුලයෙ හි උපන්හෙයින් ඇත් බලයෙන් සියක් කෙළක් ඇතුන්ට බල ධරන්නේ ය. එ සේ වූ ඇතු දැක හිසකේ පිට හෙළා දිවීම මා සේ වූ යෝධයන්ට තරම් නො වෙයි. අද ඇත් රජ, තට කියටි දනිමි" යි වමත හකුළුවා ගෙන දකුණතින් අත් පොළා මහත් කොට බැණ නැඟී, දිව ගෙන ආ ඇතු සොඬ හයා කරපිට තබා දැතින් දෙදළ තරයේ ගෙන උක්කුටුකයෙන් හිඳුවාපී ය. ඒ වේලෙ හි දුටුගැමුණු රජ්ජුරුවෝ මහත් සන්තෝෂයට පැමිණියා හ. මහා සේනාව ද "නන්දිමිත්‍රයන් ගේ පුරුෂ බලපරාක්‍රම ඉතා ආශ්චර්ය නියා ය යි සන්තෝෂ වෙමින් මහත් කොලාහල පැවැත්වූ හ. දුටුගැමුණු රජ්ජුරුවෝ නන්දිමිත්‍රයන් ගේ බල විමසා විජිතපුර නුවර දෙමළ සටන් සැක නැතැ යි සේනාව සන්නාහ සන්නද්ධ කොට පිරිස මෙහෙයූ හ. ඉක්බිති දකුණු වාසල යෝධයන් හා දෙමළුන් හා සටන් විය. නැඟෙන හිරි වාසල වෙළුසුමන නම් යෝධයෝ අසු පිටට පැන නැඟි බොහෝ දෙමළුන් මැරී ය. එ වේලෙ හි දෙමළු වේළුසුමනයන් කෙරෙහි හයින් ආයුධ හෙළා ඇතුළු නුවරට වැද වාසල් හෙළා ඉදි හැර අට්ටාලවලට පැන නැඟි උන් හ. ඉක්බිති ගැමුණු රජ යෝධයන්ට සම්මත කරන්නේ කඩොලැතු ද නන්දිමිත්‍රයන් ද සුරනිර්මලයන් ද යන මේ තුන් දෙනා දකුණු වාසල සටනට යවී ය. මහාසෝණ නම් යෝධයා ද ගොඨයිම්බර නම් යෝධයා ද ථෙරපුත්තාභය නම් යෝධයා ද යන මේ තුන් දෙනා ඉතිරි වාසල්වල සටනට නියම කෙළේ ය. ඒ විජිතපුරය කෙ සේ ද යත්, අගළ තුනකින් යුක්ත ය. දැඩි වූ, උසින් අටළොස් රියන් ලෝ පවුරෙන් හා පළල් වාසලින් හා යදොරින් ද යුක්ත ය. එ වේලෙ හි කඩොලැත් දිව ගෙන ගොස් පෙරවා අත දණ බිම ඔබා සිට පවුරේ උළු බිඳ යදොර බිඳින්ට ගියේ ය. එ වේලෙ හි උඩ සිටි

දෙමළු අනෙකප්‍රකාර ආයුධ ඇතුට ගැසූ ය. එ සේ ද නො වැලක ඇතු දොර බිඳිනාවුට රත් කොට යවට දැමූ ය. නැවත කකියවාපු මලකඩ ඇතුපිට නැමූ ය. එ වෙලෙ හි කඩොලැත් වේදනායෙන් පිඩිත වූයේ මහ හඬින් හඬා දිය අගලට ගොස් ගැලිණ. එ වේලෙ හි එ සේ දියෙ හි ගැලුණු ඇතු දැක ගොඨයිම්බර නම් යෝධයා ඇතු ඇලයට ගොස්, "මෙතෙක් දා තා බොන රා සේ නො වෙයි. මේ දෙමළ වාසල බිඳීම නම් බැරි දෙයකැ යි නො සිට තවත් ගොස් යදොර බිඳුව" යි කී ය. එ බස් ඇසූ ඇත් හටගත් අභිමාන ඇතිව කුඤ්චනාද කොට දියෙන් ගොඩ නැඟි සිටියේ ය. ඉක්බිති ඇත් වෙදහු ඇතු පිට ඇලුණු මලකඩ සෝධා බෙහෙත් ගැල්වූ ය.

## කඩොලැතු යදොර බිඳීම

ගැමුණු රජ්පුරුවෝ ඇතු පිටට පැන නැඟි අතින් කුඹ පිරිමැද, "මා උපන් දවස් මාගේ පිනින් උපන් ඇත් රජ, මේ සියලු ලක්දිව රජය තොපට දෙමි" යි මෙ සේ මියුරු තෙපුල් කියා ඇතු සතුටු කොට තමන් මේ නිමවන්ට තුබූ උතුම් රාජ භොජනයෙන් ඇතු කවා පිට වණය සළුවෙන් වසා ඊ පිට මිසට සියක් පට අතුට මත්තෙහි තෙලිසම් බැඳ දොර බිඳිනට අළ හ. ඒ වෙලෙ හි ඒ ඇත් රජ සෙණ හඬ මෙන් ගර්ජනා කොට ඇතුළු නුවර දෙමළුන් භය ගන්වමින් දිව ගෙන ගොස් දළින් යදොර ඇන බිඳපි ය. එ වේලෙ හි එළිපත පයින් ඇන දොර හා දොරබාව හා සමග ඇතුපිට උගුලක් සේ ඇතු යට කොට ගෙන හෙන්නා දුටු මහ බලැති නන්දිමිත්‍ර නම් යෝධයා මාගේ රජ්පුරුවන් ගේ රාජ වාහන ඇතු නටහොත් අලාභ ය යි සිතා තමා ගේ උරයෙන් පැහැර ඉස්බක් පමණ තැන් දමාපී ය. කඩොලැත් තමා ගේ දෙදළ ගෙන බිම කෙළින් හිඳුවාපු වෛරය එ දවස් හැරපි ය. එ වේලෙ හි කඩොලැත් තමා පිටට නැහෙනු පිණිස නන්දිමිත්‍රයන් මුහුණ බැලී ය. එ විට නන්දිමිත්‍ර යෝධයා තා තිරිසනා කළ මගින් මම කුමට වදිම් දැ යි කියා උසින් අටළොස් රියන් ලෝ පවුර උර බාහුවෙන් පැහැර අට ඉස්බක් පමණ තැන් පවුර කඩා හෙළා සුරනිර්මල නම් යෝධයන් මුහුණ බැලී ය. එ සඳ සුරනිර්මල නම් යෝධයාණෝ ද එක්පොළකින් බිඳපූ හ. ථෙරපුත්තාභය නම් යෝධයාණෝ ද, වේළුසුමන නම් යෝධයාණෝ ද, භරණ නම් යෝධයාණෝ ද, ඛඤ්ජදෙව නම් යෝධයාණෝ ද, ඵුස්සදෙව නම් යෝධයාණෝ ද, (මහාසොණ නම් යෝධයාණෝ ද, ගොඨයිම්බර නම් යෝධයාණෝ ද,) ලභිග වසභ නම් යෝධයාණෝ ද, යන මෙ කී දස මහා යෝධයෝ එකකු වන් කඩින් එකෙක් නො වැද වෙන වෙන ම අට ඉස්බක් අට ඉස්බක් පමණ තැන් එකී එකී දෙනා බිඳ වන් හ. එ වේලෙ හි කඩොලැත් ගැල් සකක් ගෙන දෙමළුන් මැරී ය. නන්දිමිත්‍ර ගැලැත්තක් අත ලා ගෙන දෙමළුන් තැළී ය. ගොඨයිම්බර නම් යෝධයා පොල් ගසක් කඩා ගෙන තැළී ය. සුරනිර්මල නම් යෝධයා උතුම් කඩුවක් ගෙන කෙටී ය. මහාසොණ නම් යෝධයා තල් ගසක් උදුරා ගෙන තැළී ය. ථෙරපුත්තාභය නම් යෝධයාණෝ යගදාවක් ගෙන තැළූ හ. එ සේ හෙයින් කියන ලදි.

"හත්ථී ගහෙත්වා රථචක්කං මිත්තො සකට පඤ්ජරං නාළිකෙරතරු ගොයො නිම්මලො ඛග්ගමුත්තමං, තාලරුක්ඛං මහාෙසාණො ථෙරපුතෙතා මහාගදං විසුං විසුං විථිගතා දමිළෙ තත්ථ චුණ්ණයුං"

## අනුරාධපුරයෙ හි සටනට නික්මීම

මෙ සේ විජිතපුරය සාර මසකින් සාධා එ හි උන් බොහෝ දෙමළුන් මරා එයින් නික්ම ගිරිනිල් නුවර ගනුම් හ යි සැරසී ගිරිනිල් නුවරට ගොස් වැද ගිරිනිල් දෙමළා මරා, එයින් නික්ම මානෙල් නුවරට ගොස් මානෙල් දෙමළා හා සටන් කොට සාර මසකින් ඒ දෙමළා සාධා, එයින් නික්ම දුටු ගැමුණු රජ්ජුරුවෝ සේනාවට රන් ප්‍රසාද දී පන්සියයක් රහතුන් වහන්සේ වැඳ පුදා මහා සේනාව පිරිවරා කඩොලැතු පිටට පැන නැඟී එලිල්ලන්කඩ පැන අනුරාධපුර නුවරට සටනට නික්මෙන රජ්ජුරුවෝ මග කෙළිමින් සෙමින් ගොස් කසාගල් පාබඩ කඳවුරු බැඳ එ තැන් හි වැවක් බඳවා සේනාව හා සමග මහත් වූ පෙරහරින් පොසොන් මස දිය කෙළියට පටන් ගත් හ. එ සමයෙ හි එළාල රජ දුටුගැමුණු රජ්ජුරුවන් ආ බව අසා තමාගේ අමාත්‍යයන් හා කථා කරන්නේ, "කිමෙක් ද අමාත්‍යයෙනි, තොප වැනි මන්ත්‍රීවරුන් ඇත්තේ මෙ සේ වූ තෙනට වේ ද? දුටුගැමුණු රජ මියුඟුණේ පටන් සියලු දෙමළ කඳවුරු තාක් පැහැර දැන් අප උන් නුවර ගනුම් හ යි සැරහී කසාගලු නම් තෙන කඳවුරු බැඳ ගෙන හිඳින්නේ ය. ඒ රජු හා සමග කෙ සේ සටන් කරමෝ දැ" යි අමාත්‍යයන් විචාළේ ය. එ බස් ඇසූ අමාත්‍යයෝ කියන්නාහු, "මෙ ලොව නුවණින් පරීක්ෂා කොට කළ මනා සියලු කටයුත්තෙක් ඇත් නම් එ හි කෙළ පැමිණ සිටි අප වැනි අමාත්‍යයන් විසින් පිරිවරන ලද නුඹ වහන්සේ විසින් කිසි සැකයක් නො කොට සෙට දවස් සටන් කොට වදාළ මැනවැ" යි නියත කළ හ. එ බස් ඇසූ එළාල රජ්ජුරුවෝ දීඝජත්තු නම් යෝධයා ඇතුළු වූ විසි මහා යෝධයන් ප්‍රධාන කොට ඇති මහත් වූ දෙමළ සේනාවට රන් රුවන් ප්‍රසාද දීමෙන් සෙනඟ සිත් ගෙන දුටුගැමුණු රජ්ජුරුවන්ට කියා යවන්නෝ, "සටනට ඇවිත් ඔතන ඉඳ කරනු කිම් ද? වහා සටනට අව මැනවැ" යි පත් යවු හ. එ බස් ඇසූ දුටුගැමුණු රජ්ජුරුවෝ, "කියා එවූව මනා ද? අපි එමින් සිටියම් හ. සෙට දවස සටනට සැරහී සිටිය මැනවැ" යි පත් යවා, නන්දිමිත්‍ර නම් යෝධයාණන් ආදී වූ තමන් ගේ දශ මහා යෝධයන් ළඟට කැඳවා කියන්නාහු, "මෙතෙක් දවස් කළ සටන් සේ නො වෙයි. දෙමළ දෙතිස් කඳවුරට නායක වූ විසි මහා යෝධයන් විසින් පිරිවරන ලද මාර සේනාව වැනි මහත් සේනාවෙන් යුක්ත වූ එළාල රජ්ජුරුවන් හා සෙට දවස් සටන් කෙ සේ කරමෝ දැ" යි විචාළ හ. එබස් ඇසූ දශ මහා යෝධයෝ කියන්නාහු, "දේවයන් වහන්ස, එක එළාල රජු ගේ සේනාව තබා මුළු දඹදිව සියලු සේනාව ඇවිදිනුත් අප දසදෙනා ජයගත නො හෙති. සැක නො සිතා වදාළ මැනවැ" යි කී හ. එබස් අසා දුටුගැමුණු රජ්ජුරුවෝ සතුටු ව සේනාවට ප්‍රසාද දී සන්නාහ සන්නද්ධ ව සටනට නික්මුණා හ.

## දීඝජත්තු යෝධයා

එළාල රජ දුටුගැමුණු රජු සටනට ආ බව අසා දෙවන දවස් සන්නාහ සන්නද්ධ වූයේ මහා පර්වත නම් ඇතු පිටට පැන නැඟී දෙමළ මහා සේනාව පිරිවරා අවුත් වන. එ වෙලෙ හි දුටුගැමුණු රජ මෑණියන් විහාරමහාදේවීන් හා මන්ත්‍රණය කොට දිඝජත්තු නම් යෝධයා පිණිස මෑණියන් ගේ අප දේශයෙන් දෙතිස් බල කොටුවක් කරවා ධවලච්ඡත්‍රණ නංවා සර්වාභරණයෙන් සැරහු කිහිරි හරින් කළ රජ රූ දෙතිසකුදු සිටුවා දෙතිස් වන මහ බල කොටුවෙහි රජ තෙමේ සිටගත. ඉක්බිති දෙසෙනඟ සටන් කෙරෙමින් සිටියදී එළාල රජු ගේ දිඝජත්තු නම් යෝධයා කඩු පලඟ ගෙන බිමින් අටළොස් රියනක් අහසට පැන නැගී රජ රූ පොලු ගසා පළමු වන බල කොටුව හා සෙසු බල කොටු ද බිඳ ගැමුණු රජ සිටි බල කොටවට නික්මිණ. එ වේලෙ හි රජ්ජුරුවන් සමීපයට යන දිඝජත්තු නම් යෝධයා දුටු සුර නිර්මල යෝධයා තමාගේ නම කියා "මා සිටියදී ඔබ කොයි යෙයි ද නිවට දෙමළෑ" යි හඬ ගැසී ය. එ වෙලෙ හි ඔහු බිණූ බස් ඇසූ දීඝජත්තු නම් යෝධයා "දෙපලු කොට ගසා මොහු මරා රජු පසු ව මරමි" යි කිපි අහසට පැන නැඟි තමා ගේ හිස මුදුනට බස්නහු දැක සුරනිර්මල නම් යෝධයා තමා අත තුබූ පලඟය මිටින්ගෙන ඉස

වසා සිටියේ ය. දිසඡත්තු නම් යෝධයා ද ඉස් වසා සිටි පලහය දැක පලහය හා මොහු හා එක් කොට ගසමි යි සිතා පලහයට ගැසි ය. එකෙණෙහි සුරනිර්මල නම් යෝධයා පලහය අතින් හැරපි ය. දිසඡත්තුවා පලහය හා බිම වැටී හිණ. එ වේලෙ හි සුරනිර්මල යෝධයා බිම හුණුවහු නැඟී සිටිය නො දි කඩුවෙන් දෙපලු කොට ගැසි ය. ඵුස්සදෙව නම් යෝධයා එකෙණෙහි සෙණ ගසන කලක් මෙන් සක පිඹපි ය. එ වේලෙ හි දෙමළු උන්මත්ත භාවයට පැමිණයන් මෙන් වූ ය.

## එළාර රජු ගේ මරණය

ඉක්බිති දෙමළ සේනාව ද බිඳුණාහු ය. එළාල රජ, "දිසඡත්තුවා හුණු කල කුමන සටන් දැ" යි බිඳි පලා ගියේ ය. එ දවස් බොහෝ වූ අපමණ දෙමළුන් මැරු ය. එ සෙ මැරූ දෙමළුන් ගේ ලෙහෙයෙන් පොළොව ගලා ගෙන වැව දියට වැද ඒ වැව දිය ලෙහෙයෙන් කැලති ගියේ ය. එ සේ හෙයින් එතැන් පට ඒ වැව කලතා නම් වැව ය යි ප්‍රසිද්ධ විය. දුටුගැමුණු රජ "මා මුත් සෙසු කෙනෙක් එළාල රජු නො මරව" යි ඒ යුද්ධ භූමියෙ හි බෙර ලවා ගැමුණු රජ සන්නාහ සන්නද්ධ ව සන්නාහ සන්නද්ධ වූ කඩොලැතු පිටට පැන නැඟි බිඳි දුවන එළාල රජු ලුහු බඳවා දිව ගෙන ගොස් අනුරාධපුර නුවර දකුණු වාසලදි රජදරුවන් දෙදෙනා ගේ සටන් විය. ඒ දෙදෙනා සටන් කළ පරිදි කෙ සේ ද යත්, එළාල රජ තෝමරය දමා මරමි සිතා තෝමරය දැමී ය. දුටුගැමුණු රජ එළාල රජු දැමූ තෝමරය වළහාපි ය. එකෙණෙහි එළාල රජු නැගි පර්වත නම් ඇත්හු, ගැමුණු රජ තමා ගේ කඩොලැත්හු ලවා දළින් දළ අන්වා එළාල රජහට තෝමරය දමා ඒ රජු ළෙන් ඇන පිටින් නැංවි ය. එ වේලෙ හි ඇතු හා සමග ඒ රජ එ තැන් හි ම හිණ. ඉක්බිති දිනන ලද සංග්‍රාම ඇති දුටුගැමුණු මහ රජ චතුරඞ්ගනි සේනාව සහිත වූයේ ලඞ්කාද්වීපය එකාතපත්‍ර කොට දෙදෙව්ලොව දේවතාවන් පිරුවැරූ සක්දෙව් රජහු මෙන් මහ පෙරහරින් අනුරාධපුර නුවරට වන.

## දුටුගැමුණු රජ ලක එක්සත් කිරීම

ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ නුවර බෙර ලවා නුවරට හාත්පසින් සතර ගව්වක් පමණ තැන මිනිසුන් රැස් කොට එළාල රජු ගේ මළ ශරිරයට මහත් වූ පූජා සත්කාර කරවා රන් සිවිගෙයකින් ගෙන ගොස් දවා සොහොන් හස්කොට ඒ රජු දැවූ තැන ඔහු නමින් එළාල නම් දාගබක් කරවා "මා ඇතුළු වූ එන දවස රජදරුවන් ඇතුන් අසුන් නැගී මෙතෙනින් නො ගිය මැනවැ යි, බෙරත් නො ගැස්වුව මැනවැ" යි පෙරහැර තබවා ශිලා ලෙඛනයක් හිඳුවා ය. මෙ සේ දුටුගැමුණු රජ දෙතිස් දෙමළ කඳවුරක් පැහැර ලඞ්කාද්වීපය එකච්ඡත්‍ර කෙළේ ය.

## හල්ලුක යෝධයා

යම් දවසෙක දුටුගැමුණු රජ විජිතපුරය පහළේ ද, එදවස් ම දිසඡන්තු යෝධයා එළාල රජු සමීපයට ගොස් තමාගේ බෑනා හල්ලුක නම් යෝධයාගේ බල රජ්ජුරුවන්ට කියා ඔහු එන පරිද්දෙන් දඹදිවට පත් යවී ය. එපවත් ඇසූ හල්ලුකයා ද එළාල රජ්ජුරුවන් දැවූ සත්වෙනි දවස් සැට දහසක් යෝධයන් පිරිවරා පඬුවු නැඟි මාවටුතොටට අවුත් බැස එළාල රජ්ජුරුවන් මළ බව අසා "ලජ්ජාවෙන් නැවත රට නො යමි; සටන් කෙරෙමි" යි මාවටුතොටින් නික්ම කොළඹලා නම් ගම පඩවිටි බැඳ උන්නේ ය. දුටුගැමුණු රජ්ජුරුවෝ ද හල්ලුකයා ආ බව අසා සන්නාහ සන්නද්ධ ව කඩොලැතු පිටට පැන නැඟි දශ මහා යෝධයන් පිරිවරා

ගෙන මහත් වූ විභූතීන් මහත් වූ පෙරහරින් සේනාව පිරිවරා නික්මුණාහ. ඵුස්සදෙව නම් යෝධයා ද පඤ්චායුධ සන්නද්ධ වූයේ ගැමුණු රජු නැඟි ඇතුගේ පශ්චිමාසනයෙහි හුන්නේ ය. හල්ලුක නම් මහායෝධයා ද සන්නාහ සන්නද්ධ ව ඇතුපිට හුන් ගැමුණු රජ අභිමුඛයට අවුත් වන. එ දවස් කඩොලැත් ඔහු ගේ වේගය මඳ වනු පිණිස සෙමෙන් සෙමෙන් පසුබැස යෙයි. ගැමුණු සේනාව ද ඇතු හා සමග පසු පස්සෙන් බට හ. එ වේලෙ හි ගැමුණු රජ්ජුරුවෝ ඵුස්ස දෙව නම් යෝධයාණන්ට මෙ සේ කිවු ය. කෙ සේ ද යත්, "මේ ඇත්රජ පෙර අප අටවිසි මහ සටනක් කරන කල පසු නො බට, දැන් හල්ලුකයා ගේ සටනට කුමක් පිණිස පසුබසි දැ" යි විචාළ හ. ඵුස්සදෙව නම් යෝධයා රජ්ජුරුවන්ට මෙ සේ කී ය, "දේවයන් වහන්ස, ජය අපට ම ය. මේ ඇත්රජ ජය බිමක් සොයා යයි. පසු පස්සෙන් බැස ජය බිමකට පැමිණි කල එ තැන් හි සිටිනේ ය" යි දැන්වී ය. ඉක්බිති ඒ කඩොලැත් ද පසු පස්සෙන් බැස අනුරාධපුර නුවර සමීපයෙ හි මහාවිහාර සීමා අන්තයෙ හි සිට ගත. එ වේලෙ හි හල්ලුකයා ද ගැමුණු රජහු අභිමුඛයට අවුත් මා බැනන් මැරූ මේ රජහු මුඛයට ම විදිම යි හීයක් හිඳුවා ගෙන බැණ නැංගේ ය. ගැමුණු රජ ද කඩු තලයෙන් මුඛය වසා ගෙන, "කිමෙක් ද? නිවට දෙමළ" යි කියා බැණ නැංගේ ය. බැණ නැඟි රජහු ගේ මුඛයට ම විදිමි යි හල්ලුකයා හීයක් හැරපි ය. ඒ හීය ද ගොස් කඩුව පට වැද ගෙන බිම වැටී හිණ. එ වේලෙ හි රජ්ජුරුවෝ කට පුරා හුන් ලාරස බිමට දැමූ ය. ඒ දුටු හල්ලුකයා ද දුටුගැමුණු රජුහු ගේ මුඛයට ම තර කොට විද්දෙමි යි සොම්නසින් ඔල්වර හඬ පැවැත්වි ය. එ වේලෙ හි රජ්ජුරුවන්ට පශ්චිමාසනයෙ හි හුන් ඵුස්සදෙව නම් යෝධයාණෝ රජ්පුරුවන් පැලඳි කුණ්ඩලාභරණය පැහැර ගෙන හල්ලුකයා ගේ මුඛයෙ හි සැරයක් විද්දා හ. එ වේලෙ හි චිත් කා රජ්පුරුවන් දසාවට පය ලා හෙන්නහු ගේ දණට නැවත සැරයකින් විද රජ්පුරුවන් දසාවට හිස ලවා හෙළී ය. එ දවස් ලබන ලද ජය ඇති දුටුගැමුණු රජ නුවරට අවුත් වන. ඉක්බිති ඵුස්සදෙව නම් යෝධයා රජ්ජුරුවන් ගේ කුණ්ඩලාභරණය පැහැර තමා සැරය විදි දඬුවමට තමා ගේ කන්වැලින් ලේ ගෙන හැර, "ස්වාමීනි, නුඹ වහන්සේගේ කුණ්ඩලාභරණය පැහැර මා සැරය විදි වරදට මේ දඬුවමැ" යි රජ්පුරුවන්ට දැන්වූයේ ය. එ වේලෙ හි රජ්පුරුවෝ, "මා ගේ සතුරන් සාධක පිණිස කළ දෙයින් තොපට වරද නැතැ" යි ඒ විදි හීය ගෙන්වා ගෙන "හිය ගෙළින් සිටුවා හීපගිලිය වසා මසුරන් ගොඩක් ඵුස්සදෙවයන්ට දෙව" යි කියා මෙ ලෙස දෙවූ හ.

මෙ සේ මේ ලඞ්කාද්වීපය සතුරන් සාධා එකාතපත්‍ර කොට රජ්පුරුවෝ දශ මහා යෝධයන්ට හිමි පමණ රන් රුවන් තනතුරු දෙවූ හ.

## ථෙරපුත්තාභය යෝධයා මහණ වීම

එ සේ තනතුරු දෙන වේලෙ හි ථෙරපුත්තාභය නම් යෝධයාණෝ තමන්ට දෙන තනතුරු නො ගත් හ. "කුමක් පිණිස නො ගනු දැ" යි රජ් පුරුවන් විසින් විචාරන ලද්දාහු, "දේවයන් වහන්ස, තව සතුරෝ ඇතැ" යි කී හ. එ බස් ඇසූ රජ්පුරුවෝ, "දැන් සිංහලය මට එකරාජ්‍යය වුව, කුමන සතුරු කෙනෙක් ඇද්ද" යි විචාළ හ. මෙ ලෙස විචාළ රජ්පුරුවන්ට ථෙර පුත්තාභය නම් යෝධයාණෝ, "දේවයන් වහන්ස, කිසි කලෙකත් කෙලෙස් නැමැති සතුරා ජයගත නො හැක්ක. එ සේ හෙයින් ඒ කෙලෙස් නැමැති සතුරා හා යුද්ධයට යෙමි" යි කී හ. එ බස් ඇසූ රජුපුරුවෝ දෙතුන් වරෙක ම වලකා නො ගිවිස්නා හෙයින් "යහපත, වැලි, මහණ වව" යි අවසර දුන් හ. රජ්පුරුවන් විසින් දෙන ලද අවසර ඇති ථෙරපුත්තාභය නම් යෝධයාණෝ මහණ ව විදර්ශනා වඩා සිවුපිළිසිඹියාපත් රහත් වූ හ. රහත් ව පන් සියයක් රහතන් විසින් පිරිවරන ලදුව රුහුණු දනව්වෙ හි වූ ගුත්හල අඤ්ජලි පවු නම් විහාරයෙ හි වැඩ වසන සේක.

## රජුගේ දොම්නස

ඉක්බිති දුටුගැමුණු මහරජ මාළිගාවෙහි විසිතුරු කොට සරහන ලද ශ්‍රීයහන් මස්තකයෙ හි සැතපී දිව්‍යසම්පත් හා සමාන සම්පත් සඳහන් කොට, "ගිය ජාතියෙ හි කළ සුචරිත පින්කම්න් මේ සා මහත් සම්පතකට පැමිණි යෙමි" යි සතුටුව නැවත මැරූ අටළොස් කලන්දයක් දෙමළුන් සඳහන් කරන රජ්පුරුවන්ට මහත් වූ දොම්නස් උපන. එ වේලෙ හි පුවඟු දිවයින වැඩ හුන් එක් රහත් කෙනකුන් වහන්සේ රජ්පුරුවන් සිතූ සිත තමන් වහන්සේ ගේ නුවණින් දැන වදාරා රජ්පුරුවන්ව අස්වසනු පිණිස රහත් අට දෙනකුන් වහන්සේ ඒවා වදාළ සේක. ඒ අට දෙනා වහන්සේ ද අවුත් තමන් වහන්සේ වැඩි නියාව රජ්පුරුවන්ට කියා යවා මාළිගාවට නැඟී වදාළ සේක. එ වේලෙ හි රජ්පුරුවෝ තෙරුන් වහන්සේ වැඳ අසුන් පනවා වඩා හිඳුවා "වැඩි කාරණ කිම් දැ" යි විචාළ හ. තෙරුන් වහන්සේ ද තමන් වහන්සේ වැඩි කාරණ වදාරන සේක්, "මහරජ, තොප විසින් මැරූ අටළොස් කලන්දයක් දෙමළුන්ගෙන් ස්වර්ග මෝක්ෂ දෙකට අන්තරායක් වේ දෝ හොයි යනුවෙන් සිතූ සැකය හරනට ආම් හ" යි වදාළ සේක. එ බස් ඇසූ රජ්පුරුවෝ, "එ සේ ය ස්වාමීනි, අටළොස් කලන්දයක් පමණ දෙමළුන් මරා මේ සා යුද්ධයක් කරන ගැත්තවූ විසින් බොහෝ පව් රැස් කරන ලද. මේ අකුශල කර්මයෙන් ස්වර්ග මෝක්ෂ දෙකට ගත්තවුට බාධා ඇද්දෝ හෝ නැද්දෝ හෝ යි යන මේ සැකය පසිඳ වදාළ යහපතැ" යි කී ය. එ බස් ඇසූ තෙරුන් වහන්සේ ද "මහරජ, මේ නිසා තොපට ස්වර්ග මොක්ෂ දෙකට බාධාවක් නො පැනෙයි" වදාළ සේක. "ඇයි, ස්වාමීනි, බාධා නැතැ යි වදාරන්ට කාරණ කීම ද?" කිහිඹි කුහුඹු ලේඩිත් ඉනිකුණු ආදි කුඩා සතුන් මැරූ කල මහත් පාප ය යි යන කල මෙතෙක් මනුෂ්‍යයන් මැරූ පවින් මේ දුටුගැමුණු රජ්පුරුවන්ට ස්වර්ග මොක්ෂ දෙකට බාධා නැත්තේ ඇයි ද යත්, මේ දුටුගැමුණු රජ්පුරුවෝ එකාසඞඛෙය්‍ය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇති කෘතාධිකාර මහාත්මයාණෝ ය. අනාගතයෙ හි බුදු වන මෛත්‍රී නම් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට දකුණත් සවු වන්නාහු ය. එ සේ හෙයින් මේ රජ්පුරුවන් සසරෙ හි විසීම නැති හෙයින් පාපයට අවකාශ නැතැ" යි වදාළ සේක.

## මිරිසවැටි විහාරය කරවීම

එ වේලෙ හි තෙරුන් වහන්සේ ගේ බස් අසා සතුටු ව අස්වැසුණු රජ්පුරුවෝ තෙරුන් වහන්සේ වැඳ යවා අවකාශ ඉල්වා ගෙන නැවත ශ්‍රී යහනෙ හි සැතපී මෙ සේ සිතූ හ. "සංඝයා වහන්සේට දන් නො දී මම කිසි කලෙක්හි බත් ආදී කිසිවක් අනුභව නො කළ වීරිමි. මාගේ දෙමවුපිය දෙදෙනා මා බාල කල් හි ම අප දෙබෑයන් දන් නො දි කිසිවක් අනුභව නො කරව" යි දිවුර වූ හ. සංඝයා වහන්සේට මා විසින් දන් නො දි කෑ දෙයෙක් ඇද්දෝ හෝ නැද්දෝ හෝ යි පරීක්ෂා කරන්නාහු සඳහන් නැති ව දන් නො දී කෑ මළ මිරිස් පැස්සක් දැක, "මා විසින් කෙළේ මහා අපරාධයෙක, එ සේ හෙයින් මා ම දඬුවම කළ මැනවැ" යි සිතා රජ්පුරුවෝ ඔටුනු පලන් සතියක් ගිය කල මහත් වූ රාජානුභාවයෙන් සේනාව පිරිවරා දිය කෙළිනා පිණිස ද, නැවත රාජාභිෂෙකයට පැමිණි රජදරුවන් ගේ චාරිත්‍රය රක්ෂා කරනු පිණිස ද, තිසා වැවට නහන්නට ගිය රජ්පුරුවන් කැටිව ගෙන ගිය රන් වළන් ද පිළි සම්බඩම් ආදි වූ සෙසු වස්තූන් ද මිරිසවැටි විහාරය කරවන තැන තබා වැව දිය කෙළියට පටන් ගත් හ. ඒවේලෙ හි රජ්පුරුවන් හා කැටිව ගිය රාජ පුරුෂයෝ මිරිස වැටි දාගබ බඳිනා ස්ථානයෙ හි රජ්පුරුවන් ගේ ධාතු සහිත ජල කොන්තය ඉඳුරා කෙළින් සිටුවූ හ. දුටුගැමුණු රජ්පුරුවෝ පුරඟනන් හා සමඟ දිවාභාගය මුළුල්ලෙ හි දිය කෙළ සවස් වේලෙ හි "නුවරට යම් හ යි, ධාතු පිහිටවූ රුවන් කොන්තය ඉදිරි කොට නික්මෙව" යි කී හ. රජ්පුරුවන් ගේ බස් ඇසූ රාජ පුරුෂයෝ "ජයකොන්තය ගනුම් හ" යි ගොස් ඒ ගන්නා තබා තුබූ කෙනින් සොල වාලිය නුහුණුවාහු ය. ඒ ආශ්චර්යගොස දැක රජ්පුරුවන් ඇතුළු වූ සේනාව සුවඳින් මලින් ඒ ධාතු සහිත ජයකොන්තයට පූජා කළා

හ. නැවත දුටුගැමුණු රජ්ජුරුවෝ සතුටු සිත් ඇතිව හාත්පසින් එ තැන් හි රැකවල් ලවා නුවරට ගොස් අවුත් ජයකොන්තය වසා දාගබක් බඳවා මහත් වූ විහාරයක් කරවන රජ්ජුරුවෝ තුන් අවුරුද්දකින් කරවා නිමවූ හ.

## විහාර පූජාව

නැවත මේ දුටුගැමුණු මහරජ ඒ විහාර පූජා පිණිස මහා සංඝයා වහන්සේ රැස් කරවී ය. කෙපමණෙක් රැස් වූ ද යත්, භික්ෂූන් වහන්සේ ගෙන් ලක්ෂයක් දෙනා වහන්සේ රැස් වූ සේක. භික්ෂුණීන් වහන්සේගෙන් අනූදහසක් දෙනා වහන්සේ රැස් වූ සේක. එ සමයෙ හි මහා සංඝයා වහන්සේ දැක සතුටු වූ රජ්ජුරුවෝ, වැඳ එකත්පස් ව සිට මෙ සේ දැන්වූ හ. කෙ සේ ද යත්, "ස්වාමීනි, සඳහන් නැති ව සංඝයා වහන්සේට නො දී මළ මිරිස් පැස්සක් කැමි. ඒ පිණිස මට මේ දඬුවම් වේ ව යි දාගබ සහිත මේ මිරිසවැටි විහාරය කරවිමි. ගැත්තවුට පින් පිණිස පිළිගෙන වදාළ මැනවැ" යි දන්වා දාගබ සහිත විහාරය දන් දී ඇත පැන් වත් කොට මහා සංඝයා වහන්සේට වැඩ හිඳිනා පිණිස මහත් කොට මඩුවක් ලැවූ ය. ඒ මඩුවේ පලය අභයා වැව දිය පිට දක්වා සිටියේ ය. සෙසු අවකාශයෙ හි කියනුම් කිම ද? එ සේ ලවන ලද මඩුයෙ හි ලක්ෂයක් පමණ භික්ෂූන් වහන්සේ ද අනූ දහසක් පමණ භික්ෂුණීන් වහන්සේ ද එ හි වඩා හිඳුවා අත පැන් වත් කොට භික්ෂු සංඝයා වහන්සේට මහ දන් දී සිවුරු ආදී සියලු පිරිකර දන් දින. එ හි වැඩිමහලු සඞ්ඝ ස්ථවිරයන් වහන්සේ ත් පිරිකර ලක්ෂයක් වටනේ ය. (සෙසු භික්ෂූන් වහන්සේට පිළිගැන්වූ පිරිකර පන්සියයක් වටනේ ය.) මෙ සේ යුද්ධයෙ හි ද දානයෙ හි ද සූරවීර වූ ප්‍රඥා සම්පන්න වූ, රත්නත්‍රයයෙ හි ප්‍රසන්න වූ නිර්මල වූ සිත ඇති, ලොක ශාසන දෙක බැබළවීමෙ හි කරන ලද මහත් වූ වීර්යය ඇති, කෙළෙහි ගුණ දන්නාවූ ඒ දුටුගැමුණු රජ්ජුරුවන් රත්නත්‍රය පුදනු පිණිස ආදියෙ හි දාගබ කරවීමෙ හි පටන් ගැන්මෙ හි පටන් ඒ මිරිසවැටි දාගබ පූජාව අන්ත කොට පරිත්‍යාග කළ අනර්ඝ වස්තූන් හැර සෙසු වස්තූහු (එකුන්විසි) කෙළක් පමණ වස්තූහු ය. නුවණැත්තවුන් විසින් බිඳෙනසුලු වූ නිස්සාර වූ ආත්මයෙ හි ද වස්තුයෙ හි ද කරන ලද ඇල්මෙක් ඇත් නම් ඒ දුරු කොට මෙලෝ පරලෝ දෙක සුව විඳිනා පිණිස මේ දුටුගැමුණු මහරජහු මෙන් සියලු කුශල සම්භාරයන් රැස් කොට කෙළවර ජරා මරණ නැති අමා ය යි බුදුන් විසින් වදාරන ලද නිවන් දහම් ප්‍රත්‍යක්ෂ කටයුතු. මිරිසවැටි විහාර කථාව නිමි.

## ලෝවාමහාපායේ සැලැස්ම

ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ මෙ සේ සිතූ හ. මිහිඳු මහ තෙරුන් වහන්සේ මාගේ මුත්තණුවන් දෙවෙනි පැතිස්ස රජ්ජුරුවන්ට වදාරන සේක් "මහරජ, තොප ගේ මුනුබුරු වූ දුටුගැමුණු නම් රජෙක් එක්සිය විසි රියන් රුවන්වැලි නම් දාගබක් කරවන්නේ ය. සඞ්සයා වහන්සේට ද පොහෝ කරන්නට නව මහල් ඇති ලෝවාමහපා ය යි යන ප්‍රාසාදයක් කරවන්නේ ය" යි (යනු සිතා පරීක්ෂා කරන්නෝ) රජගෙයි කරඬුවෙක රන්පත ලියා තුබූ අකුරු දැක කියවා බලා, "මතු එන දවස එක්සිය සතළිස් අවුරුද්දක් ගිය කල කාවන්තිස්ස නම් රජ්ජුරු කෙනකුන්ගේ පුත් වූ දුට්ඨගාමණී අභය නම් රජෙක් මෙකී විහාර දෙක කරව යි" කියා ලියා තුබූ හසුන් කියවා සතුටු වූ ඒ දුටුගැමුණු රජ්ජුරුවෝ වමත හකුළුවා ගෙන දකුණතින් අත් පොළා, "මාගේ ස්වාමිදරු වූ මිහිඳු මහතෙරුන් වහන්සේ විසින් මම දක්නා ලදිම් වනැ" යි සතුටු ව දෙවෙනි දවස් උදැසන මහ සෙනග පිරිවරා මහමෙවුනා උයනට ගොස් මහා සංඝයා වහන්සේ රැස් කරවා සඞ්සයා වහන්සෙ වැඳ එකත් පස් ව සිට දොහොත් මුදුනෙහි තබා ගෙන මෙ සේ දැන්වූ හ. "ස්වාමීනි, මම භික්ෂු සංඝයා වහන්සේට පොහෝ ගෙයක් දිව්‍ය විමානයක් හා සදෘශ කොට කරවමි. රහතන් වහන්සේ

දෙව්ලොවට යවා පෙතිකඩෙක මාළිගා සැලැස්මක් අඳවා ගෙන්වා ගෙන මට දෙවා වදාළ මැනවැ" යි දැන්වූ හ. ඉක්බිති මහා සඞ්ඝයා වහන්සේ රහත් අට දෙනකු වහන්සේට එ පවත් කියා දෙව් ලොවට යවූ සේක. ඒ අට දෙනා වහන්සේ ද තව්තිසා දෙව්ලොවට ගොස් බීරණී නම් දිව්‍යා ස්ත්‍රීන යටගිය ජාතියෙහි අනුන්ට මිඩී ව ඉපිද සමයිතින් දන් පිසූ කුසලින් උපන්නා වූ තුන් ගව්වක් උස දිව්‍යා ශරීරයක් හා ගව්වක් උස වන් ඔටුන්නක් පැලඳ අටසාලිස් ගව්වක් දිග දිව සළුවක් හැඳ සැට ගැලක් පුරා ලන ආභරණ පැලඳ නවාමුණක් සුවඳ විලවුන් ගෙන සපු නා පනා සිහින් කෙන්ද දෑසමන් දෙඉද්ද සුරගි උපුල් පරසතු කොවිළාර මහනෙල් දුනුකේ වැටකේ කරාකේ සෙව්වන්දි සෞගන්ධික මරුවා විදෑවන මේ ආදි වූ සුවඳ මුල් යෙළයාළක් පැලඳ සැට දහසක් නළු නාටකයන් පිරිවරා උන්, අටසාලිස් ගව්වක් උස ඇති දහසක් රුවන් ගබඩායෙන් සැදුම් ලද රුවන් මාළිගාව දැක රහතන් වහන්සේ ඒ ප්‍රසාදය දැහිඟුලෙන් පෙතිකඩෙක හැඳ ගෙනවුත් භික්ෂු සඞ්ඝයා වහන්සේට දුන් සේක. සඞ්ඝයා වහන්සේ ද ඒ පෙති කඩ රජ්ජුරුවන්ට දෙවා වදාළ සේක.

## ලෝවාමහාපාය කරවීම

රජ්ජුරුවෝ ඒ පෙති කඩ දැක සතුටු ව ඒ ප්‍රාසාදය හා සදෘශ කොට ලෝවාමහාපාය කරවූ ය. කෙ සේ කරවූ ද යත්, මාළිගාට පටන්ගත් දවස් ම සතර වාසල අට දහසක් රන් තැබී ය. නැවත සතර වාසල් දොර දහසක් පිළිසම්බඩම් ද උක් සකුරු හෙළ ගිතෙල් තල තෙල් මී තෙල් පුරා තුබූ නොයෙක් සිය දහස් ගණන් සැළ තැබ්බවිය. නැවත ඒ දුටුගැමුණු රජ්ජුරුවෝ යමෙක් මේ ලෝවාමහාපයේ මිල නො ගෙන මෙහෙ නො කළ මැනවැ" යි අනුරාධපුර නුවර බෙර ලවා "යම් කෙනෙක් මිල නො ගෙන ඉදින් මෙහෙ කළෝ වූ නම්, උන් කළ මෙහෙ අගය කරවා මිල දෙව" යි සම්මත කළෝ ය. ඒ ලෝවාමහාපාය එක එක දිගින් සියක් සියක් රියන් විය. උසිනුත් සියක් රියන් විය. නව මහලකින් සැදුම් ලද. එක් එක් මාලෙ හි සියක් සියක ගබඩා ගෙවල් විය. ඒ සියලු ගබඩා ගෙවල් රිදියෙන් ම කරවූ ය. එ කී සියලු ගබඩා ම රන්රසු දැලින් පරික්ෂෙප කරවූ හ. ඒ ගබඩා ගෙවල් නොයෙක් විසිතුරු රුවනින් හෙබියා වූ පබළුමය පදනමින් ද යුක්ත ය. ඒ වේදිකායෙ හි පියුම් ද නොයෙක් සත් රුවනින් කරවූ ය. එ සේ ම දහසක් ගබඩා අනෙක රත්නයෙන් කරවා සිවුමැදුරු කවුළු ද රුවනින් ම නිමවා වෙසමුණු රජුහු ගේ නාරි වාහනය අසා ඒ වාහනය ආකාර කොට මාළිගා මද්ධියෙයේ රුවන් මණ්ඩපයක් කරවූ ය. ඒ මණ්ඩපය ද නොයෙක් රුවන් ටැඹින් ද සිංහ රූපයෙන් ද ව්‍යාඝ්‍ර රූපයෙන් ද දෙවතා රූපයෙන් ද යනාදි නොයෙක් රූපයෙන් හෙබියා වූ හාත්පසින් එලෙන්නා වූ ඇඹූලපක් සා මුතුදැලින් ද පරීක්ෂෙප කරවූ ය. ඒ මණ්ඩපයෙ හි පබළුමය වේදිකා පෙර කී ලෙස ම කරවූ ය. සත් රුවනින් විචිත්‍ර මණ්ඩප මධ්‍යයෙ හි දැවාණමය බිම ඇද්දළින් ආසනයක් කරවා පිටාටුව ද ඇද්දළින් ම කරවූ ය. හිරු මඬල ද රත්රනින් ම කරවූ ය. එ සේ ම රිදියෙන් සඳමඬල ද කරවූ ය. නැවත මුත්තෙන් කරවන ලද තරුවෙන් ද විචිත්‍ර විය. ඒ ඒ තන් හි සුදුසු ලෙස රත්නමය පියුම් ද ප්‍රසාද වූ ජාතක ද අතුරතුරෙ හි රන්ලිය ද කරවූ ය. ඒ මණ්ඩපයෙ හි මාහැඟි වූ බුමුතුරුණු අතුට සිත්කලු වූ ඇද්දළින් කරවන ලද ව්‍යූජන පත්‍ර ද තබා පබළුමය පියගැට කරවූ ය. එ සේ ම ආසන මත්තෙ හි ද පබළුමය පියුම් පිහිටුවන ලද්දේ ය. රිදියෙන් කරවන ලද දඬු ඇති රුවන් සේසත් ද පිහිටවූ ය. එ හි සත් රුවන්මය අටමගල ද අතුරතුරෙහි මැණික්මය වූ මුතුමය වූ සිවුපා පඞ්කතියක් ද කරවූ ය. ධවලච්ඡත්‍ර කෙළවර රත්නමය වූ මිණි පඞ්කතියක් ද එල්වූ ය. මාළිගාව ද, ධවලච්ඡත්‍රය ද, ආසනය ද, මණ්ඩපය ද යන මේ සතර අනර්ඝ ය. මාහැඟි වූ ඇඳ පුටු පනවා එහි මැහැඟි වූ පලස් ද අතුට මාහැඟි වූ බිම බුමුතුරුණු ද අතුරු වූ ය. සැට කළයක් පැන් ගන්නා රන් සැළ ද පැන් ඉස්නා රන් එව් ද කරවූ ය. සෙසු අනුභව කළමනා සියලු පිරිකර මෙතෙකැ යි පමණ නැත්තේ ය. නැවත ප්‍රාසාදය වට කොට වාසලින් ද පවුරින් ද පිරිවරන ලද. ලෝ හුළින් ද මාළිගාව සෙවූ බව හෙතු කොට ගෙන "ලෝවාමහාපාය" යි නම් විය.

## ලෝවාමහාපාය සංඝයා වහන්සේට පිළිගැන්වීම.

මෙසේ තව්තිසා දෙව්ලොවෙහි සුධර්මා නම් දිව්යව සභාව මෙන් ප්රදසාදය නිමවා මහා සංඝයා වහන්සේ රැස් කරවූහ. මිරිසවැටි විහාර පූජාවට මෙන් මහා සඞ්ඝයා වහන්සේ රැස්වූ සේක. යට මාලේ පෘථග්ජන වහන්සේවරුන්දෑ වැඩහුන් සේක. දෙවෙනි මාලේ සූත්රර පිටකය අභිධර්ම පිටකය විනය පිටකය යන තුන් පිටකය ධරන වහන්සේවරුන්දෑ වැඩහුන් සේක. තුන්වෙනි මාල ද සතර වෙනි මාල ද පස්වෙනි මාල ද යන තුන් මාලෙහි සෝවාන් සකෘදාගාමි අනාගාමි භික්ෂූන්වහන්සේ වැඩහුන් සේක. මත්තේ සතර මාලෙහි රහතන් වහන්සේ වැඩහුන් සේක. ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ මෙසේ මහා සඞ්ඝයා වහන්සේ රැස් කරවා වඩා හිඳුවා අත පැන් වත් කොට සඞ්ඝයා වහන්සේට මහාපාය පිළිගන්වා මිරිසවැටි විහාර පූජාව මෙන් සද්දවසක් මහ දන් දුන්හ. මහත් වූ දාන පරිත්යාවග ඇති දුටුගැමුණු මහ රජ්ජුරුවන් විසින් ප්රා සාද යට අනර්ඝ වස්තූන් තබා ප්රුසාදය පිණිස පරිත්යාමග කළ ධනය තිස් කෙළක් පමණ ය. එසේ හෙයින් "නුවණැති සත්වයෙනි, පරලොව යන කල හැරපියා යා යුතු වූ ධන සමූහය ඒ රජ්ජුරුවෝ මෙසේ දන් දීමෙන් තමා කැටුව පර ලොව ගෙන ගියහ" යි දත යුතු. ලෝවාමහපා කථාව නිමි.

## මහ සෑයට උළු ලැබුණු අයුරු

නැවත එක් දවසක් ඒ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ ලක්ෂයක් ධන වියදම් කොට බොධීන් වහන්සේට පූජාවක් කරවා ඇතුළු නුවරට වදනෝ රුවන්වැලි දාගැබ් වහන්සේ පිහිටුවන තෙන දෙවෙනි පැතිස්ස රජ්ජුරුවන් විසින් ඉඳුවන ලද ශිලා ලෙඛය දැක මිහිඳු මහ තෙරුන් වහන්සේ විසින් කියන ලද වචනය ද සිහි කොට, "මහ දාගබ කරවමි" යි කරන ලද සනිටුහන් ඇතිව ඇතුළු නුවරට වැද රජගෙයි මතු මාලට පැන නැඟී රසමසවුලෙන් යුක්ත වූ ආහාරය මෙහෙ නිමවා යහන්හි සැතපුණු රජ්ජුරුවෝ මෙසේ සිතූහ. හේ කෙසේ ද යත්: "රාජ්යවාසිහු මා හා කැටිව දෙමළ සටන් කොට මහත් වූ දුකට පැමිණි යෝ ය. කවර උපායකින් ලොකවාසින්ට දුක් නො දි දැහැමෙන් සෙමෙන් මහ දාගබට සුදුසු ලෙස උළු උපදවා ගනිම් දෝහෝ" යි රජ්ජුරුවන් සිතූ ක්ෂණයෙහි ධවලච්ඡත්රයෙහි අධිගෘහිත දෙවිඳු, සිතූ සිත් දැන, "දුටුගැමුණු රජ්ජුරුවෝ මෙසේ සිතූය" යි මහත් කොට හඬගෑ ය. ඒ හඬ ගෑ ශබ්දය පරම්පරාවෙන් ගොස් සදෙව්ලොව පැතිර සිටියේ ය. ඒ බව සක්දෙව් රජ දැන විශ්වකර්ම දිව්යය පුත්රවයා කැඳවා මෙසේ කී ය. "දරුව, දුටුගැමුණු රජ්ජුරුවෝ රුවන්වැලි දාගබ බඳිනට උළු කෙසේ ලැබෙම් දෝ හො යි සිතා උන්නෝ ය. තෙපි ගොස් අනුරාධපුර නුවරට උතුරු දිග නුවරට සතර ගව්වක් පමණ තෙන ගැඹුරු හෝතෙර උළු ගොඩක් මවා එව" යි යවී ය. එබස් ඇසූ විශ්වකර්මයා අවුත් ඒ හෝබඩ මහ දාගබට සුදුසු උළු මවා දෙව්ලොවට ගියේ ය. දෙවන දවස් බල්ලන් හැර ගෙන දඩගිය බලු වැද්දෙක් ඒ ඒ තැන ඇවිදිනේ උළු තුබූ තෙනට ගොස් උළු නො දැක නැවත නුවරට එන්නේ ය. ඒ ඇසිල්ලෙහි එක් බූමාටු දෙවියෙක් ඒ වැද්දවුට උළු දක්වනු පිණිස මහත් ගෝ වෙසක් මවා ගෙන වැද්දවුට ද බල්ලන්ට ද තමා දක්වා උන් විසින් ලුහුබඳවා ගෙන යන ලද්දේ උළු ගොඩ තැබූ තෙනට ගොස් අන්තර්ධාන විය. එසේ ලුහුබඳවා ගෙන ගිය වැදි උළු දැක,"අපගේ රජ්ජුරුවන් වහන්සේ දාගප් කරවනු කැමති සේක. මා විසින් මහත් වූ පඬුරක් දක්නා ලදැ" යි සතුටු වූ සිත් ඇත්තේ නුවරට අවුත් දෙවෙනි දවස් උදැසන මාළිගාවට අවුත් රජ්ජුරුවන් දැක තමා දුටු උළු පඬුරු රජ්ජුරුවන්ට දැන්විය. එබස් ඇසූ ගැමුණු රජ්ජුරුවෝ සතුටුව ඒ බලු වැද්දවුට බොහෝ සම්පත් දී ඒ වැද්දවු ම උළු රක්නා නියායෙන් සම්මත කළා හ. දුටුගැමුණු රජ්ජුරුවෝ, "උළු දක්නට මම ම යෙමි. රුවන් කොන්තය ඉදිරි කරව" යි කි හ.

## රන් පහළ වීම

ඒ ඇසිල්ලෙහි අනික් අස්නක් ගෙනවුත් රජ්ජුරුවන්ට දැන්වූ හ. අනුරාධ පුර නුවරට දොළොස් ගව්වකින් ඈත ඊශාන කොණයෙහි අවුරුවිටි නම් ගම තුන්යම් රාත්‍රියෙ හි වැසි වට කල තුන්යාළ සාරමුණක් බීජුවට යන තන් හි රන් පැළ පැන නැංගේ ය. එ සේ නැඟුණු රන් පැළ කෙතෙක් උස නැඟි ද යත්. උස් ව නැගි රන් පැළ වියතක් උස නැංගේ ය. මිටි ව නැඟි රන් පැළ සතරඟුල් පමණ උස ඇති ව නැංගේ ය. රාත්‍රිය පාන් ව ගිය කල ඒ ගම්වැස්සෝ රන් පැළ දැක සතුටු ව, "අප ගේ රජ්ජුරුවන්ට සුදුසු භාණ්ඩයෙක් උපනැ" යි එ තැන් හි රැකවල් ලවා රන් පැළ පාත්‍රණයක් පුරා ගෙනවුත් රජ්ජුරුවන්ට දැක්වූ හ. රජ්ජුරුවෝ සතුටු ව ගම්වැස්සන්ට සුදුසු ලෙස සම්පත් දී ඒ ගම්වැස්සන් ම ඊට ආරක්ෂාංයෙ හි සිටුවූ හ.

## තඹ පහළ වීම

නැවත එ ම ඇසිල්ලෙ හි ම අනික් අස්නක් රජ්ජුරුවන්ට ගෙනවුත් දැන්වූ හ. නුවරට නැගෙනහිරි දිශාවෙ හි අටවිසි ගව්වකින් ඈත ගඟින් එතෙර තඹවිටී නම් ගම තඹ උපන. ඒ ගම්වැස්සෝ, "රජ්ජුරුවන්ට සුදුසු භාණ්ඩ යක් ලදුම් හ" යි සතුටුව එයින් තඹ පාත්‍රයක් පුරා ගෙනවුත් රජ්ජුරුවන්ට දක්වූ හ. රජ්ජුරුවෝ ද ඒ දැක සතුටුව උන්ටත් සුදුසු ලෙස සම්පත් දී ඒ ගම්වැස්සන් ලවා ම රැකවල් ලැවූ හ.

## මැණික් පහළ වීම

ඒ අස්නට ඉක්බිති ව අනික් අස්නකුත් ගෙනවුත් දැන්වූ හ. අනුරාධපුර නුවරට සොළොස් ගව්වකින් ඈත අග්නි කොණයෙ හි සමන් නම් වැව සමීපයෙ හි උපුල්වන් කුරුඳු හා බොහෝ මැණික් උපන. ඒ ගම්වැස්සෝ එයින් පාත්‍රයක් පුරා ගෙනවුත් රජ්ජුරුවන්ට දැක්වූ ය. රජ්ජුරුවෝ ද ඒ පඬුරු දැක සතුටුව ඔවුන්ටත් සුදුසු ලෙස බොහෝ සම්පත් දි උන් ම ඒ වස්තුවට රැකවල ලැවූ හ.

## රිදී පහළ වීම

ඒ අස්නට ද ඉක්බිතිව අනික් අස්නක් ගෙනවුත් රජ්ජුරුවන්ට දැන්වූ ය. අනුරාධපුර නුවරට දකුණු දිග දෙතිස් ගව්වකින් මත්තෙහි ඇමතොට දනව් වෙහි එක් ලෙණක රිදී උපන. එසමයෙහි අනුරාධපුර නුවර හිඳිනා එක් වැපාරයෙක් බොහෝ ගැල් ගෙන්වා ගෙන ඉඟුරු කසා ආදිය නිසා ගල්වල යන්නේ ඒ රිදී තුබූ ලෙණ දොරට නුදුරු තෙන ගැල් මුදා කැවිටි දඬු හා දර සොයා ඒ පර්වතයට නැංගේ එක් කොස් ගසක් දිට. එසේ දුටු කොස් ගස අත්තෙක සැළක් සා එකම එක් කොස් ගෙඩියක් පල ගෙන කොස් අත්ත නමාගෙන යට ගල් මත්තෙහි තුබූ කොස් ගෙඩිය ඒ වැපාරයා දැක කොස් ගෙඩිය සමීපයට ගොස් අතින් මැඩ බලා විලිකුන් බව දැන වැයෙන් නටුව කැපි ය. එ වේලෙ හි ඒ කොස් අත්ත පෙර සේ ම කෙළින් සිටියේ ය. ඉක්බිති ඒ ව්‍යාපාරයා ඒ කොස් එලය කපා ගෙන, "තමා ලත් දෙය දන් නො දි නොකම්" යි සිතා, "සිඟා වඩනට කලැ" යි සංඝයා වහන්සේට හඬ ගෑ ය. එවේලෙහි රහත් සතර දෙනකුත් වහන්සේ ඒ වෙළඳා අභිමුඛයෙහි අවුත් පෙනුණු සේක. ඒ වෙළඳා ද වැඩි සරතදෙනා වහන්සේ දැක සතුටුව ඒ සතරදෙනා වහන්සේගේ ශ්‍රි පාදය වැඳ වඩා හිඳුවා කොස් ගෙඩිය නටුව වට කොට වැයෙන් සැස වසල්ල උදුරා හැරපී ය. එවේලෙහි කොස් එලයෙහි සියලු රසය බැස වසල්ල පහ කළ තැන පිරී ගියේ ය. ඒ වෙළඳා රන්වන්

පැහැ බඳු වූ ඒ කොස් පැණි පාත්‍රය සතර පුරා ගෙන දන් දින. ඒ රහත් සතරදෙනා වහන්සේ ඒ වෙළඳා බල බලා සිටියදී ම ආකාශයට පැන නැඟී වැඩ වදාළ සේක. නැවත ඒ වෙළඳා "සිඟා වඩනා කලැ" යි හඬ ගෑ ය. එවේලෙහි ම අනික් සතර දෙනකු වහන්සේ වෙළඳා සමීපයට වැඩි සේක. ඒ සතරදෙනා වහන්සේ අතින් පාත්‍රඳ ගෙන රන්වන් පැහැයෙන් යක්ත වූ කොස් මිදුලු පාත්‍රල පුරා පිළිගැන්වී ය. එවේලෙහි ඒ තෙරුන් වහන්සේගෙන් තුන් දෙනකු වහන්සේ අහසින් වැඩ වදාළ සේක. අනික් ඉන්දගුත්ත නම් තෙර කෙනකුන් වහන්සේ ඒ ගල් ලෙණ තුබූ රිදී ඒ වෙළඳාට පානා කැමැති සේක් පර්වතයෙන් බැස රිදී තුබූ ලෙණ දොරට නුදුරු තෙනක වැඩහිඳ කොස් මිදුලු වැළඳූ සේක.ඒ වෙළඳා තෙරුන් වහන්සේ වැඩි කල ඉතිරි කොස් මිදුලු තෙමේ අනුභව කොට තෙසු මිදුලු පොදියක් කොට බැඳ ගෙන එන තැනැත්තේ කොස් මිදුලු වළඳන තෙරුන් වහන්සේ දැක සතුටුව ඔබ අත සෝධන පැන් ද පාත්‍රබය සුද්ධ කරන කොළ ද දින. තෙරුන් වහන්සේ ද රිදී තුබූ ලෙණ දොරින් වෙළඳා ගැල් තුබූ තෙනට යන මගක් මවා" "උපාසකය, මේ මගින් යව" යි වදාළ සේක. ඒ වෙළඳාත් වදාළ බස් මුදුනෙන් පිළිගෙන වැඳ යමු ගෙන ඔබ මැවූ මගින් යන තැනැත්තේ ලෙණ දොරට පැමිණ ඇතුළු ගල් ලෙණ බලන්නේ පුරා තුබූ රිදී දැක රිදී පිඩක් හැර ගෙන වැයෙන් සැස බලා රිදී බැව් දැන සතුටුව මහත් රිදී පිඩක් හැර ගෙන ගැල් තුබූ තෙනට ගොස් තණ පැන් ඇති තෙනක ගැල් රඳවා යුහුව අනුරාධපුර නුවරට ගොස් තමා ගෙන ගිය රිදී රජ්ජුරුවන්ට පෑ ඒ කාරණය දැන්වී ය. එ පවත් ඇසූ දුටුගැමුණු මහරජ ඒ වෙළඳාට බොහෝ සම්පත් දින.

## මුතු හා පබළු

ඒ අස්නට ඉක්බිති ව අනික් අස්නක් දැන්වූ හ. අනුරාධපුර නුවරට බටහිරි දිශාවෙහි විසි ගව්වකින් මත්තෙහි උරුවෙල් නම් පටුන්ගම මහත් ඇඹුලපක් සා මුතු හා පබළු හා ගැල් සැටක් පුරා ලන පමණ මුතු සාගරයෙන් නැඟී අවුත් වෙරළ ගැසි ගියේ ය. ඒ පටුන්ගම කෙවුළෝ ඒ දැක, "අප ගේ රජ්ජුරුවන්ට සුදුසු භාණ්ඩයෙක් උපනැ" යි සතුටුව ඒ මුතු හා පබළු උකාගෙන ගොඩක් කොට රකවල් ලවා එයින් පාත්‍රයක් පුරා ගෙන අවුත් රජ්ජුරුවන්ට දැක්වූ හ. රජ්ජුරුවෝ ඒ කෙවුළන්ට සුදුසු ලෙස බොහෝ උපකාර කළ හ.

## මැණික් සතරක්

නැවත අනික් අස්නක් ගෙනහැර දැක්වූ ය. නුවරට වායව්‍යා කොණ යෙහි අටවිසි ගව්වකින් ඈත පෙළවාපි නම් ගම වැවට දිය හුණු කඳුරැලි යෙහි වැලි පිට දාපෝ සා පමණ දිගින් වඩුයෙන් එක් වියත් සතරඟුල් පමණ දිග ඇති දිය මෙරලිය මල් පැහැ වැනි වූ සතර මැණිකෙක් උපන. ඉක්බිති මත්ත නම් එක් බලු වැද්දෙක් බල්ලන් හැර ගෙන හෝ කඳුරැලිය හස ඇවිදිනේ ඒ මැණික් සතර තුබූ තෙනට අවුත් මැණික් සතර දැක සතුටුව, "මේ මාගේ රජ්ජුරුවන්ට සුදුසු පඬුරෙකැ" යි සිතා ඒ මැණික් සතර වැල්ලෙන් වසා නුවරට අවුත් රජ්ජුරුවන් දැක එ පවත් දැන් වී ය. එ පවත් ඇසූ රජ්ජුරුවෝ සතුටුව ඒ වැද්දවුට ප්‍රසාද දුන් හ. මෙ සේ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ දාගබ පිණිස උපන් උළු යන මේ ආදිය එක දවස් ම අසා උළු හා රිදී ආදිය උපන් තෙනට රජ්ජුරුවෝ ගියෝ ය. ඒ ඒ රත්නයෙන් උපන් තැන් ඒ ඒ නම් විය. ථූප සාධන කථා නිමි.

## කර්මාන්ත පටන් ගැනීම

ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ දාගබ් නිසා උපන් රත්රන් ආදි සියලු රුවන් ම ගෙන්වා ගෙන තමන් ගේ භාණ්ඩාගාරයේ රැස් කරවූ ය. නැවත ඒ සියලු සම්භාරයන් නිමි කල වෙසඟ පුර පසළොස්වක් දවස් විසා නකතින් මහදාගබ බිම ගන්නා පිණිස කර්මාන්තයට පටන් ගෙන රජ්ජුරුවෝ දාගබ පිහිටන තෙන දෙවෙනි පැතිස්ස රජ්ජුරුවන් හිඳුවූ ශිලාලෙඛණය හරවා තලච්ච පිණිස හාත්පසින් ඇත් පවුර කෙළවර කොට වඩුවෙන් සත් රියනක් පමණ තෙන බිම කප්පවා හැර යෝධයන් ලවා වටගල් අතුරුවා කඹුරුකුළින් තළා පොඩි කොට ඊට ඉක්බිති ව සොම්මරුන් ලවා ඇතුන් පයට සම්පයි විද ලවා ඇතුන් ලවා මඩවා නැවත ගල්සුනු මත්තෙහි නවනිත මැටි අතුරුවූ ය. ඒ නවනීත මැටි නම්, ආකාශ ගඞ්ගාව හුණු තෙන ජලබින්දු නැඟි හාත් පසින් එක්සිය විසි ගව්වක් පමණ තන් හි ජල බින්දු ඉසෙන්නේ ය. යම් තෙනක සයංජාත හැල් උපදි ද, ඒ ස්ථානය නිරන්තරයෙන් ම තෙමෙන හෙයින් ඒ ස්ථානයට තින්තසිසකොල ය යි නම් විය. එතැන මැටි සියුම් හෙයින් නවතින මැටි යයි කියන්නා හ. එතැනින් ඒ මැටි ක්ෂිණාශ්‍රව සාමණේරයන් වහන්සේ ගෙනෙන සේක. ඒ මැටියෙන් හැම තැන් හි ම මැටියෙන් කරන කර්මාන්ත කළ හ. ඒ මැටි මත්තෙහි ගඩොළු අතුරුවා ඒ මත්තෙහි බොරළු සුනු ලැවූ ය. ඒ බොරළු සුනු මත්තෙහි කුරුඳු පහණ අතුරුවා ඒ කුරුඳු පහණ මත්තෙහි යදැල් කැට අතුරුවා ඒ යදැල් කැට මත්තෙහි රහත් සාමණේරයන් වහන්සේ හිමාලයෙන් ගෙනා සුවඳ කල්ල අතුරුවා ඊපිට කිරිවාණ ගල් අතුට කිරිවාණ ගල් මත්තෙහි දැවාණ ගල් අතුට දැවාණ ගල් මත්තෙහි ගල්බිම කැරවිය. හැම තැන් හි ම මැටියට නවනීත මැටි ගත් හ. ගල් අතළ මත්තෙහි රසදියෙන් අනන ලද ගිවුළු ලාටුයෙන් හනන ලද මැටි පෙළ මත්තෙහි අටඟුල් බොල තඹ පටක් අතුට, ඒ තඹ පට මත්තෙහි තල කතලින් හනන ලද සිරියලින් සතරඟුල් බොල රිදී පටක් අතුට මෙ සේ දුටු ගැමුණු මහ රජ සර්වප්‍රකාරයෙන් තලච්ච කරවා ඇසළ මස තුදුස්වක් දවස් භික්ෂු සංඝයා වහන්සේ රැස් කරවා වැඳ එකත්පස් ව සිට මෙ සේ දැන්විය.

## නුවර බෙර ලැවීම හා සැරසීම

"ස්වාමීනි, සෙට මැදි පොහෝ දවස් උතුරුසළ නැකතින් මහ දාගබ් මඟුල් උළු බිම ඔබමි. සෙට දාගබ බඳිනා තැන් හි මහා සංඝයා වහන්සේ රැස් වන සේක් ව" යි දන්වා අනුරාධපුර නුවරට වැද නුවර බෙර ලවන්නෝ මේ සැටියේ කියා බෙර ලැවූ ය. "සෙට හැම දෙන ම පෙහෙව ගෙන සුවඳ මල පහන් තෙල් මේ ආදිය හැරගෙන දාගබ බඳිනා තන් හි රැස් වෙත් ව" යි බෙර ලවා, ඉක්බිති විසාඛ ය, සිරිදෙව ය යි යන නම් ඇති අමාත්‍යයන් දෙදෙනකුට මෙ සේ නියෝග කළ හ. "තෙපි දෙදෙන ගොස් දාගබ බඳිනා තෙන සරහව" යි කියා යවා, උන් දෙන්න අවුත් හාත්පසින් රිදී පට හා සමාන වැලි අතුරුවා ඒ වැලි මත්තේ හෙළ සිද්දතු ය, සුන්සාල ය, දැසමන් කැකුළු ය, හීතණ ය, විලඳ ය යි යන මේ පස අතුරුවා කෙහෙල් තොරණ නංවා පූර්ණ ඝට පූර්ණ කලස තබවා ඉඳුනිල් මැණික් වැනි නිල් හුණදඬු අග රත් නිල් සුදු මේ ආදී පඤ්ච වර්ණයෙන් යුක්ත ධජ පතාක බඳවා රන් මල් රිදී මල් සුවඳ වහන අනෙක ප්‍රකාර මල් ද බිම අතුරුවා නොයෙක් සැටියේ ඒ දාගබ බඳිනා ස්ථානය සැරහූ ය. ඉක්බිති දුටුගැමුණු මහ රජ සියලු අනුරාධපුර නුවර ද විහාර මාර්ගය ද තව්තිසා දෙව්ලොව සුදර්ශන වීථිය මෙන් සරහා රාත්‍රිය පාන් ව ගිය කල නුවර සතර වාසල් දොර පූජාවට එන දනවූ ගම්වැස්සන් ද නුවර වැස්සන් ද දැළිරැවුළු කප්පවා සුනු පැනි ලා පූජාවට ගැනු පිරිමින් සරහනු පිණිස කරනැවැමියන් ද, ඉස් සෝධා නහවනු පිණිස තෙල් කසා ද සුවඳ වහන දෑ ද වස්ත්‍රාභරණ ද, ඔවුන් සරහනු පිණිස කපුවන් ද, නහා හැඳ පැලඳ පූජාවට වදනවුන් අනුභව කරනු පිණිස මියුරු බත් මාළු ද, සකුරු කෙහෙල් උක්දඬු පොල් පුවක් වැල වරකා මී පැන් උක් පැන් කස පැන් ඇටකෙහෙල් පැන් අඹ පැන් දඹ පැන් මේ ආදී වූ අනුභවයට සුදුසු දෑ ද පානය කටයුතු වූ අෂ්ට විධ පාන

වර්ගයන් ද, කපුරු ලමඟ තකුල් නාරඟ හිගුරු යන මේ ආදී පස් පලවතින් බුලත් ද සතර වාසල් දොර තබ්බවා ඒ රජ මෙ සේ සම්මත කෙළේ ය. "මේ චෛත්‍යය ස්ථානයට පූජාවට වදනා මේ මා ගේ ලංකාද්වීප වාසීන් මාගෙන් තැබ වූ සියලු වස්තූන් අනුභව කොට පූජාවට අව මැනවැ" යි සම්මත කෙළේ ය. එ වේලෙ හි සියලු ජනයෝ තම තමන් රුචි වූ පරිද්දෙන් දැළිරැවුළු කප්පා ඉස් සෝධා නහා බත් මාළු අනුභව කොට සුවඳ කවා තබන ලද සුවඳ පැන් බී වස්ත්‍රාභරණයෙන් සැරහී "දාගබ බඳිනා තෙනට යෙත් ව" යි ලියන්නන් විසින් කරන ලද විධාන වූ පරිද්දෙන් සියලු ජනයෝ පූජාවට වදනා හ.

## රජු දගබ බඳින තැනට පෙරහරින් යෑම

ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නහා රන් සළු හැඳ රන් පට රුවන් සොළු කර්ණකුණ්ඩලාභරණ තාඩංක නාගවඩම් කාදුකාප්පු මුතුපට කට්ටොඩම් බාහුදණ්ඩි මිණි වළලු කයිවළලු ගිගිරිවළලු මණිකයිවඩම් පස්රු රුවන් වැල රන් සවඩි පාදසංබලා පාදභරණ පාසලඹ කිංකිණිජාලා මේ ආදි වූ සූසැට ආභරණයෙන් ද, සිද්ධ ඔටුනු මිණි ඔටුනු සිංහ ඔටුනු ව්‍යාඝ්‍ර ඔටුනු රුවන් ඔටුනු යන මේ ආදි වූ සත් ඔටුන්නෙන් රුවන් ඔටුන්නක් පැලඳ දෙදෙව්ලොව දෙවියන්ට අධිපති වූ සක් දෙව්රජහු මෙන් සැරහී, සූරවීර වූ විචිත්‍ර වූ චිත්‍රළ කර්මාන්තයෙන් යුක්ත දඬු ඇති අසි සන්ති තොමරාදි වූ ආයුධ ගත් හස්ති ශිල්ප අශ්ව ශිල්පඛඩ්ග ශිල්ප ධනුශ් ශිල්ප මේ ආදි අෂ්ටාදශ ශිල්පයෙහි දක්ෂ වූ නන්දිමිත්‍රදි යෝධයන් ප්‍රධාන කොට ඇති සතලිස් දහසක් පුරුෂයන් විසින් පිරිවරන ලදුව, පෙහෙව, නොයෙක් දහස් ගණන් අමාත්‍යයන් විසින් ගන්නා ලද රැකවල් ඇති ව, කනක කටක සර නුපුර තාඩංක පාදාඞ්ගුලි පාදපට පස්රු පස්පෙරහර එක්වැටි පා මුදු පා සලඹ පා පියුම් නබ පියුම් දෙපට විද්‍යාඹරවසුම් රන් සවඩි මණිකයිවඩම් රන් තනපට මුතු පට කට්ටොඩම් පමුති ලිංගම් කාදුකාප්පු රුවන් තෝඩු සිරිකත් කොණ්ඩමාල මේ ආදි ආභරණ පලන් සුජාතා නම් දිව්‍යාතඞ්ගනාව හා සමාන වූ සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා, සක්දෙව් රජහු මෙන් තමන් ගේ සම්පත්තීන් ඒ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ බොහෝ දෙනා සතුටු කරවමින් ගැට බෙර පණා බෙර එකැස් බෙර මිහිඟු බෙර මද්දල පටහ ලොහො බෙර තලප්පර වීරන්දම් ඉඬිත්ති තම්මැට රණරඟ සොෂා සමුද්‍ර සොෂා ඩවුර සක්පඤ්ච යන මෙකී භෙරි ජාතීන් ද, රන් සක් රිදි සක් ජය සක් රුවන් සක් යුවළ සක් දකුණු සක් රන්සින්නම් රිදි සින්නම් රුවන් සින්නම් රන් දාරා රිදි දාරා දළ දාරා දළහං ලෝහං ගවරහං විජයොධ්වනි ඔත්තු තන්තිර පටසිරිවිල මෙ කී කාහල ජාතින් ද, නකුල වීණා හාඞ්ග වීණා ක්ෂුද්‍ර වීණා ආලවත්ති වඞ්ගී වස්දඬු මේ ආදි නාදයෙන් ද ඒ දුටුගැමුණු මහ රජහු යුගන්ධර පර්වත සමීපයෙ හි සාගර නාදයක් මෙන් මහත් වූ යසඃශ්‍රීයෙන් මහත් වූ පෙරහරින් පස්වරු දාගබ බඳිනා ස්ථානයට නික්මුණා හ. ඉක්බිති දාගබ බඳිනා තැන මඟුල් පිණිස පොදි කොට බඳනා ලද අටෝරා දහසක් පිළි සම්බඩම් තැබූ හ. තෙල් මී හකුරු උක් කෙහෙල් වැල වරකා හා අනෙක වර්ගයේ කැවුම් ද රැස් කරවූ හ.

## රැස්වූ මහා සංඝයා වහන්සේ

එ වේලෙ හි නොයෙක් රටින් බොහෝ සඞ්ඝයා වහන්සේ වැඩි සේක. හේ කෙ සේ ද යත්, රජගහ නුවර සමීපයෙ හි වසන ඉන්දගුත්ත නම් මහ තෙර කෙනකුන් වහන්සේ අසූ දහසක් රහතන් පිරිවරා ආකාශයෙන් වැඩ වදාළ සේක. එ සේ ම බරණැස් නුවර ඉසිපතන මහා විහාරයෙහි වැඩ වසන ධර්මසෙන නම් එක් මහ තෙර කෙනකුන් වහන්සේ දොළොස් දහසක් රහතන් වහනසේ පිරිවරා වැඩි සේක.

සැවැත් නුවර බුදුන් වැඩ විසූ ජෙතවන මහා විහාරයෙන් පියදස්සි නම් එක් මහ තෙර කෙනකුන් වහන්සේ සැට දහසක් රහතන් වහන්සේ පිරිවරා වැඩි සේක. විසාලා මහ නුවර සමීපයෙ හි මහවන නම් විහාරයෙන් බුද්ධරක්ෂිත නම් මහ තෙර කෙනෙකුන් වහන්සේ අටළොස් දහසක් රහතුන් පිරිවරා වැඩි සේක. කොසඹෑ නුවර සොෂිතාරාමයෙන් ධර්මරක්ෂිත නම් මහ තෙර කෙනෙකුන් වහන්සේ තිස් දහසක් රහතුන් පිරිවරා වැඩි සේක. එ සේ ම උදේනි නුවර දකුණුගිරි විහාරයෙන් මහා ධර්මරක්ෂිත නම් මහ තෙර කෙනකුන් වහන්සේ සතලිස් දහසක් රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක. පැළලුප් නුවර අශොකාරාමයෙ හි වසන මිත්තිණ්ණ නම් මහ තෙර කෙනකුන් වහන්සෙ එක් ලක්ෂ සැට දහසක් රහතුන් පිරිවරා වැඩි සේක. ගන්ධාර දෙශයෙන් උත්තිණ්ණ නම් එක් මහ තෙර කෙනකුන් වහන්සේ දෙලක්ෂ අසූ දහසක් රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක. මහා පල්ලව භොග නම් රටින් මහාදෙව නම් එක් මහ තෙර කෙනකුන් වහන්සේ සාර ලක්ෂ සැට දහසක් පමණ රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක.යොන් රට අලසන්දා නම් නුවරින් යොනක ධර්මරක්ෂිත නම් මහ තෙර කෙනකුන් වහන්සේ තිස් දහසක් රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක. වින්ධ්‍යාව්වත්තනියෙන් උත්තර නම් එක් තෙර කෙනකුන් වහන්සේ අසූ දහසක් රහතුන් වහන්සෙ පිරිවරා වැඩි සේක. මහාබොධිමණ්ඩල විහාරයෙන් චිත්තගුත්ත නම් මහ තෙර කෙනකුන් වහන්සේ තිස් දහසක් රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක. වනවාසිභොග නම් විහාරයෙන් චන්දගුත්ත නම් මහ තෙර කෙනකුන් වහන්සේ අසූ දහසක් රහතුන් පිරවරා වැඩි සේක. කෙලාස මහා විහාරයෙන් සුරියගුත්ත නම් මහ තෙර කෙනකුන් වහන්සේ සයානු දහසක් රහතුන් වහන්සේ පිරිවරා වැඩි සේක. ද්විපවාසී වූ බිමින් වැඩි පෘථග්ජන භික්ෂූන් වහන්සේ මෙතෙකැ යි ගණන් නැත. ඒ සමාගමයෙ හි රැස් වූ භික්ෂූන් වහන්සේ අතුරෙන් ක්ෂිණාශ්‍රව වූ ආකාශයෙන් වැඩි සයානු කෙළක් පමණ රහතන් වහන්සේ ය යි දත යුතු.

මෙ සේ රැස් වූ මහාසංඝයා වහන්සේ පබළු වළල්ලක් මෙන් දුටුගැමුණු රජ්ජුරුවන් මැදි කොට ඔවුනොවුන් වහන්සේට ගහට නො වන සැටියේ අතුරෙහි නමකට බිම තබා වැඩ සිටි සේක. එ වේලෙ හි බුද්ධරක්ෂිත නම් මහ තෙර කෙනකුන් වහන්සේ තමන් වහන්සේ ගේ නමින් බුද්ධරක්ෂිත නම් ඇති පන්සියයක් රහතුන් හැර ගෙන නැගෙනගිරි දිසාවෙහි වැඩ සිටි සේක. එ සේ ම දකුණු දිග, ධර්මරක්ෂිත නම් මහ තෙර කෙනකුන් වහන්සේ ධර්මරක්ෂිත නම් ඇති පන්සියයක් රහතුන් හැර ගෙන දකුණු දිග වැඩ සිටි සේක. සඞ්ඝරක්ෂිත නම් මහ තෙර කෙනකුන් වහන්සේ සඞ්ඝරක්ෂිත නම් ඇති පන්සියයක රහතන් වහන්සේ පිරිවරා ගෙන බස්නාහිරි දිශාවෙ හි වැඩ සිටි සේක. ආනන්ද නම් මහ තෙර කෙනකුන් වහන්සේ තමන් වහන්සේගේ නමින් ආනන්ද නම් ඇති පන්සියයක් රහතන් වහන්සේ පිරිවරා උතුරු දිග වැඩ සිටි සේක. පියදස්සි නම් මහ තෙර කෙනකුන් වහන්සේ තමන් වහන්සේගේ නමින් පියදස්සි නම් පන්සියයක් රහතුන් වහන්සේ හැර ගෙන ඊසාන කොණයෙ හි වැඩ සිටි සේක. මෙ සේ බුද්ධරක්ෂිත ධර්ම රක්ෂිත සංඝරක්ෂිත ආනන්ද යන මෙ කී තෙරවරුන් වහන්සෙ නැඟෙනහිර දකුණු දිග බටහිර උතුරු දිග වැඩ සිටි සේක.

සඟමැදට වදනා වූ දුටුගැමුණු මහ රජ, "මා මේ කරන දාගබ කර්මාන්ත අන්තරායක් නැති ව නිෂ්ඨාවට යේ නම් මේ මේ දිග මේ මේ නම් ඇති දෙනා වහන්සේ සිටිනා සේක්ව" යි රජ්ජුරුවෝ සිතූ සේක. ඒ සිතූ සැටියේ ම විය.

ඉන්දගුත්ත නම් මහ තෙර කෙනකුන් වහන්සේ රජ්ජුරුවන් ගේ අභිය දැන එ ලෙස ම සිටවූ සේක. නැවත සිද්ධාර්ථ නම් තෙර කෙනකුන් වහන්සේ ය, මඞ්ගල නම් තෙර කෙනකුන් වහන්සේ ය. පදුම නම් තෙර කෙනකුන් වහන්සේ ය, සීවලී නම් තෙර කෙනකුන් වහන්සේ ය, චන්දගුත්ත නම් තෙර කෙනකුන් වහන්සේ ය, සුරියගුත්ත නම් තෙර කෙනකුන් වහන්සේ ය, ඉන්දගුත්ත නම් තෙර කෙනකුන් වහන්සේ ය, සාගර නම් තෙර කෙනකුන් වහන්සේ ය, චිත්ත සෙන නම් තෙර කෙනකුන් වහන්සේ ය, ජයසෙන නම් තෙර කෙනකුන් වහන්සේ ය, අචල නම් තෙර කෙනකුන් වහන්සේ ය යන මෙ කී එකොළොස් දෙනා වහන්සේ තම තමන් වහන්සේ ගේ භික්ෂූන් වහන්සේ පිරි වරන ලදුව පුන් කලස ඉදිරි කොට නැඟෙනහිරට අභිමුඛ ව වැඩ සිටි සේක.

## දා ගැබෙ හි ප්‍රමාණය ගත් සැටි

ඉක්බිති දුටුගැමුණු මහ රජ එ ලෙස සිටි සංඝයා වහන්සේ දැක ප්‍රසන්න වූ සිත් ඇත්තේ සුවඳ මල් ආදියෙන් පූජා කොට පැදකුණු කොට සතර තෙනක බිම බැස හෙව වැඳ පුන් කලස තුබූ තෙනට වැද රන් කීලයෙහි බහාලන ලද රිදීමය සිසාරා ඇවිදිනා රියන් දණ්ඩ, ජීවත්ව පවත්නා මවු පියන් ඇති, මවු පක්ෂ පිය පක්ෂයෙන් මනා ව කුලජ වූ, සැරහුණා වූ අගි මඞ්ගල සම්මත වූ, අමාත්‍යක පුත්‍රයකු ලවා රිදී දණ්ඩ ගන්වා දාගබ වට මහත් කරනු පිණිස පටන් ගත. ඒ ලෙස මහත් කොට කරන්ට පටන් ගන්නා වේලෙහි සිද්ධාර්ථ නම් මහ තෙර කෙනකුන් වහන්සේ වැලකූ සේක. කුමක් නිසා ද යත්,

ඒ තෙරුන් වහන්සේට මෙ සේ වූ සිතෙක් උපන. 'ඉදින් මේ රජ දාගබ මහත් කොට කරවන්නේ වී නම්, නො නිමෙන තෙක් ම මියන්නේ ය. නැවත මහා විශාල කොට බැඳි කල මතු පරිහරණයට කොට ගන්ට බැරි ය" යි සිතා වලකා වදාළ සේක. ඒ ක්ෂණයෙ හි මහා සඞ්ඝයා වහන්සේ "දෙවයෙනි, තෙරුන් වහන්සේ මහානුභාව ඇති සේක. එ සේ හෙයින් තෙරුන් වහන්සේ වදාළ බස් ගිවිස වදාළ මැනවැ" යි වදාළ සේක. දුටුගැමුණු මහ රජ්ජුරුවෝ මහා සංඝයා වහන්සේගේ අභිප්‍රාය දැන, "ස්වාමීනි, වැලිකෙබඳු ප්‍රමාණයෙක කෙරෙම් දැ" යි කි ය. ඒ සිද්ධාර්ථ නම් මහ තෙරුන් වහන්සේ වදාරන සේක්, "මහරජ මා ගියා වූ ස්ථානයේ වට දාගබට ගන්ව" යි වදාළ සේක. තෙරුන් වහන්සේ නික්මුණු මහ ම දාගබ වට හඳවා තෙරුන් වහන්සේ සමීපයට ගොස් ඔබගේ ශ්‍රී පාදය වැඳ "ස්වාමිනි, නුඹ වහන්සේ කිනම් සේක් දැ" යි විචාරා, "සිද්ධාර්ථ නම් ය" යි වදාළ බස් ඇසූ දුටු ගැමුණු මහ රජ්ජුරුවෝ, "මේ මා බඳවන දාගබ මට සිද්ධ වේ ය" යි සතුටුව ඔබට ගන්ධ මාලාදින් පූජා කොට තෙරුන් වහන්සේ වැඳ ඔබ පිරිවරා සිටි සෙසු එකොළොස් තෙරුන් වහන්සේ ද සමීපයට ගොස් ඔබ ගේ ශ්‍රී පාදය වැඳ සුවඳින් මලින් පුදා එකොළොස් දෙනා වහන්සේ ගේ ද නම් විචාරා දාගබ වට සිසාර ඇවිද රිදී දණ්ඩ අල්වා ගෙන සිටි අමාත්‍ය පුත්‍රයාගෙන්, "තෝ කිනම් දැ" යි විචාළ හ. ඒ අමාත්‍ය පුත්‍රයා ද "දේවයන් වහන්ස, මම සුප්‍රේතිෂ්ඨික නම් බමුණෙක්මී" කී ය. "තොප ගේ පියාණෝ කිනම්හු දැ" යි විචාළ හ. "ස්වාමීනි, මාගේ පියාණෝ නන්දිසෙනයෝ ය" යි කි ය. "තොප ගේ මෑණියෝ කිනම්හු දැ" යි විචාළ හ. "සුමනාදේවී ය" යි කි ය. එ බස් ඇසූ දුටුගැමුණු මහ රජ සියල්ලවුන් ගේ ම නම් අභිමඞ්ගලය යි සිතා සතුටු ව, "මා විසින් කරවන මේ දාගබ කර්මාන්තය අවශ්‍යාවයෙන් ම මට නිෂ්ඨාවට යන්නේ ය" යි සතුටු විය.

## මඟුල් උළු පිහිටුවීම

ඉක්බිති ඒ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ සතුටු ව මධ්‍යයෙ රන් කළ අටක් ද රිදී කළ අටක් ද තබ්බවා ඒ කළ පිරවරා අටෝරාසියක් පූර්ණ සට තැබ්බවූ ය. ඉක්බිති රන් උළු අටක් ද තබා එකි රන් හුළක් පිරිවරා අටෝරාසියක් අටෝරාසියක් රිදී උළු තබ්බවා එකි එකී රන් හුළකට අටෝරාසියක් අටෝ රාසියක් පිළී තැබ්බ වූ හ. නැවත සුප්‍රතිෂ්ඨිත නම් අමාත්‍ය පුත්‍රයා ලවා එක රන් හුළක් ගන්වා ඒ අමාත්‍ය පුත්‍රයා හා සදෘශ වූ නම් ඇති ජීවත් ව පවත්නා වූ මවුපියන් ඇති අනික් අමාත්‍ය පුත්‍රයන් සත් දෙනකු ලවා අනික් රන් උළු සත ගන්වා මඟුල් උළු ඔබන්නට නික්මුණු ඒ ක්ෂණයෙ හි චිත්තසෙන නම් තෙර කෙනෙකුන් වහන්සේ නැගෙනහිරි දිසාවේ වට ඇදි රේඛා ඇති බිම් සුවඳ පිඬක් තබා වදාළ සේක. ජයසෙන නම් තෙර කෙනකුන් වහන්සේ ඒ සුවඳ පිඬ පිට පැන් ඉස අතින් ඒ සුවඳ පිඬ හනා වදාළ සේක. සුප්‍රතිෂ්ඨිත නම් බමුණු ද යහපත් යොග ලද උතුරුසළ නකතින් මහත් වූ පූජා සත්කාරයෙන් මඟුල් උළු පිහිටවිය. සුමන නම් මහ තෙර කෙනකුන් වහන්සේ දෑ සමන් මලින් එතැන පුදා වදාළ සේක. ඒ ඇසිල්ලෙහි දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් බොල ඇති මහ පොළොව ගුගුරා පැන නැංගේ ය. මෙ ම ක්‍රමයෙන් තෙසු සත් හුළ ද පිහිටුවූ හ. ඉක්බිති දුටුගැමුණු මහ රජ රිදි උළු අටක් ද පිහිටුවා සුවඳින් මලින් පූජා කොට මඟුල් විධාන කොට නිමවි ය.

නැවත ඒ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ පූජා විධාන කෙළවර රන් පෙට්ටියෙන් මල් ගෙන්වාගෙන නැගෙනහිරි දිසාවෙ හි භික්ෂු සඞ්ඝයා වහන්සේට අභිමුඛයෙ හි වැඩ සිටි මහාබුද්ධරක්ෂිත නම් තෙරුන් වහන්සේ සමීපයට ගොස් සුවඳ මල් ආදියෙන් ඔබට පූජා කොට වැඳ ඒ තෙරුන් වහන්සේ ගේ නම් ද ඔබ පිරිවරා සිටි පන්සියයක් තෙරුන් වහන්සේ ගේ නම් ද විචාරා, දෙවෙනි වූ දකුණු දිග සිටි මහා ධර්මරක්ෂිත නම් තෙරුන් වහන්සේ ද බස්නා හිර දිසාවෙහි සිටි මහාසඞ්ඝරක්ෂිත නම් තෙරුන් වහන්සේ ද උතුරු දිග වැඩ සිටි ආනන්ද නම් මහ තෙරුන් වහන්සේ ද සමීපයට එළඹ සුවඳ මල් ආදියෙන් පූජා කොට ඔබගේ නම් ද විචාරා ඔබ සමීපයෙ හි රජ්ජුරුවෝ සිටියා හ. එ සේ සිටි රජ්ජුරුවන්ට පියදස්සී නම් මහ තෙරුවන් වහන්සේ ඒ මඟුල් උළු එබූ දවස් රජ්ජුරුවන් ඇතුළු වූ සිවුවනක් පර්ෂදට මියුරු වූ ධර්ම දෙශනා කොට වදාළ සේක. ඔබ ගේ ධර්ම දේශනාව අසා ගිහිගෙන් සතලිස් දහසක් පුරුෂයෝ සිවුපිළිසිඹියා පත් රහත් බවට පැමිණියා හ. නැවත සතලිස් දහසක් පුරුෂයෝ යෙළ දහසක් කෙලෙසුන් නසා දහසක් නයින් හෙබියා වූ සෝවාන් ඵලයට පැමිණියා හ. නැවත දහසක් දෙන සකෘදාගාමි ඵලයෙ හි පිහිටියා හ. දහසක් දෙන අනාගාමි ඵලයෙ හි පිහිටියා හ. භික්ෂුන් වහන්සේ කෙරෙන් අටලොස් දහසක් දෙනා වහන්සේ රහත් බවට පැමිණි සේක. භික්ෂුණින්ගෙන් තුදුස් දහසක් මෙහෙණින්නෝ රහත් වූ සේක.

ථූපාරම්භ කථාව නිමි.

## සත් දවසක් මහ දන් දීම

ඉක්බිති දුටුගැමුණු මහ රජ්ජුරුවෝ භික්ෂූන් වහන්සේ වැඳ "ස්වාමීනි, යම් දවසෙක මාගේ මේ දාගබ බැඳ නිමා ද, ඒතාක් මේ සයානු කෙළක් රහතුන් වහන්සේට ද ගණන් නැති පෘථග්ජන භික්ෂු සංඝයා වහන්සේට ද සිවු පසයෙන් උපස්ථාන කෙරෙමි" යි ආරාධනා කළ හ. එබස් ඇසූ මහා සඞ්ඝයා වහන්සේ නො ඉවසා වදාළ සේක. "එ සේ වීනම් සත් අවුරුද්දකට ඉවසුව මැනවැ" යි ආරාධනා කොට මෙ ම ක්‍රමයෙන් පිරිහෙළා සත් දවසකට අවසර ලදින් පවරා දාගබ බඳිනා තන් හි වට කොට හාත්පසින් අටළොස් තෙනක මඩු ලවා මහා සංඝයා වහන්සේ වඩා හිඳුවා සද්දවසක් මහ දන් දී ඒ සියලු මහා සංඝයා වහන්සේට තෙල් මී උක්සකුරු පා සිවුරු බෙහෙත් ආදිය දන් දෙවූ හ.

## උළුවඩුවන් රැස් කරවීම

ඉක්බිති නුවර වැද උළු වඩුවන් රැස් වන පිණිස ලැවූ බෙර වාසගම් අසා පන්සියයක් පමණ උළු වඩුවන් රැස් වූ කල ඔවුන් අතුරෙන් එක් උළු වඩුවෙක් "මම රජ්ජුරුවන් සිත් ගෙන දාගබ බඳිනට පොහොසත්මි" යි කියා ගොස් රජ්ජුරුවන් දිට. 'එවේලෙ හි රජ්ජුරුවෝ "දරුව, කෙසේ දාගබ බඳු දැ" යි විචාළා හ. "ස්වාමීනි, මම අතවැස්සන් සියයක් දෙනා හැරගෙන දවසෙක මෙහෙයට පස් යාළෙක කර්මාන්ත කෙරෙමි" යි දැන් වී ය. එ බස් ඇසූ රජ්ජුරුවෝ "දරුව, එ සේ කල මා ගේ දාගබ පස් ගොඩ වන්නේ ය. තණගස් ආදිය අටගන්නේ ය. බොහෝ කාලයක් නො පවත්නේ ය. එ සේ හෙයින් දාගබ බැඳිම තෝපට නො පිළිවනැ" යි ඔහු අළහ. ඔහු එතැනින් පහ වූ කල් හි අනික් උළු වඩුවෙක් වැඳ සිට "මම, දේවයන් වහන්ස, මෙහෙකරුවන් සියයක් දෙනා හැරගෙන දවසකට පස් දස මුණෙක කර්මාන්ත කෙරෙමි" යි දැන් වී ය. ඔහු ද නො කැමැති ව අළ හ. අනික් උළු වඩුවෙක් වැඳ සිට "දේවයන් වහන්ස, මම මෙහෙකරුවන් සියක් දෙනා හැරගෙන පස් පසමුණක කර්මාන්ත කෙරෙමි" යි දැන්වී ය. එ වේලෙ හි ඔහු ද හළ කල අනික් උළු වඩුවෙක් රජ්ජුරුවන් වැඳ සිට "දවසකට පස් දැමුණක් ගෙන කර්මාන්ත කෙරෙමි" යි දැන්වී ය. ඔහු ගේ ද බස් නො ගිවිස සිටි කල් හි අනික් නුවණැති උපායවත් බාල උළු වඩුවෙක් අවුත් රජ්ජුරුවන් වැඳ සිට "ස්වාමීනි, මම දවසකට පස් අමුණක් ගෙන වන ලා කොටා ඒ පස් කුල්ලේ ලා සලා ඒ සැලූ පස් දාගල ලා අඹරා එ සේ ගත් පසින් එක් දවසක් කර්මාන්ත කෙරෙමි" යි දැන්වී ය. එ බස් ඇසූ ගැමුණු රජ්ජුරුවෝ සතුටු ව "දරුව, එ සේ කල මාගේ දාගබ තණ ගස් නො නැහෙන්නේ ය. බොහෝ දවසක් පවත්නේ ය" යි කියා ඔහුගේ බස් ගිවිස නැවත රජ්ජුරුවෝ "දරුව, කවර සැටියේ දාගබ බදුදැ" යි විචාළ හ. ඒ වේලෙ හි විශ්වකර්ම දිව්‍යපුත්‍රයා වඩුවා ඇග ආවේශ ව රන් තලියක් ගෙන්වා ගෙන පැනින් පුරා අතින් පැන් ගෙන තලියේ පැන් පිට ගැසී ය. ඒ ක්ෂණයෙ හි දැවාණ වටක් මෙන් මහත් දිය බුබුළෙක් පැන නැංගේ ය. එවිට වඩු කියන්නේ "දෙවයන් වහන්ස, මේ දිය බුබුළ සැටියේ දාගබ වට ගෙන බඳිමි" යි දැන්වී ය. එ බස් ඇසූ ගැමුණු රජ්ජුරුවෝ විශේෂයෙන් සතුටු ව "යහපතැ" යි ගිවිස ඔහට දහසක් මිල වටනා පිළි සහළක් ද නැවත දහසක් වටනා පූර්ණක නම් ස්වර්ණාභරණයක් ද දහසක් අගනා රන් මිරිවැඩි සහළක් ද දොළොස් දහසක් මසුරන් ද දී ඔහට සුදුසු තෙනින් මාහැඟි ගෙයක් ද මාහැඟි කුඹුරක් ද යන මෙ කී සියල්ලෙන් ඕහට ප්‍රසාද දී ගෙට යවා නැවත රජ්ජුරුවෝ රාත්‍රීභාගයෙ හි මෙ සේ සිතූ හ. "කෙ සේ මම මිනිසුන්ට දුක් නො දි මහ සෑය බඳින්ට උළු ගෙන්වා ගනිම් දෝ හො" යි සිතූ හ.

ඉක්බිති දෙවතාවෝ රජ්ජුරුවන් සිතූ සිත් දැන දාගබ බැඳීමට දාගබ සතර වාසන එක එකී දවසට සෑහෙන විවර උළු ගෙනවුත් තුබූ හ. ඒ රෑ පාන් ව ගිය කල මිනිස්සු උළු සතර ගොඩ දැක රජ්ජුරුවන්ට ගොස් දැන්වූ

හ. එබස් ඇසූ දුටුගැමුණු රජ වඩුවා කර්මාන්තයෙ හි පටන් ගැන්වී ය. දෙවතාවෝ මෙ ම ක්‍රමයෙන් යම්තාක් දාගබ බැඳ නිමා ද, ඒ තාක් එක එකී දවසට සෑහෙන විවර උළු ගෙනවුත් දෙව්යෝ තබන්නා හ. සියලු දවස් මුළුල්ලෙ හි කර්මාන්ත කළ ස්ථානයෙ හි මැටි වේ ව යි උළුපොඩි වේ ව යි නො පෙනෙන නියායෙන් රාත්‍රියෙ හි දෙවතාවෝ ම අන්තර්ධාන කර්න්නා හ. ඉක්බිති රජ්ජුරුවෝ කර්මාන්ත කරන සියලු පර්ෂදට මිල පිණිස වාසල් දොරකඩ සොළොස් දහසක් රන් ද පිළී සම්බඩම් ද ආභරණ ද සුවඳ ද පලඳනා ද මල් ද තෙල් මී සකුරු උක් කෙහෙල් වැලවරකා කසපැන් මෙ ආදිය ද ලුණු මිරිස් ඉඟුරු දුරු අබ ද යන මෙකී සියල්ල ම මෙ ම ක්‍රමයෙන් සතර වාසල් දොර රැස් කරවූ හ. නැවත අනෙකප්‍රකාර රසමසවුලෙන් යුක්ත වූ කැඳ බත් අවුලු පත් ආදිය ද සිහිල් මිහිරි සුවඳ පැන් ද තැබ්බවූ හ. කපුරු කිතුල් ලමහ නාරහ ඉඟුරු යුක්ත වූ පස්පලවතින් බුලත් ද තබ්බවා "මේ මාගේ දාගැබෙ හි කර්මාන්ත කරන ගිහීන්වත් තපස්වීන් වහන්සේ වත් සිත් වූ පරිද්දෙන් මෙකී සියල්ල අනුභව කොට කළ කර්මාන්තයෙ හි මිල මාගෙන් තො ගෙන නො යෙත් ව" යි කියා මෙලෙස විධාන කොට තැබ්බූ හ.

## දාගැබ් කර්මාන්තයට සහභාගිවීමට ගිය තෙර නමක්

ඉක්බිති එක් තෙර කෙනකුන් වහන්සේ රජ්ජුරුවන් ගේ දාගබ කර්මාන්තයෙ හි එක් ව ගන්නා කැමැති සේක් දාගබ කර්මාන්ත කරන මැටි හා සදෘශ කොට කළ මැටි පිඩක් එක් අතකින් ගෙන අනික් අතින් මල් මිටියක් ගෙන දාගබට නැගී රජ්ජුරුවන්ගේ දාගබ මෙහෙ කරන්නවුන් වඤ්චා කොට වඩුවාට දී වදාළ සේක. ඒ වඩුවා ද මැටිපිඩ ගන්නේ "මා මෙතෙක් දා මෙහෙයට ගන්නා මැටි සේ නො වේ" යි දැන තෙරුන් වහන්සේ මුහුණ බලා ඒ වේලෙ හි ඔබ ගේ අදෝනාකම් දැක මැටිපිඩ කර්මාන්ත කෙළේ ය. එ සේ වුව ද මැටිපිඩ වඤ්චා ව ගිය නියාව කොලාහලව ගියේ ය. ඒ කොලා හලය රජ්ජුරුවෝ අසා ඒ ස්ථානයට අවුත් වඩුවා විචාරන්නාහු "කොළ, තට එක් තෙර කෙනකුන් වහන්සේ මිල නො ගෙන මැටි පිඩක් මාගේ දාගබ මෙහෙයට දුන් සේක් දැ" යි විචාළා හ. එ සේ විචාළ රජ්ජුරුවන්ට වඩුවා කියන්නේ "ස්වාමීනි, බොහෝ ආර්යයන් වහන්සේ එක් අතකින් මල් හා එක් අතකින් මැටිපිඩක් බැගින් ගෙනහැර දෙන සේක. එ සේ හෙයින් මම නො දන්නෙම් මැටි පිඩ කර්මාන්ත කෙළෙම්. මුන් වහන්සේ ආගන්තුක සේක. මුන්වහන්සේ නේවාසික සේකැ යි මෙ පමණක් දනිමි" යි දැන්විය. රජ්ජුරුවෝ ද "එ සේ වී නම් දරුව, තොපට මැටි පිඩ දුන් තෙරුන් වහන්සේ මුන් වහන්සේ ය යි කියා මොහුට පෑ ලව" යි කියා මාලු බලතකු වඩුවා සමීපයෙ හි සිටවූ හ. එම වඩු ද දෙවෙනි දවස් මැටිපිඩ දුන් තෙරුන් වහන්සේ දාගබ බඳිනා ස්ථානයට වැඩි ගමනේ 'මැටි පිඩ දුන් සේක් මුන් වහන්සේ ය" යි බලතාට පෑයේ ය.

ඒ වේලෙ හි බලතා ද උන්වහන්සේ හැඳිනගෙන රජ්ජුරුවන් සමීපයට ගොස් "ස්වාමීනි, මිල නො ගෙන දාගබට මැටිපිඩ ලූ තෙරුන් වහන්සේ හැඳින ගතිමි" යි දැන්වී ය. ඉක්බිති ඒ පවත් ඇසූ රජ්ජුරුවෝ ඒ බලතාට කියන්නාහු "දරුව" මාගෙන් දෙන ලද දෑසමන් කැකුළු යෙළයාළ තෙපි ගෙන්වා ගෙන ගොස් බොධි මළුවේ ගොඩ කොට සුවඳ පිඩක් තබා බොධි මළුවට උන් වහන්සේ වැඩි කල තොපි ගොස් ඔබගේ ශ්‍රි පාදය වැඳ දෙවයි" කියා බලතාට දුන් හ. එ විට බලතා ඒ මල් හා සුවඳ ගෙන ගොස් "ස්වාමීනි, ආගන්තුක ව වැඩි තෙරුන් වහන්සේ පුදනු පිණිස රජ්ජුරුවන් වහන්සේ දුන් සුවඳ මලැ" යි දැන්වී ය. ඒ පවත් ඇසූ තෙරුන් වහන්සේ සතුටු ව මල සුන් සෝධා එවූ සුවඳින් පිරිබඩ ගෙන මල් පුදා සතර තෙනක සිට පැදකුණු කොට වැඳ නැඟෙනහිරි දොරටුයෙ හි සිට ඇති උපදවා මල් පූජාව බල බලා වැඩ සිටි සේක. ඒ වේලෙ හි බලතා ද තෙරුන් වහන්සේ සමීපයට ගොස් ඔබ ගේ ශ්‍රී පාදය වැඳ ගෙන සිට දන්වන්නේ

"ස්වාමීනි, නුඹවහන්සේ රජ්ජුරුවන්ගේ දාගබෙහි මිල නො ගෙන පින් පිණිස ලූ මැටි පිඩට මිල පිණිස එවූ සුවඳ හා දෑසමන් මල් යෙළයාළක් බව දැන වදාළ මැනවැ" යි කියා නැවත "රජ්ජුරුවන් ගේ වැඳීමෙන් වඳිමි" යි කියා වැන්දේ ය. එ බස් ඇසූ තෙරුන් වහන්සේ නො සතුටු වූ සේක් "මා දුකින් කොට ගත් පින්කම කුමට නැසී දැ" යි වදාළ සේක. එ වේලෙ හි එබස් ඇසූ බලතා ද "ස්වාමීනි, එ සේ නො සිතා වදාළ මැනව. දෑසමන් කැකුළු යෙළයාළක් තබා එ පමණ රන් මල් රජ්ජුරුවෝ දුන්නේ වූ නමුත් නුඹ වහන්සේ දාගබ බඳිනට දුන් මැටි පිඩ නො අගනේ ය. ස්වාමීනි, සිත පහදවා වදාළ මැනවැ" යි දන්වා ගියේ ය.

## තවත් තෙර නමක්

නැවත කොටසර පියන්ගලු විහාරයෙ හි වැඩ වසන එක් තෙර කෙනකුන් වහන්සේ දාගබ බඳිනා උළු වඩුවාට කුලුපග සේක. එ සේ හෙයින් ඒ තෙරුන් වහන්සේ ද නුවරට අවුත් වඩුවාණන් හා කථා කොට දාගබ බඳිනා උළෙ හි දිග බොල පළල මැනගෙන ගොස් තමන් වහන්සේ සිය අතින් සකස් කොට මැටි මැඩ බොරලු හැර සකස් කොට මැටි ඉදි කොට උළු කපා ඒ උළු වියළා පලහා පාත්‍රයේ ලා ගෙන නුවරට අවුත් දෙවෙනි දවස් එක් අතකින් රජ්ජුරුවන් ගේ උළක් ද එක් අතකින් මල් මිටියක් ද ගෙන තමන් වහන්සේගේ උළ හා එක් කොට රජ්ජුරුවන් ගේ උළ දි වදාළ සේක. වඩුවා උළු ඇරගෙන කර්මාන්ත කෙළේ ය. එ වේලෙ හි තෙරුන් වහන්සේ ද සොම්නසට පැමිණ "මහ දාගබ කර්මාන්තයෙ හි එක් ව ගතිමි" සිතමින් උළුහල් පිරිවෙනට වැඩ වදාළ සේක. ඉක්බිති උන්වහන්සේ ඒ කළක්‍රියාව රජ්ජුරුවන්ට සැළ ව ගියේ ය. රජ්ජුරුවෝ එ පවත් අසා වඩුවා අතින් විචාළ හ. "කොළ, එක් තෙර කෙනකුන් වහන්සේ මාගෙන් මිල නො ගෙන උළක් මාගේ දාගබෙ හි ලද දැ" යි විචාළ කල් හි "සැබව, දෙවයන් වහන්ස, එක් තෙර කෙනකුන් වහන්සේ දුන් උළක් අපගේ උළු හා එක්වැනි හෙයින් කර්මාන්තයෙ හි ලා පිමි" යි දැන්වී ය. "එ සෙ වීනම් උන් වහන්සේ ලූ අළ හඳුනෙයි දැ" යි රජ්ජුරුවෝ විචාළ හ. වඩුවා ද එබස් අසා තෙරුන් වහන්සේ කෙරෙහි මෛත්‍රී හෙයින් "ස්වාමිනි, උළ නො හඳුනමි" යි කී ය. "ඉදින් තෝ හුළ නො හඳුනෙයි නම් උළ ලූ තෙරුන් වහන්සේ මේ බලතාට පෑ ලව" යි කියා බලතකු වඩුවා සමීපයෙහි සිටවූ හ. ඒ උළු වඩුවා ද පෙර මැටිපිඩ ලූ තෙරුන් වහන්සේ මෙන්ම බලතාට උළ ලූ තෙරුන් වහන්සේ පෑයේ ය. එ වේලෙ හි බලතා ද තෙරුන් වහන්සේ හැඳින ගෙන ඔබ වසන උළුහල් පිරිවෙනට ගොස් ඔබ ගේ ශ්‍රී පාදය වැඳ එකත්පස් ව හිඳ පිළිසඳර කථා කොට "ස්වාමීනි, නුඹ වහන්සේ ආගන්තුක සේක් ද? නොහොත් නේවාසික සේක දැ" යි විචාළේ ය. ඒවේලෙ හි තෙරුන් වහන්සේ "උපාසකය, අපි ආගන්තුකයම් හ" යි වදාළ සේක. "ස්වාමිනි, කවර රටක වසන සේක් දැ" යි විචාළ බලතාට වදාරන සේක් "කොටසර පියන්ගලු විහාරයෙ හි වසම් හ, උපාසකය" යි වදාළ සේක. එ බස් ඇසූ උපාසක "ස්වාමිනි, මෙ හි ම වැඩ හිඳිනා සේක් ද? නොහොත් කොටසර වඩනා සේක් දැ" යි විචාළා ය. "මෙ හි නො වසම් හ. අසවල් දවස් යම් හ" යි වදාළ සේක. එබස් ඇසූ බලත් "ස්වාමිනි, මහලූ මම ත් නුඹවහන්සේ කැටිව එමි. මාගේ ගම ද එම කොටසර අසෝගම ය" යි තෙරුන් වහන්සේට දැන්වී ය. තෙරුන් වහන්සේ ද "යහපත, උපාසකය, කැටිව යම්හ" යි වදාළ සේක. ඉක්බිති ඒ බලත් මහලු එපවත් රජ්ජුරුවන්ට ගොස් දැන්වී ය. රජ්ජුරුවෝ ද එපවත් අසා බලතාට මසුරන් දහසක් වටනා පිළී සඟළක් ද දහසක් අගනා මැහැඟි පලසක් ද වහන් සඟළක් ද සුවඳ තෙල් පිරූ තෙල් කුලාවක් ද පත් කුඩයක් ද සෙසු ශ්‍රරකමණ පරිෂ්කාර ද නො මිලයේ උළ ලූ තෙරුන් වහන්සේට මිල පිණිස දෙව" යි කියා බලතාට දුන්හ. ඉක්බිති ඒ බලතා ද රජ්ජුරුවන් විසින් දෙන ලද ඒ පිරිකර ඇරගෙන ඒ තෙරුන් වහන්සේ වැඩ හුන් උළුහල් පිරිවෙනට ගොස් තෙරුන් වහන්සේ වැඳ ඔබ හා සමග ඒ රාත්‍රිසයෙහි වැස උදෑසන ඔබ හා කැටිව නික්ම ක්‍රමයෙන් මහ ගෙවා කොට සර ගොස් පියන්ගලු විහාරය පෙනෙන ස්ථානයෙහි සිහිල් සෙවණ ඇති එාසු තෙනක වඩා හඳුන්වා ඔබ ගේ ශ්‍රී පාදය සෝධා සුවඳ තෙලින් ශ්‍රී පාදය මැඩ උක් සකුරු වළඳවා සිහිල් පැන් වළඳවා වහන් සහළ ඔබ ගේ ශ්‍රී පාදයෙ හි ලා

"ස්වාමීනි, මේ පිරිකර මාගේ අඳුනන තෙර කෙනකුන් වහන්සේ නිසා ගන්නා ලද. දැන් නුඹ වහන්සේට මේ පිරිකර දෙමි. මේ පිළි සහළ ද මා ගේ පුතණුවන් සරණ හිඳුවන මඟුල් නිසා ගන්නා ලද. මෙයිනුදු නුඹ වහන්සේට සිවුරක් කොට වදාළ මැනවැ" යි දන්වා තෙරුන් වහ්නසේ ගේ පාමුල තැබී ය. තෙරුන් වහන්සේ ඒ පිළි සහළ ද මාහැඟි පලස ද පාත්‍රයේ ලා ගෙන සෙසු පිරිකර පොදියක් කොට බැඳගෙන වහන් සහළ පය ලා ගෙන පත් කුඩය හිසට කොට ගෙන සැරයටිය අතින් ගෙන මහ නික්ම වදාළ සේක. ඒ වේලෙ හි බලතා තෙරුන් වහන්සේ හා කැටිව මඳක් තැන් ගොස් "ස්වාමීනි, මඳක් වැඩි සිට වදාළ මැනව. මේ මා යන මඟ ය" යි දන්වා පෙර මැටිපිඩ ලූ තෙරුන් වහන්සේට දැන්වූ ලෙස ම රජ්ජුරුවන්ගෙන් කියා එවූ තෙපුල් තෙරුන් වහ්නසේට දැන්වී ය. එ වේලෙ හි තෙරුන් වහන්සේ ද ඒ බලතා ගේ බස් අසා මහත් වූ ශොකයෙන් කම්පාව "මේ නිසා වූ ආශ්චර්යමත් දාගබෙක මා විසින් දුකින් කරන ලද කුශල කර්මය නො කළා නම් වෙයි" දොම්නස් ව දෙ ඇසින් කඳුළු ධාරා වගුරුවා "ඇයි උපාසකය, මා දුකින් කළ කුශලය කුමකට නාසා පි ද? තාගේ පිරිකර තෝ ම ඇරගනැ" යි කියා සියලු පිරිකර දමාපු සේක. එ සේ පිරිකර දමා වැඩ සිටි තෙරුන් වහන්සේට ඒ කාරණ දන්නා උපායවත් බලත් මහලු මෙ සේ දන්විය, "ස්වාමීනි, නුඹ වහන්සේ කුමක් වදාරන සේක් ද? මේ දුටුගැමුණු රජ පින්කම කළ ලොභයෙන් මෙ සේ කරන බව මුත් නුඹ වහන්සේ ලූ උළට මිල දෙමි යි කියා අකනිටාබ්‍රහ්ම ලෝකය දක්වා තුන් සිවුරු පාත්‍ර දුන්නේ වී නමුදු නුඹ වහන්සේ ලූ උළ හා සරි කරන්නට නො පිළිවන. එ සේ හෙයින් නුඹ වහන්සේ ලූ උළ නුඹ වහන්සේට ම පින. රජ්ජුරුවන් දෙවූ පිරිකර රජ්ජුරුවන්ට පිනැ" යි කියා තෙරුන් වහන්සේ අස්වසා සියලු පිරිකර තෙරුන් වහන්සේට ම දී ඔබ ගේ ශ්‍රී පාදය වැඳ සමු ගෙන පෙරළා නුවරට ම නැඟී ගියේ ය.

මෙ සේ මේ දාගැබෙ හි යම් කෙනෙක් බැළමෙහෙ කොට සිත් පහදවා ඒ කුසලින් දිව්‍ය ලෝකයෙ හි උපන් ඒ සත්වයෝ මෙතෙකැ යි ගණන් නැත. එ සමයෙ හි තවුතිසා දෙවුලොවෙ හි උපන් දිව්‍ය ස්ත්‍රියක් තමා ගේ අසාධාරණ වූ දිව්‍ය සම්පත් බලා සතුටු ව "මනුෂ්‍ය ලෝකයෙ හි දී කවර පින්කම් කොට මේ සම්පත මා ලද්දේ ය" යි බලන්නී, "ගිය දවස දුටුගැමුණු රජ්ජුරුවන් ගේ රුවන්වැලි දාගබෙ හි බැලමෙහෙ කොට සිත් පහදවා මෙබඳු වූ සම්පතක් ලත් කල, යම් කෙනෙක් අනුන් සන්තක දෙයක් නො ගෙන තමන් සන්තක දෙයින් පරලෝ අදහා කළ සුචරිත, පින්කම විපාක කෙබඳු දෝ හෝ" යි සිතා සතුටු ව එ වේලෙ හි ඒ දේවතා දු දිව සුවඳ දිව මල් දිව පිළි ගෙනහැර ඒ රාත්‍රියෙ හි ම අවුත් ගෙනා සුවඳින් ඒ දාගබ පිරිබඩ ගෙන සුවද මල් ඒ රුවන්වැලි දාගබට පුදා සතුටින් වැඳ වැඳ සිටියා හ.

එ වේලෙ හි බැලවක වැඩ වසන මහාසීවලි නම් එක් තෙර කෙනකුන් වහන්සේ රජ්ජුරුවන් බඳවන රුවන්වැලි දාගබ වඳිනා පිණිස ගිය සේක් වඳිනා ඒ දිව්‍ය ස්ත්‍රිය දැක මහ රුක්අත්තන ගස මුල් වැඩ සිටි සේක. ඒ දිව්‍ය ස්ත්‍රිය අභිප්‍රාය වූ පරිද්දෙන් වැඳ නික්මුණු වේලෙ හි විචාරන තෙරුන් වහන්සේ දිව්‍ය ස්ත්‍රිය අතින් මෙ සේ විචාළ සේක. කෙ සේ ද යත්, "තොප ගේ ශරීරාලොකයෙන් මේ සියලු ලඞ්කාද්වීපය හිරු දහස් සඳ දහස් නැංගා සේ එකාලොක විය. මෙ සේ වූ රූප සම්පත්තියක් ලබන්ට ගිය ජාතියෙහි කවර පින් කමක් කළාදැ" යි විචාළ සේක. "ස්වාමීනි, අප සන්තක දෙයින් කළ කුසලයෙක් නැත. මේ දාගැබට අප සිත පහදවා ගෙන බැලමෙහෙ කොට එයින් ලද සම්පතැ" යි දැන්වූ හ. මෙ සේ බුදු සස්නෙ හි පහන් සිතින් මිලයට කළ කුසල් පවා මහාඵල මහානිසංස වෙයි. එ සේ හෙයින් මාගේ ස්වාමිදරු වූ සම්‍යක් සම්බුද්ධ රජාණන් කෙරෙහි සිත පැහැද වූ පමණකින් මෙබඳු දිව්‍ය සම්පත් ලබන කල නුවණැති සියලු සත්පුරුෂයන් විසින් හැම වේලෙ හි ම නො පමාව මේ රුවන්වැලි දාගබට පූජා කළ මැනවි.

## දාගැබ් කර්මාන්තයෙන් බැඳි කොටස පොළොවෙ හි ගිලීම

මෙ සේ දුටුගැමුණු මහ රජ ඒ දාගැබෙහි කර්මාන්ත කරවන්නේ තුන් මාල් පියවසාව බැඳ නිමවිය. එ සේ කරවූ තුන් මාල් පියවසාව රහතුන් වහන්සේ ස්ථිර වන පිණිස බිම හා සම කොට තමන් වහන්සේ ගේ ආනුභාවයෙන් ගල්වා වදාළ සේක. මෙ සේ බැඳි බැඳි සේ නව වාරයෙක ම ගලාපූ සේක. ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ මේ කාරණය නො දන්නෝ නො සතුටු වූ සිත් ඇති ව "මාගේ කුල දේවතා වූ මහා සඞ්ඝයා වහන්සේ රැස් වන සේක් ව" යි ආරාධනා කොට රාජ පුරුෂයන් යවූ හ. එ වේලෙ හි රාජ පුරුෂයන් ගේ ආරාධනයෙන් අසූ දහසක් දෙනා වහන්සේ රැස්වූ සේක. දුටුගැමුණු රජ්ජුරුවෝ සර්වාභරණයෙන් සැරහී මහ සෙනඟ පිරිවරා සුවඳ මල් බෙහෙත් ආදිය ගෙන්වා ගෙන විහාරයට ගොස් රැස් වූ අසූ දහසක් දෙනා වහන්සේට බෙහෙත් සුවඳ මලින් පූජා කොට වැඳ එකත්පස් ව සිට මෙ සේ විචාළා හ. "ස්වාමීනි, මා කරවන මහ දාගබ තුන් මහල් පියවසාව බැඳි බැඳි සේ නව වාරයෙක ම පොළොව ගැලිණ. එ සේ වනු මාගේ ජීවිතයට හෝ මා කරවන දාගබට හෝ අන්තරාය වන බවත් නො දනිමි. ඒ මට වදාළ මැනවැ" යි දැන්වූ හ.

එ බස් ඇසූ මහා සඞ්ඝයා වහන්සේ රජ්ජුරුවන්ට මෙ සේ වදාළ සේක: "දෙවයෙනි, තොප කරවන දාගබ කර්මාන්තයට වේ ව යි, තොප ගේ ජීවිතයට වේ ව යි අන්තරායෙක් නැත. මතු එන දවස තිර්ථකයකන් විසින් වන උපද්‍රව වලකන පිණිස ද, දාගබ බොහෝ කලක් ස්ථිරව පවත්නා පිණිස ද රහතන් වහන්සේ විසින් මේ කරවන ලදැ" යි වදාළ සේක. එ බස් ඇසූ රජ්ජුරුවෝ සතුටින් පිණා වදාළ බස් මුදුනෙන් පිළිගෙන මහදාගබ කර්මාන්තයට නැවත පටන් ගෙන බඳවන්නාහු තුන් මාල් පියවසාව දස කෙළක් උළින් බැඳ නිම වූ හ.

## උතුරුකුරු දිවයිනෙන් ගල් ගෙන්වීම

මෙ සේ තුන් මාල් පියවසාව බැඳ නිමි කල මහා සංඝයා වහන්සේ උත්තරය සුමන ය යන නම් ඇති රහත් සාමණෙරයන් දෙදෙනකු වහන්සේ කැඳවා දෙදෙනා වහන්සේට මෙසේ වදාළ සේක. "තෙපි දෙදෙනා උතුරු කුරු දිවයිනට ගොස්, සතර අතින් සම වූ, වඩුවෙන් අට රියන් බොල ඇත, එකි එකී අතින් අසූරියන් දිග ඇති මෙහෙවන් පාණ සයක් ගෙනෙව" යි වදාළ සේක. එ වේලෙ හි ඒ සාමණෙර දෙදෙනා වහන්සේ ද "යහපතැ" යි ගිවිස එම විට ම උතුරුකුරු දිවයිනට ගොස් මහා සඞ්ඝයා වහන්සේ වදාළ ලෙසට ම බඳුවද මල් පැහැ වැනි වූ මෙහෙවන් පාණ සයක් ගෙනවුත් එක් පහණක් දාගබ ධාතු ගර්භයෙ හි ම බිම අතුට අනික් ගල් සතර සතරදිග පිහිටුවා අනික් ගල ධාතුගර්භයෙ හි පිධාන කරන පිණිස දාගබට නැගෙනහිරි දිසාවෙ හි වැලි මළුවේ පවුර සමීපයෙ හි නො පෙනෙන පරිද්දෙන් තබා වදාළ සේක.

## ධාතු ගර්භ වර්ණනාව

ඉක්බිති ගැමුණු මහ රජ්ජුරුවෝ ධාතු ගර්භ මධ්‍යයෙ හි සත්රුවන්මය වූ සිත්කලු වූ බෝධි කෙනකුන් වහන්සේ කරවූ හ. ඒ බෝධින් වහන්සේ ඉන්ද්‍රනීල මාණික්‍යමය බිම හි පිහිටි සේක. රජ්ජුරුවන් කරවන ඒ බොධින් වහන්සේ ගේ මුල් පබළුමය කොට කරවූ හ. කඳ රිදියෙන් කරවන ලදි. සිරිවස ද රත්රනින් ම කරවූ හ. අටමහල ද සත් රුවනින් ම කරවූ ය. නැවත මල් පඞ්ක්තියක් ද සිවුපා පඞ්ක්තියක් ද හංස

පඞ්ක්තියක් ද විචිත්‍ර කොට සත් රුවනින් ම කරවූ ය. නැවත ඒ බොධින් වහන්සේ වඩුවෙන් අටළොස් රියන් උස ඇති සේක. එ සේ ම කරවූ සත් රුවන් බොධින් වහන්සේ ගේ උඩ බලා ගිය කඳු ශාඛාව ද සතර දිගට ගිය කඳු ශාඛා සතර දැ යි යන මේ ශාඛා කඳු පස ම වඩුවෙන් අටළොස් රියන් දිග ඇති සේක. ඒ බොධින් වහන්සේගේ බෝපත් ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් ම කරවූ ය. පඬෙරවන් පත් සත් රුවනින් ම කරවූ ය. අංකුර රත්රනින් ම කරවූ ය. ඒ බොධින් වහන්සේ මුදුනෙහි සුදු වියන් බැඳවූ ය. ඒ වියන් කෙළෙවර වටකොට මුතු හා එක් කොට අමුණන ලද රන්රසු දැල් බැඳවූ ය. නැවත රන් මිණි පඞ්ක්තියක් ද රන්දම් පඞ්ක්තියක් ද ඒ ඒ තන් හි එලෙන්නේ ය. ඒ වියන් සතර කොණ නව ලක්ෂයක් අගනා එ සේ වූ සතර මුතු කඳක් ද එල්වූ ය. මෙ සේ ම ඒ ධාතු ගර්භයෙ හි සුදුසු ලෙස සත් රුවනින් ම සඳහිරු දෙදෙනා ද නකත් තරු ද රන් පියුම් ද කරවන ලද්දේ ය. මාහැඟි වූ පස්වනක් පැහැයෙන් යුක්ත වූ අටෝරාදහසක් පිළි ද එල්වන ලද්දේ ය.

ඉක්බිති ඒ සතු රුවන් බොධීන් වහන්සේගේ කඳ මුල වට කොට සත් රුවන්මය පිල් කඩකුදු ලැවූ ය. ඒ පිල් කඩ මත්තෙහි මැහැඟි ඇඹුල පක් සා මුතු ද ඇතුරුවූ ය. ඒ මුතු රූසට කෙළවර සුවඳ පැන් පිරූ සත් රුවන් කළ පඞ්ක්තියක් ද තැබ්බවූ ය. එ සේ තැබ්බ වූ රුවන් කළ පඞ්ක්තියෙ හි පබළුමය මල් ලැවූ ය. පබළුමය කළයෙ හි රන් මල් ලැවූ ය. මැණික්මය කළයෙ හි රිදි මල් ලැවූ ය. රිදිමය කළයෙ හි ඉන්ද්‍රනිල මාණික්‍යය මල් ලැවූ ය. සත් රුවන් කළයෙ හි සත් රුවන් මල් ලැවූ ය. නැවත ඒ බොධින් වහන්සේට නැගෙනහිරි දිසාවෙ හි සත් රුවන්මය වූ කෙළක් අගනා ආසනයෙ හි සත් රුවන්මය වූ බුදුන් වැඩ හුන් උස පමණට බුදුරුවකුදු කරවූ ය. එ සේ කරවන ලද සත් රුවන්මය බුදුරුවෙ හි විසිනිය ද ඇස් සඟළෙ හි සුදු තැන් ද ජාති ස්ඵිටික මාණික්යෙයෙන් ම කරවූ ය. අතුල් පතුල් ද තොල් සහළ ද ඇස් හි රත් තැන් ද පබළුයෙන් ම කරවූ ය. නැවත ඒ පිළිම රූපයෙ හි මුදුන් කෙස් ද බැම සහළ ද ඇස් සහළෙහි කෘෂ්ණ මණ්ඩල ද යන මෙකී තැන් ඉන්ද්රෙනීල මාණික්‍යයෙන් ම කරවූ ය. තව ද ඒ පිළිම රූපයෙ හි නළල් හි උර්ණ රොම ධාතුව ද රිදියෙන් ම කරවන ලද්දේ ය.

ඉක්බිති සහම්පති මහා බ්‍රහ්මයා රිදී කුඩය ධරා සිටි නියාව ද එ හි ම කරවූ ය. එ සේ ම දෙදෙව්ලොව දෙවියන්ට අධිපති වූ සක්දෙව් රජු දෙවියන් පිරිවරා එක්සිය විසි රියන් දිග ජයතුරා සක පිඹ පිඹ සිටි නියාව ද එ හි ම කරවූ ය. එ සේ ම පඤ්චසිඛ දිව්‍ය පුත්‍රයා බෙළුවපණ්ඩු නම් වීණාව ගෙන ගායනා කරන්නා වූ නියාව ද එ හි ම කරවූ ය. නොයෙක් නාග මාණවිකාවන් පිරි වනර ලද, අනෙකප්‍රකාර ස්තුති ඝොෂාවෙන් බුදු රජාණන් වහන්සේ වන්දි භට්ටයකු සේ ස්තුති ඝොෂා කරන මහකෙල නම් නාග රාජයා ද එ හි ම කරවූ ය.

ඉක්බිති වශවර්තිමාරයා අත් දහසක් මවා ත්‍රිශූල මුද්ගරාදි නානායුධ ගෙන දහසක් කූඹින් සැරහුණු සසියයක් ගව උස ඇති ගිරිමෙඛල නම් ඇතුපිට හිඳ දස බිම්බරක් මර සෙනග පිරවරා ගෙන බෝමඩට දිව අවුත් නොයෙක් භයංකාර දක්වා කිසි උපද්‍රවයක් කොට ගත නො හී පැරද ගිය නියාව ද එ හි ම කරවූ ය. අනික් තුන් දිග, නැඟෙනහිරි දිසාවෙ හි බොධි පඞ්කය හා සදෘශ කොට කෙළක් අගනා ආසනයකුදු කරවා ඇද්දළින් දළම්ටු ලවා පබළුමය ව්‍යශජන පත්‍ර ද ඒ ආසනයෙ හි ම තැබ්බූ ය. බොධින් වහන්සේට ඉස්දොර අනෙක රත්නයෙන් හෙබියා වූ කෙළක් අගනා රිදි යහනකුදු කරවූ ය. කාය බල දසයක් හා ඥාණබල දසයක් ඇති ඒ මාගේ බුදු රජාණන් වහන්සේ ලොවතුරා බුදු ව සත් දවසක් මුළුල්ලෙහි දෑස නොපියා එයින්

නික්මෙන පස් වනක් පැහැයෙන් බොධි පූජා කළ නියාව ද සත් රුවනින් ම කරවූ ය. රුවන් සක්මන් කළ තැන් ද, රුවන් ගෙයි වැඩ හිඳ දහම් විමසූ තැන් ද, මුලින්ද නම් නාග රාජයාගේ භොගාවලියෙහි වැඩ හුන් තැන් ද, අජපාල නිග්රොධ මූලයෙහි වැඩ හුන් තැන් ද, කිරිපලු ගස මුල් වැඩ හුන් තැන් ද, තපස්සු භල්ලුක ය යන වෙළඳුන් දෙදෙනා විසින් මීපිඩු දන් දුන් තැන් ද, එවේලෙහි සතරවරම් රජදරුවන් එළවූ පාත්රෙ සතර තමන් වහන්සේගේ අධිෂ්ඨානයෙන් එක පාත්ර යක් කොට ඒ පාත්රායෙන් පිළිගත් නියාව ද එහි ම කරවූ ය. ඉක්බිති මහා බ්රහ්මයාගේ ආරාධනාවෙන් ධම්සක් පැවැත්වූ නියාව ද, යස නම් කුල පුත්රියා ප්රධාන වූ පස් පනස් දෙනා ගේ මහණ වීම ද, භද්රය වර්ගයෙහි රජ කුමරුවන් තිස්දෙනාගේ මහණ වීම ද, තුන්බෑ ජටිලයන් ප්රධාන වූ දහසක් තාපසවරන්ගේ මහණ විම ද, ලට්ඨි වන නම් උයන් හි වැඩ හුන් තෙනට බිම්සර රජ්පුරුවන් ගේ ඊම ද, රජගහ නුවරට වැඩීම ද වෙළුවන උයන පිළිගත් නියාව ද, දැග සව්වන් ප්රධාන අසූ මහ සව්වන් ද නිත්ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේ ද යන මේ සියල්ල ම සත් රුවනින් කරවූ ය.

ඊට ඉක්බිති ව රජගහ නුවර සිට කාලුදායි නම් මහ තෙර කෙනකුන් වහන්සේ ගේ ආරාධනායෙන් අඟු මගධ දෙරටින් කිඹුල්වත් පුරයෙන් මෙකී තුන් රටින් විසි දහසක් දෙනා වහන්සේ පිරිවරා, දෙසිය සතළිස් ගව්වක් මඟ ගෙවා කිඹුල්වත් පුරයට වැඩිම ද, ශාක්‍ය රජදරුවන් මානයෙන් නො වඳුම් හ යි සිටියවුන් දැක ඔවුන් ගේ මානය මැඩ රුවන් සක්මන් හි සක්මන් කොට, ඒ ආශ්චර්ය දැක දුටු පියාණන් සුද්ධොදන රජ්පුරුවන් ඇතුළු වූ රජදරුවන් ගේ වැඳිම ද, පොකුරු වැසි වට නියාව ද, රාහුල කුමාරයන් ගේ මහණ වීම ද, නන්ද කුමාරයන් ගේ මහණ වීම ද, ජෙතවන උයන පිළිගැන්ම ද, ගණ්ඩම්බ නම් අඹ රුක් මුල් හි කරන ලද යමක ප්‍රාතිහාර්ය ද, ඒ රුවන් සක්මන් හි සිට තුන් පියවරකින් තවුතිසා දෙව්ලොවට වැඩ පඬු ඇඹුල් හසුන් හි වැඩ හිඳ තුන් මසක් විජම් දේශනා කළ තැන් ද, මනුෂ්‍යයන් ගේ ආරාධනා පිළිගෙන මුගලන් මහ තෙරුන් වහන්සේ මහාමෙරු පර්වතය පත්ලට ගොස් මහමෙර පළා ගෙන බුදුන් ගේ ශ්‍රී පාද මූලයෙන් හිස නඟා පැදකුණු කොට මිනිසුන් ගේ පවත් දැන්වූ නියාව ද, දෙවාරොහණ නම් ප්‍රාතිහාර්යය ද, සකස්පුර දොරට වැඩි නියාව ද, ධම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ තැන් ද එ හි ම කරවූ හ.

නැවත මහාසමය සූත්‍ර දෙශනාව ද, රාහුලොවාද සූත්‍ර දේශනාව ද, මංගල සූත්‍ර දේශනාව ද, තිරොකුඩ්ඩ සූත්‍ර දේශනාව ද, ඛදිරඞගාර සූත්‍ර දේශනාව ද, ජම්බුකාජිවක සූත්‍ර දේශනාව ද, චක්ක සූත්‍ර දේශනාව ද, ගොවින් ද සූත්‍ර දේශනාව ද, පාරායන සූත්‍ර දේශනාව දැයි මේ ආදී වූ සූත්‍ර දේශනා ද, ධනපාල නම් හස්තියා ගේ දමනය ද, ආලවක දමනය ද, අංගුලිමාල දමනය ද, බක බ්‍රහ්ම දමනය ද, සච්චක දමනය ද, පොරිසාද දමනය දැ යි මෙකි සියල්ල ම හුදු සත් රුවනින් ම කරවූ හ. ඉක්බිති මාරයාට බුදුන් ආයුසංස්කාරය හළ නියාව ද, මෘදු වූ සූකර මද්දවය පිළිගත් තැන් ද, රන්වන් වූ පිළි සහළ පිළිගත් තැන් ද, පහන් පැන් වැළඳූ තැන් ද, කුසිනාරා නුවර මුල පටන් අග දක්වා පිපි සිටි සල්ගස් දෙකට මැද පනවන ලද යන්හි උතුරු දිගට හිස ලා දකුණු දිගට පය ලා නැඟෙනහිරට පිටලා බටහිරට මුහුණලා නැඟි නො සිටිනා සෙය්‍යා වෙන් වැඩ හෙව පිරිනිවන් පෑ තැන් ද, අනඳ මහ තෙරුන් වහන්සේ කුසිනාරා නුවරට වැද සැට දහසක් මල්ල රජදරුවන්ට බුදුන් අලුයම් වේලෙහි පිරිනිවන් පෑ බැව් වදාළ තැන් ද, එ බස් ඇසූ රජ දරුවන් පුරාඞගනාවන් හා සමග හිස තැබූ අතින් හඬා වගුළ තැන් ද, රන් දෙණට වැඩූ තැන් ද, දිව්‍යන බ්‍රහ්මයන් හාමනුෂ්‍යයන් පූජා කළ තැන් ද, එක්සිය විසි රියන් සඳුන් දරසෑයට රන්දෙණ වැඩූ තැන් ද, මහසුප් මහ තෙරුන් වහන්සේ ඇතළු වූ ගණදෙටු සත් ලක්ෂයක් මහ තෙරුන් වහන්සේ ඇතළු වූ සෙසු නො කී බොහෝ මහා සංඝයා වහන්සේ බුදුන්ගේ ශ්‍රී පාදය වැඳීම ද, බුදුන්ගේ ශරීරය දාගිය නියාව ද, සොහොන්

හස් කළ තැන් ද, මගධ රටට අධිපති වූ අජාතශත්‍රු නම් රජු ගේ අමාත්‍යයන් පළමු කොට බුදුන් පිරිනිවන් පෑ බැව් අසා කම්පාව "මෙ ම සැටියේ ඇසූනම් අපගේ රජ්ජුරුවන්ගේ ළය දෙකක්ව පැළී යෙයි. එ සේ හෙයින් අප වැනි මන්ත්‍රීවරුන් විසින් අපගේ රජ්ජුරුවන් රැකගත මනා වේදැ" යි සිතා රන්දෙණ තුනක් කරවා චතුමධුර පුරා රජ්ජුරුවින සමීපයට ගොස් "ස්වාමීනි, අප විසින් ඊයේ රෑ දක්නා ලද නපුරු ස්වප්නයෙක් ඇත. ඒ ස්වප්නය දෙසන නියායෙන් මේ චතුමධුර පිරූ දෙණ නාසා අග පමණක් පෙනෙන නියායෙන් වැඩ හොත් මැනවැ" යි දන්වා එ සේ දෙණ හොත් රජ්ජුරුවන්ට එක් අමාත්‍යයෙක් තමා පැළඳ සිව් ආභරණ ගලවා බුදුන් වන දෙසට මුහුණ ලා දොහොත් මුදුනේ බැඳ ගෙන බුදුන් පිරිනිවන් පෑ බවු රජ්ජුරුවන්ට දන්වා, එවේලෙ හි රජ්ජුරුවන් මූර්ච්ඡාව ගොස් ළෙන් නැගි ශොකයෙන් නාසයෙන් කින්මුණු හුණු වාතයෙන් ඒ දෙණ පිරූ චතුමධුර කකියා හුණුසුම නැඟි කල්හි ඒ දෙණින් ඔසවා එ සේ ම චතුමධුරු පිරූ දෙවෙනි දෙණක ලා බුදුන් පිරිනිවන් පෑ බව දන්වා මෙ ම ක්‍රමයෙන් තුන් වෙනි දෙණ ලා මූර්ච්ඡාව ගිය රජ්ජුරුවන්ට හිස සියගණන් සිහිල් පැන් සලා හිස මුදුනෙහි සුවඳ පිඬක් තබා මෙසේ සිසන්න ලත් රජ්ජුරුවන්ට බුදුන් පිරිනිවන් පෑ බවු දන්වා, එ පවත් ඇසූ අජාතශත්‍රු රජ්ජුරුවෝ හඬා වැලප වියරු හුණුවක්හු වෙස්ගෙන සොළොස් දහසක් පුරඟනන් පිරිවරා හිසකේ මුදා පිටමැද හෙළාගෙන රන් පිළිමයකට බඳු වූ තමන්ගේ ළය පැළියෙති සිතන්නක්හු මෙන් දැතින් ළය ගෙන රාජ වීථියට බැස ජීවකයන් ගේ අඹ උයනට ගොස් ඒ අඹ උයනෙහි යම් ස්ථානයෙක් හි බුදුන් වැඩ හිඳ රජ්ජුරුවන්ට ධර්ම දේශනා කරන සේක් ද ඒ ස්ථානය බලා හඬා වැලප සිතන්නාහු "මා හැඬුවායින් ශොක සන් නො සිඳෙයි. බුදුන් පිරිනිවන් පෑවත් ශරීර ධාතූන් වහන්සේ මාත් ලද මනා වේ දැ" යි සිතා කුසිනාරා නුවර සැට දහසක් මල්ල රජදුරුවන්ට "රජදරුවෙනි, බුදුන් වහන්සේත් රජව උපන් සේක. මම ත් රජ කුලයෙ හි උපන්මි. එ සේ හෙයින් බුදුන් පිරිනිවන් පෑවත් බුදුන්ගේ ශරීර ධාතුවෙන් භාගයක් මාත් ලද මැනවැ" යි කියා පත් ලියා දූතයන් අත යවා යවූ පතට ධාතූන් වහන්සේ නො එවත් නම් ගත යුතු උපායකින් ධාතු ගත මනාවේ දැයි සිතා මාර සෙනගක් මෙන් සිවුරඟ සෙනග පිරිවරා අජාසත් මහ රජ්ජුරුවන් නික්මුණු බවු අසා විසාලා මහනුවර සත් දහස් සත්සියයක් රජදරුවෝ ද, කිඹුල්වත් පුරයෙ හි ශාක්‍ය රජදරුවෝ ද, අල්ලකප්ප නුවර බුලය නම් රජදරුවෝ ද රාම ග්‍රාමයෙ හි කොලිය රජ දරුරෝ ද, වෙඨදිපක නම් ගම බමුණෝ ද, පාවා නම් නුවර මල්ල රජදරුවෝ ද යන මෙකී සත්රට රජදරුවන් විසින් කුසිනාරා නුවර වට කොට ගෙන හිඳ අපට ධාතූන් වහන්සේ හෝ දුන මැනව, නොහොත් අප හා යුද්ධ කළ මැනවැයි ඔවුනොවුන් කෙරෙහි අභිමාන පුරස්සරව යුද්ධයට සැරහී සිටී කල් හි ඒ විවාදය දුටු ද්‍රෝණ නම් බමුණු ආචාරීහු විසින් මාගේ ස්වාමිදරු වූ අරාග වූ අද්වෙෂී වූ අමොහී වූ තිලෝ ගුරු සම්යතක් සම්බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑවා වූ ස්ථානයෙ හි මේ රජදරුවෝ ආයුධ ආදීන් ඔවුනොවුන් පැහැර ලෙහෙ පමණකුදු දුටුවු නම් මාගේ ස්වාමි දරුවාණන් වහන්සේ විසින් පන්සාළිස් හවුරුදු කාලයක් මුළුල්ලෙහි බුදු ව වැඩසිට වදාළ සියලු බුද්ධ කෘත්‍යානයට මෙ ලෙසෙක් වී නම් ඒ සුදුසු නො වෙයි. මා විසින් මේ කලහය සන්හිඳුවා මෙකී රජදරුවන්ට ධාතු බෙදා දී ලුව මැනවැ යි සිතා එතැන් හි උස් ගොඩකට නැඟී, පන්සියයක් පමණ, ද්‍රෝබණ ගර්ජිත නම් ගර්ජනාවක් පිරිවානා කල් හි පළමු බණවරින් දෙසිය පනසක් ග්‍රන්ථ පිරිවන තුරු පර්ෂත් අරගළයෙ හි නො අසා දෙවන බණවර පිරිවානා කෙළවර අපගේ ආචාරින් ගේ ශබ්දය වැනි ශබ්දයකැ යි අරගළ නො කරව යි කියා නිශ්ශබ්ද වූ රජදරුවන්ට බමුණාණෝ බොහෝ අවවාද කියා ගිවිස්වා ගෙන ඒ සියලු රජදරුවන්ට ධාතු බෙදා දුන් නියාව ද යන මෙකී සියල්ල ම සත් රුවනින් ම කරවූ ය.

නැවත පන්සිය පනස් ජාතකය ද එ හි ම කරවූ ය. වෙස්සන්තර ජාතකයෙ හි සඳමහ රජ්ජුරුවන් ද, පුසති දේවීන් ද මද්‍රි දේවීන් ද ජාලිය කුමාරයන් ද කෘෂ්ණජිනාවන් ද අලිඇතු දන් දුන් නියාව ද, සන්තසතක මහා දානය ද, නුවරින් නික්ම නුවර බැලූ නියාව ද, අඹා දිවූ බමුණන් සතර දෙනාට අසුන් සතර දෙනා දුන් නියාව ද ශක්‍රයන් ගේ නියොගයෙන් දේවතාවන් රොහිත නම් මුවවෙස් මවාගෙන රථය ඇදි නියාව ද,

නැවත හඹා දිවූ බමුණාට රථය දුන් නියාව ද, දරු දෙදෙනා වඩාගෙන දෙදෙනා යන ගමනේ දරුවන් පලාපල දැක ඇවිටිගෙන ඇඟිලි ඔසවා පෑ නියාව ද, පලගත් රුක් දුනුපට සේ නැමී සිටි රුකින් මියුරු පලාපල කඩා දරුවන්ට දුන් තැන් ද, චෛතිය රට සාලාවෙහි වැඩහුන් තැන් ද, මද්‍රි දේවීන් මහ තනිව සිටි නියාව ද, නුවර වැස්සන් මද්‍රි දේවීන් දැක "මේ කුමන අනාථ ගමනෙක් දැ" යි කියා වැලපි තැන් ද, එ පවත් ඇසූ සැට දහසක් චෛතිය රජදරුවන් සාලාවට අවුත් බොධි සත්වයන් පා පිට හඬා සන්හිඳි වැඳ සිට තමා ගේ නුවරට වඩනට ආරාධනා කළ නියාව ද, ඒ නො ඉවසන විසින් එම සාලාව දිව්‍ය විමානයක් මෙන් සරහා බොධිසත්වයන් ඉස් සෝධා නාවා සළු පෙරළා සළු හඳවා උතුම් රාජභොජනය අනුභව කරවා සද්දවසක් තමන් ගේ නුවර රඳවා මහ වල් කප්පවා හෙළි කරවා සැට දහයක් රජදරුවන් බොධිසත්වයන් නික්මුණු වේලෙහි කඩු පලඟ ගෙන සැට ගව්වක් පමණ මහ ගෙවා ඉදිරියෙහි වඞ්කගිරි පර්වතයට සැට ගව්වක් පමණ තැන් මහ සලකුණු කියා බොධිසත්වයන් වැඳ වන දොරකඩ වැද්දකු සිටුවා රජදරුවන් තම තමන් ගේ රටට යන්ට සමුගත් තැන් ද, ඒ ධාතු ගර්භයෙ හි සත් රුවනින් ම කරවූ ය.

නැවත වන දොරකඩ සිටී වැද්දවූ වඩනා බොධිසත්වයන් දැක මී හා දඩමස් දුන් වැද්දවුට රන් ඉද්ද දුන් තැන් ද, මුචලින්ද නම් විල් තෙර ද, වංක ගිරි පර්වතයට වැඩීම ද, අඹුදරුවන් සහිත ව තවුස් වෙස් ගෙන පන්සල් හි හුන් තැන් ද, මද්‍රි දේවීන් ඵලාඵල ගෙනහැර වළඳවා මළු හැමද දැහැටි පැන් තබා පුදන්නට මල් කඩා දි අත්පා මෙහෙකළ තැන් ද, අමිත්තතාපා නම් බැමැණිය ගේ ගහටින් පූජක නම් බමුණා ජයතුරා නුවරට වැද බොධි සත්වයන් විචාළ තැන් ද, ඒ ඇසූ නුවර වැස්සන් "තව දන් ගැන්මෙ හි නො වැලකුනු දැ" යි කැට මුගුරු ගෙන ලුහුබැඳවූ නියාව ද, දෙවියන්ගේ ආනුභාවයෙන් බමුණා උතුරු වාසලින් නික්ම වඞ්කගිරි පර්වතයට යන මහ දිවූ නියාව ද, වන දොරකඩ සිටි වැද්දවුගේ කීන බල්ලන් බමුණා දැක සිසාරා ගත් නියාව ද, එ වේලෙ හි බල්ලන් කෙරෙහි හයින් බමුණා ගසට නැගී උන් නියාව ද, වැද්දවූ අවුදින් බමුණා ගසින බා ගත් තැන් ද, මී හා දඩමස් කා පැන් බී නික්මුනු බමුණාට මහ කී තැන් ද, බමුණා අච්චුත නම් තපස්වීන් ගේ පන්සලට වන් තැන් ද, තපස්වීන් දෙවෙනි දවස් නික්මුනු බමුණාට වඞ්ක ගිරියට මග කී තැන් ද, එ දවස් බමුණු අතර මහ රෑ ව ගොස් උස් වූ ගොඩක සැතපුණු තැන් ද, රෑ මද්‍රි දෙවී නපුරු සිනයක් දැක එවේලෙහි බොධිසත්ව යන්ගේ පන්සලට ගොස් දුටු සීනය කියා හැඬූ තැන් ද, එ වේලෙ හි බොධි සත්වයන් ස්වප්න විමසා සතුටුව මද්‍රි දේවීන් අස්වසා යවූ තැන් ද, ඒ රෑ පාන්ව ගිය කල වත් පිළිවෙත් කොට බොධිසත්වයන් ද දරු දෙදෙනා ද ඵලාඵල අනුභව කරවා දරු දෙදෙනාට අවවාද කොට බොධිසත්වයන්ට පාවා දී වැඳ සමුගෙන ඵලාඵල බාගන්නා දේටිල්ල ද අලමුල් කණිනා යහුල ද පැය ද යන මෙ කී දෙය ගෙන දෙවියන්ට යැද වල් ගිය තැන් ද, ඉක්බිති පූජක නම් බමුණා පන්සලට ආ තැන් ද, ඒ බමුණාණන් දැක ආදර පිණිස අතින් පිරිකර ගන්ට ජාලිය කුමාරයන් හයින් වෙවුලා බොධිසත්වයන් පිටිපස්සට වන් තැන් ද, එ වේලෙ හි බමුණා බොධිසත්වයන් ළඟට ගොස් ස්තුති කොට දරුවන් දන් ඉල්වූ තැන් ද, එබස් ඇසූ මහ බෝසතාණන් "යහපත බමුණාණෙනි, දන්දෙමි. දරුවන් ගනුව" යි කී බස් අසා දෙබින්නන් හයින් ගොස් විලට වැද සැඟවී සිටී තැන් ද, බොධිසත්වයන් දරුවන් ගේ පියවර සල කුණෙන් ගොස් විල් තෙර සිට දරුවන්ට හඬ ගෑ තැන් ද, ඒ හඬ ඇසූ දරුවන් අවුදින් පාපිට හඬා හුණු තැන් ද, ඔවුන් වඩා ගෙන ගොස් වටිනා මිල කියා දරුවන් බමුණාට දන් දුන් තැන් ද, එ වේලෙ හි බොධිසත්වයන් බල බලා සිටියදි දරු දෙදෙනා බැඳගෙන නික්මුණු තැන් ද, බමුණා පැකිල හුණු අවකාශයෙ හි අත බැඳි බැඳුම් කඩාගෙන දිව අවුත් පියාණන් පාපිට හඬා හුණු තැන් ද, නැවත බමුණා අවුදින් දරුවන් බැඳගෙන ගිය තැන් ද, ඵලාඵල සොයා ගිය මද්‍රි දේවී වෙනෙහිදි නපුරු කාරණා දැක එන ගමෙනෙහි පන්සලට එන නො දි ශක්‍රයන්ගේ නියොගයෙන් දෙවතාවන් තුන් දෙනකු විසින් සිංහ ව්‍යාඝ්‍ර වලස් වෙස් ගෙන මං හවුරා වැදහොත් තැන් ද, උන් දැක ඒ පන්සලට යා නො හී අන් පලා ගිය පසු සඳ නැගී වේලේ පන්සලට යන්නා වූ මෙතෙක් දා කෙළනා ඒ ඒ රැප්පා ආදිවූ තැන තමන් ගේ දරුවන් නො දැක ළය පිරුණු හොකයෙන්

හැළලුණා වූ සිත් ඇතිව ඒ මද්‍රි දේවි බොධි සත්වයන් සමීපයට ගොස් එතැන්හි දරුවන් නො දැක "දරුවෝ කොයි ද, ස්වාමිනි" යි රජ්ජුරුවන් විචාරා, බැණ නොනැහෙන හෙයින්, ඒ තුන්යම් රාත්‍රියෙ හි ගලසෙල ඇවිද දරුවන් නො දැක ළෙයි පිරුණු ශොකයෙන් ඇස පිරුණු කඳුළෙන් බල්ලකු ගත් කිකිළියක සේ බොධිසත්වයන් ගේ පා පිට හඬා හුණු තැන් ද, එ වේලෙ හි හිස ඇකයෙ හි තබාගෙන මුහුණ පැන් ඉස අතින් පිරිමැදි තැන් ද, සීසන්න ලදින් නැඟී සිට දරුවන් විචාරා දන් දුන් බව අසා දොහොත් මුදුනෙ හි තබා "දන් දුන් බව පළමු මට නො වදාළේ ඇයි ද? ස්වාමිනි" යි සතුටින් වැඳ සිව් තැන් ද, ශක්‍රවයන් විසින් බමුණු වෙස් ගෙන අවුත් මද්‍රී" දේවීන් දන් ලත් තැන් ද නැවත මද්‍රි දේවීන් බොධිස්වයන්ට ම පාවා දි ගිය තැන් ද, ජූජක නම් බමුණා දරු දෙදෙනා ගස මුල බැඳ ගසට නැඟි වැද හොත් තැන් ද, දෙවතාවන් ගේ ආනුභාවයෙන බමුණාට මඟ වැරද ජයතුරා නුවරට ම දරුවන් ගෙන ගොස් මුතුන් වූ සඳමහ රජ්ජුරුවන්ට දැක්වූ තැන් ද, බමුනාට නොයෙක් වස්තු දි මුනුබුරන් ගැලවූ තැන් ද, නැවත සඳමහ රජ්ජුරුවන් වංකගිරි පර්වතයට ආ තැන් ද දරු දෙදෙනාගේ හා නැයන් ගේ සමාගමයෙ හි පොකුරු වැසි වට තැන් ද, වෙස් සන්තර රජ්ජුරුවන් හා මද්‍රි දේවීන් හා දෙදෙනාගේ අභිෂෙක පැමිණි තැන් ද, ජයතුරානුවරට වැඩි කල සත්රුවන් වැසි වට තැන් ද, ඒ වෙස්සන්තරාත්ම භාවයෙන් චුව තුසිත භවනයෙ හි උපන් තැන් ද යන මෙකී සියල්ල ම විස්තර වශයෙන් ඒ දුටුගැමුණු රජ්ජුරුවෝ සත්රුවනින් ම ඒ ධාතු ගර්භ යෙහි කරවූ හ.

ඉක්බිති දස දහසක් සක්වළ දෙවියන් විසින් බුදු වන පිණිස ආරාධනා කළ නියාව ද, ඔවුන් ගේ ආරාධනාවෙන් මවුකුස පිළිසඳ ගත් නියාව ද, මහාමායා දේවින් ද, සුද්ධොදන රජ්ජුරුවන් ද, ලුම්බි වන නම් උයන්හි බිහි වූ නියාව ද, අහසින් උදක ධාරා දෙකක් අවුදින් බොධිසත්වයන් හා මැණියන් හා එ වේලෙ හි ම නැවූ නියාව ද, එ ම විට ම අතුරු දිගට සත් පිය වරක් නහා නික්මුණු තැන් ද, කාලදෙවල නම් තපස්වීන් ගේ ජටාවෙ හි පතුල් සුං දෙක පිහිටි නියාව ද, නැවත දඹගස සෙවණ ගස වට ඉක්ම නො ගිය නියාව ද, කිරි ඔවුන්ගේ ප්‍රමාදයක් දැක යහන් හි පර්යඞ්ක බැඳ ධ්‍යානයෙන් යුක්ත ව වැඩ හුන් නියාව ද, යන මේ හැම හුදු සත්රුවනින් ම ධාතු ගර්භයෙ හි කරවූ හ.

ඉක්බිති රාහුල කුමාරයන්ගේ මැණියන් යසොධරා දෙවීන් ද, රාහුල කුමාරයන් ද, සතර මහා නිධානය ද, තුන් සෘතුවට අවිත වූ මාළිගා තුන ද, එකුන් තිස් හවුරුද්දේ උයන් කෙළි පිණිස යන ගමනෙ හි ජරා රූප, ව්‍යා ධි රූප, මෘතරූප යන මේ දේවදූතයන් තුන්දෙනා දැක වැලකී තැන් ද, සතර වෙනි වාරයෙ හි මහණ රුවක් දැක "පැවිදි රූපය යහපතැ" යි සිත් උපදවා උද්‍යානයට ගොස් අනුභව කොට සවස් වේලෙ හි මඟුල් පොකුණෙන් නහා මඟුල් සල වට වැඩහුන් කල්හි විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා සැරහූ තැන් ද, ඉක්බිති මධ්‍යම රාත්‍රියෙ හි නළුවන් ගේ විප්රිකාරය දැක කන්ථක නම් අශ්ව රාජයා පිටට පැන නැඟී මහභිනික්මන් කළ තැන් ද, දස දහසක් සක්වළ දෙවියන් කළ පූජා විඳීම ද, කන්ථක නම් අශ්ව රාජයා වැලකි තැන් ද, අනොමා නම් ගංතෙරදි මහණ වීම ද, රජගහ නුවර පිඩුසිඟා වැඩි තැන්ද පාණ්ඩව නම් පර්වතච්ඡායාවෙ හි වැඩහිඳ පිඩු වැළඳූ තැන් ද, බිම්සර රජ්ජුරුවන් ඒ ස්ථානයට අවුදින් රාජ්‍යයෙන් පැවරූ තැන් ද, සුජාතා නම් කෙළෙඹි දුව විසින් දෙන ලද කිරි පිඬු අජපාල නම් නුගරුක මුලදී පිළිගත් නියාව ද, ඒ කිරිබත් නෙරඤ්ජරා නම් ගංතෙර දී වැළඳූ නියාව ද, වැළඳූ තලිය උඩුගං බලා යවූ නියාව ද, දවල් දවස් සල් වෙනෙ හි කල් යවූ නියාව ද, සවස් වේලෙ හි සොත්ථිය නම් බමුණා විසින් එළවන ලද කුසතණ පිළිගත් නියාව ද, ඒ සලා හුළ නියාව ද, එම විට පොළොව පළාගෙන පැන නැඟි තුදුස් රියන් වජා සනයට පැන නැඟි බෝ කඳට පිට දි නැගෙනහිර බලා පර්යඞ්ක බැඳ වැඩ හුන් තැන් ද යන මෙතෙක් දෑ විස්තර වශයෙන් සත්රුවනින් ම කරවූ ය. ඉක්බිති මිහිඳු මහ තෙරුන් වහන්සේ හා කැටිව මිහින්තලා වැඩි තෙරුන් වහනසේ

ද, දෙවනපැතිස්ස රජ්ජුරුවන් ද, මහමෙවුනා උයන පිළිගත් තැන් ද, මිහින්තලා ගල අටසැට ලෙණක් කටාර කොටවා පිළිගැන්වූ තැන් ද, සතර වරම් රජදරුවන් සතර දෙනා කඩු ගෙන රැකවල් ගෙන සිටි තැන් ද යන මේ හැම සත්රුවනින් ම කරවූ ය. ඉක්බිති දෙතිස් දිව්ය් පුත්‍රයන් ද ලියවැට පහන් ගෙන සිටි දෙතිස් දිව්යැ ස්ත්‍රීන් ද අටවිසියක සෙනෙවියන් ද එහි ම කරවූ ය. නැවත දොහොත් මුදුනෙහි තබා ගෙන සටි දෙවියන් ද, රන් මල් ගෙන සිටි දෙවියන් ද, රන් කලස ගෙන සටි දෙවියන් ද, තබන දෙවතාවන් ද, බෙර ගසන දෙවතාවන් ද, වස්දඬු පිඹින දෙවතාවන් ද, තන්තිරි ආලවත්ති ගෙන සිටී දෙවතාවන් ද, වෙන වෙන ම ලක්ෂ අගනා උසින් දස රියන් උස ඇති කැටපත් ගෙන සිටි දෙවතාවන් ද, ලක්ෂ අගනා මල් ඇර ගෙන සිටි දෙවතාවන් ද, සඳමඬල ගෙන සිටි දෙවතාවන් ද, හිරු මඬල ගෙන සිටි දෙවතාවන් ද, රන් පියුම් ගෙන සිටි දෙවතාවන් ද, රිදි පියුම් ගෙන සිටි දෙවතාවන් ද, රුවන් පියුම් ගෙන සිටි දෙවතාවන් ද, මල් තොරණ ගෙන සිටි දෙවතාවන් ද, කුඩ ගෙන සිටි දෙවතාවන් ද, විසිතුරු වූ මල්ල දෙවතාවන් ද, පිළී හිස සිසාරන දෙවතාවන් ද, ධම්සක් ගෙන සිටි දෙවතාවන් ද, කඩු ගෙන සිටි දෙවතාවන් ද, පස් රියන් උස ඇති සුවඳ තේල පුරා තුබු දුහුල් පියල්ලෙ හි ඇවළෙන පහන් පාත්‍ර හිස තබා ගෙන සිටි දෙවතාවන් ද යන මේ සියල්ල ම ඒ දුටුගැමුණු මහ රජ ධාතු ගර්භයෙහි සත්රුවනින් ම කරවී ය.

ඉක්බිති ඒ ධාතු ගර්භයෙ හි සතර කොණ දැවාණමය සතර ඇගෑයක් කරවා ඒ ඇගෑ සතර මත්තෙහි තියඹරා ගෙඩි සා මහක් මැණික් සතරක් තැබ්බී ය. නැවත ඒ ධාතු ගර්භයෙ හි සතර කොණ රන්, රිදි, මුතු, මැණික්, පබළු, වීදුරු මෙ කී රුවන් සතර ගොඩකුදු කරවී ය. ඉක්බිති මෙහෙවන් ගල් සතර භිත්තියෙහි විදුලිය කරවී ය. නැවත ඒ ඒ තන් හි රන්ලිය ද වල් විදුනා ද සත්රුවනින් ම කරවී ය. නැවත නිල් මහනෙල් මල් ගෙන සිටි නාග මාණවිකාවන් ද, කඩුපුල් මල් ගෙන සිටි නාග මාණවිකාවන් ද, යන මේ සියල්ල ම දුටුගැමුණු මහරජ උසින් පස් රියන් උස කොට ඝන රනින් ම කරවී ය. අවශේෂ වූ පූජා භාණ්ඩ මෙතෙකැ යි කියා පමණ නැත්තේ ය. හේ කෙ සේ ද යත්, අඹපාණ වැසි චිත්තගුත්ත නම් එක් තෙර කෙනකුන් වහන්සේ ලෝවා මහපායෙ හි යට මාලේ රැස් වූ දොළොස් දහසක් දෙනා වහන්සේ මද්ධයි යෙහි බණ වදාරන සේක් රථවිනීත සූත්‍රය පටන් ගෙන මහා ධාතු නිධානය වර්ණනා කරන සේක් "මේ බණ අසන්ට හුන් පර්පද්හි සමහර කෙනෙක් මේ දුටුගැමුණු රජ කරවූ මේ පූජා විධි නො අදහද්දෝ හෝ" යි සිතන සේක් පූජා විධි සමහරක් හැර වදාළ සේක. එ වේලෙ හි ගුත්හල කොට පව්වෙ හි වසන තිස්ස නම් මහ තෙර කෙනකුන් වහන්සේ ඒ ධර්මාසනයට නුදුරු තෙන වැඩ හුන් සේක් ධර්මකථික තෙරුන් වහන්සේට වදාරන සේක් "ඇවැත්ති, තොප කියන කථාවෙන් පිරිහුණු දැත් ඇත. නො හැර කියව" යි වදාළ සේක.

## භාතිය රජු ගේ චෛත්‍ය පූජාව

නැවත මෙ ම ලක්දිව දුටුගැමුණු රජ්ජුරුවන්ට දස වැනි වූ භාතිය නම් රජ්ජුරු කෙනෙක් මහත් වූ සැදැහැ ඇත්තෝ ය. තුනුරුවන් හි පහන් සිත් ඇත්තෝ ය. සවස උදැසන රුවන්වැලි දාගබ වැඳ පුදා මුත් බත් අනුභව නො කෙරෙති. ඒ භාතිය රජ එක්සිය විසි රියන් රුවන්වැලි දාගබ කොත් කැරැල්ල පටන් දාගබ වැලි කොන් ද දක්වා පටකඩින් ජවනිකා දෙකක් කරවා ලංකාද්වීප වාසින්ගෙන් තමන්ගේ භාණ්ඩාරයට වදනා අය හරවා නුවරට එකි එකී අතින් සතර සතර ගව්වෙ හි බිම් කොටවා ඉද්ද වතු හා දැසමන් වතු කරවා ඒ මල්වතුවල මල් සමව පිපෙන අවස්ථාවෙ හි භාණ්ඩාරයේ රැස් කොට තුබූ සඳුන් මැත් කරවා තුන්මාල් පියවසාවෙ හි පටන් කොත් කැරැල්ල දක්වා සතරගුලක් පමණ බොල සඳුන් කලල් ගල්වා ඊපිට මල් නටුයෙන් නටුව ගාවා මල් හිඳුවා ඒ එක් සිය විසි රියන් උස රුවන්වැලි දාගබ මෙ ම ක්‍රමයෙන් මල්

ඔටුන්නක් මෙන් සදා තිසා වැවින් ජල යන්ත්‍රයෙන් දිය ගෙන හැර කොත් කැරැල්ල මුදුනට දිය දැදුරැ දී මෙසෙයින් සතියක් පුදා එ සේ ද මල් බොහෝ විසින් දාගබ සතර දොරටුයෙ හි පටන් කොත් කැරැල්ල දක්වා සිය ගණන් දහස් ගණන් පැස්වලින් මල් සලවා මෙ ම ක්‍රමයෙන් ඒ එක් සිය විසි රියන් රුවන්වැලි දාගබ වසා මල් ගොඩක් කෙට ජල යන්ත්‍රයෙන් දිය දැදුරු දී මෙ සෙයින් සතියක් පුදා, ඉක්බිති ඒ මහ පිනැති භාතිය නම් රජ භාණ්ඩාරයේ තුබූ මුතු සියක් ගැල් දමා මුතු සුනු හනවා දාගබ සුනුවම් කරවී ය. ඉක්බිති රුවන්මය පබළු දැලක් කරවා එක් සිය විසි රියන් දාගබ වසා හෙළවා සන්ධි සන්ධියෙ හි ගැල සක් සා රන් පියුම් පුදා මුතු කලඹින් සදා මේ සැටියේ ද සතියක් පූජා කරවී ය. ඉක්බිති දාගබ වට සතියක් මුළුල්ලෙ හි මීවැසි වැස්වී ය. සතියක් සුවඳ වැසි වැස්වී ය. සතියක් රසදිය වැසි වැස්වී ය. සතියක සිරියල් වැසි වැස්වී ය. සතියක් රන් කලල් වැසි වැස්වී ය. එ හි රන් කලල් වැස්ස වැස දාගබ සලපතර මළුවෙහි ගොප් මස ගැලෙන පමණ වැසී සිටි කල්හි සද්දවසක් මහනෙල් මලින් සදා පුද කරවී ය. එ සේ හෙයින් ම දාගබ අඞ්ගණයෙ හි ගඳකලල් පුරා පිට ජාල පැදුරු අතුරුවා ඒ පැදුරු සිදුරෙහි මහනෙල් මල් හිඳුවා මේ සැටියේ සතියක් පුද කරවී ය. ඉක්බිති ඒ දාගප් මළුයෙහි නැසිනි අස්වා භාණ්ඩාරයේ තුබූ තෙල් ගෙන හැර එම මළුයෙ හි පුරවා තුන්පා පිය වසා අතුරු නැති කොට සද් දවසක් හෙළ ගිතෙලින් ම පාන් පූජා කෙළේ ය. එසේ ම මී තෙලින් ම සතියක් පාන් පූජා කරවී ය. මෙසෙයින් ම සතියක් තල තෙලින් ම පූජා කරවී ය. හවුරුදු පතා බුද්ධ රත්නය ධර්ම රත්නය සඞ්ඝ රත්නය යන තුනු රුවන්ට තුලාභාර වස්තු පුදන්නේ ය.

මෙ සේ ඒ භාතිය රජ එක් දවසක අධිකරණයෙ හි හිඳ නපුරු කොට බණන ලද යුක්තියක් අසා මැදහත් ව විචාරන රජහට ඉතා ම සවස් ව ගියේ ය. එ වේලෙ හි නැඟි සිටි රජ්ජරුවෝ රුවන්වැලි දාගබ වැඳීම සඳහන් නො කොට බත් මෙහෙ නිමන්නට එළඹ හිඳ බත් ආලොපයක් අතින් ගෙන මුඛයෙ හි නො තබා ළඟ සිටීයවුන් අතින් විචාරන භාතිය රජ්ජුරුවෝ "අද මාගේ මුත්තණුවන් වහන්සේ වැන්දෙම් ද? නො වැන්දෙම් දැ" යි විචාළහ. එ සේ විචාරන ලද ම ය. පෙර පුරාතන රජදරුවෝ බුදු රජාණන් වහන්සේට 'අප ගේ මුත්තණුවන් වහන්සේ ය" කියන්නා හ. එ බස් ඇසූ මිනිස්සු "දෙවයන් වහන්ස, අද දාගබ් වහන්සේ වැන්දේ නැතැ" යි දැන්වූ හ. එ වේලෙ හි අතින් ගත් බත් පිඩ රන් තලියෙහි හෙළාපියා නැඟි සිට දකුණු වාසල් දොර හරවා විහාරයට අවුත් නැගෙනහිර දොරකඩින් මළුවට නැඟී දා වදිනේ ඇතුළු දාකුස රහතුන් වහන්සේ බණ වදාරන ශබ්දය අසා බණ පරිව පිරිවා සිසාරා ඇවිදිනා සේක් දෝ හෝ යි බලන පිණිස ඒ භාතිය නම් රජ සතර වාසල් දොර මිනිසුන් සිටුවා තුමූ දාගබ වට කොට ඇවිද නො දකිනා රජ රැකවල සිටි මිනිසුන් විචාරා පිටත බණ පිරිවානා ශබ්දයක් නැති බව දැන ඇතුළු දා කුස යයි නියත කොට ගෙන නැඟෙනහිරි දිසාවෙ හි වාසලට ආසන්න ස්ථාන යෙහි දාගබට මුහුණ ලා වැදහෙව, ඒ රජ තමා ගේ ජීවිතය පරිත්‍යාග කොට "දාකුස බණ පිරිවානා රහතුන් දැක මුත් නැඟි නො සිටිමි" යි දෘඪතර ව වැද හොත්තේ ය.

මෙ සේ වැද හොත් ඒ භාතිය රජ්ජුරුවන් ගේ ගුණානුභාවයෙන් සක් දෙව් රජ්ජුරුවන් ගේ ආසනය හුණුව ගියේ ය. ඉක්බිති සක්දෙව් රජ දහසක් නුවණැස් ලා මනුෂ්‍ය ලොකය බලන්නේ ඒ කාරණය දැක දෙව්ලොවින් අවුත් දාකුසට වැද බණ පිරිවානා තෙරුවන් වහන්සේට මෙ සේ දන්වයි. "ස්වාමිනි, මේ භාතිය නම් රජ ධර්මිෂ්ඨ ය. තුනුරුවන් හි ඉතා පහන. එ සේ හෙයින් ඒ රජ ඇතුළු දාකුස බණ පිරිවානා ශබ්දය අසා 'දාකුස දැක මුත් නැඟි නො සිටිමි" යි අධිෂ්ඨාන කොට ගෙන වැද හොත්තේ ය. ඉදින් ස්වාමිනි, ඒ රජ දාකුස නුදුටුයේ වී නම්, එ තැන් හි ම මියන්නේ ය. ඔහු ඇතුළට ගෙන වුත් දාකුස පෑ වදාළ මැනවැ" යි කී ය. එ බස් ඇසූ රහතුන් වහන්සේ ද රජ්ජුරුවන් කෙරෙහි කරන ලද කරුණා යෙන් දාකුස පානා පිණිස එක් තෙර කෙනකුන් වහන්සේව නියම කොට වදාරන සේක් "භාතිය රජ්ජුරුවන් ගෙනවුත්

ධාතු ගර්භය වඳව" යි වදාළ සේක. එ වේලෙ හි තෙරුන් වහන්සෙ ද මැනවැයි අවුත් වැදහොත් රජ්ජුරුවන් අත අල්වා ගෙන ඇතුළු දාකුසට ගෙන ගොස් ඒ රජ්ජුරුවන් සිත් වූ පරිද්දෙන් වන්දවා ඇතුළු දාකුස සියල්ල ම සලකා ගත් කල් හි පිටත ලා වදාළ සේක. ඒ භාතිය රජ්ජුරුවෝ නුවරට ගොස් කල් යාමක් ගිය කල් හි දාකුස තමා දුටු රුවින් එකදෙහ මාත්‍රයක් රන් රූ කරවා රජගෙයි මිදුලෙ හි මහත් මඬුවක් ලවා ඒ රූ පන්තීන් තබා නුවර වැස්සන් රැස් කරවා "දාකුසෙහි මා දුටු රූ මෙබඳු ය" යි හැම දෙනාට ඒ රජ කීයේ ය. ඒ දාකුස රූ සැටියට කළ විසින් නියාමකරූ නම් වෙයි. ඒ රජ හවුරුදු පතා ඒ රූ භාණ්ඩාරයෙන් මෑත් කොට මඬුවෙහි තබා නුවර වැස්සන්ට දක්වයි. ආදි දවස් ඒ රූ දැක්වූ කල නුවර වැස්සෝ පැහැද එකි එකී කුලයෙන් එකි එකී දරු කෙනකුන් බැගින් මහණ කරවූ හ. මහා සඞ්ඝයා වහන්සේ මේ රූ නො දකිනා සේක් බොහෝ ය යි සිතා මහා සඞ්ඝයා වහන්සේටත් කියමි යි විහාරයට ගොස් ලෝවාමහාපායෙ හි යට මාලෙ හි භික්ෂු සංඝයා වහන්සේ රැස් කරවා සංඝයා වහන්සේ වැඳ රජ්ජුරුවෝ තුමූ ආසනයේ හිඳ තුන්සම රාත්‍රියෙ හි ධාතු ගර්භයෙ හි තමන් දුටු පූජා ස්තකාර කියා කෙළවර කොට ගත නො හෙන්නාහු ම ආසනයෙන් බැසපූ හ. ඒ පර්ෂද් හි වැඩ හුන් භික්ෂු කෙනකුන් වහන්සේ රජ්ජුරුවන්ට මෙසේ වදාළ සේක. "දෙවයිනි" තෙපි පෙරවරු බත් කා අවුත් තුන්යම් රාත්‍රියෙ හි ධාතු ගර්භයෙ හි වර්ණනා කරන්නාහු කියා නිමවා ගන්ට නො පොහොසත් වූහ. අනික් තවත් නො කී පූජා වර්ණනා ඇද්ද" යි විචාළ සේක. එබස් ඇසූ භාතිය රජ්ජුරුවෝ, "කුමක් වදාරන සේක් ද? ස්වාමිනි, නුඹ වහන්සේට මා විසින් කියන ලද්දේ ඒ ධාතු ගර්භයෙ හි පූජායෙන් දස භාගයෙන් භාගයක් විචාරත් නො කිම්" යි දැන්වූ හ. "මම වනාහි, ස්වාමිනි, මා විසින් සලකන ලද්දක් ම කියෙමි. ස්වාමිනි, ධාතු ගර්භයෙ හි අනන්ත වූ පූජා භාණ්ඩ ය. මෙ සේ අනන්ත වූ පූජා භාණ්ඩ සතරැස් සම වූ එකී එකී අතින් අසූ රියන් අසූ රියන් ධාතු ගර්භයෙ හි අතුරු නැති ව පුරන්නටත් නො පිළිවන් කල සුදුසු සුදුසු සැටියේ තබන කල දාකුස තිබේවයි, මහ දාගබෙහි වැලි මළුයෙ හි පවුරු කෙළවර දක්වා අතුරු සිදුරු නැතිව පුරන්නටත් බොහෝ ය. එ සේ හෙයින් ඒ සියලු පූජා භාන්ඩ ඒ දාකුස කෙ සේ පිහිටවී ද? එහි කිය යුත්ත පුරාතනයන් විසින් කියන ලද ම ය." නුගපිටි ත්‍රිපිටක මහාසීව නම් තෙර කෙනකුන් වහන්සේ රජගෙයි වැඩ හිඳ රජ්ජුරුවන්ට දසබල සිංහනාද සූත්‍රය වදාරන සේක් ධාතු නිධානය කියා සූත්‍රය නිමවා වදාළ සේක. රජ්ජුරුවෝ ද තෙරුන් වහන්සේට මෙ සේ දැන්වූ හ. 'ස්වාමීනි, මේ ධාතු ගර්භය සම චතුරශ්‍ර ය. එකි එකී දිගින් අසූ අසූ රියන. මෙතෙක් පූජා භාණ්ඩ මෙ හි ම ය යි කවරෙක් අදහා දැ" යි දැන් වූහ. එ වේලෙ හි තෙරුන් වහන්සේ "දෙවයෙනි, අප ගේ බුදු රජාණන් වහන්සේ ඉන්ද්‍රශාල ගුහායෙ හි ශක්‍රප්‍රශ්න සූත්‍ර දේශනාව දෙයන දවස් ඒ ගුහායෙ හි රැස් වූ දෙව සමාගමයෙ හි කොපමණ පර්ෂදක බැස සිටියෝ දැ යි තොප විසින් අසන ලද දැ" යි විචාළ සේක. එ බස් ඇසූ රජ්ජුරුවෝ "ස්වාමීනි, දෙදෙව් ලොව දෙවියෝ සිටියෝ ය" යි අසමි යි කී හ. එ වේලෙ හි තෙරුන් වහන්සේ "මහ රජ, එයිත් අදහා ගත යුතු දැ" යි වදාළ සේක. එ බස් ඇසූ රජ්ජුරුවෝ "ස්වාමිනි, දෙවතාවන්ගේ සෘද්ධියෙන් වේ දැ" යි දැන්වූහ. ඉක්බිති තෙරුන් වහන්සෙ නැවත මෙ සේ වදාළ සේක. "දෙවයිනි, ඒ එක දෙවතාවන් ගේ දෙව සෘද්ධියෙන් වේ ද? මේ වනා හි රුවන්වැලි දාගබ කරවූ දුටුගැමුණු රජ්ජුරුවන් ගේ රාජ සෘද්ධිය ය, රහතුන් වහන්සේ ගේ රහත් සෘද්ධිය ය, දෙවතා වන්ගේ දෙව සෘද්ධිය ය යන මේ තුන් සෘද්ධියෙන් පිහිටියේ ය" යි වදාළ සේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ ගේ බස් අසා "යහපත, ස්වාමිනි" යි ගිවිස තෙරුන් වහනසේට ධවලච්ඡත්‍රය පුදා විහාරයෙ හි හැර ලැවූ ය. තෙරුන් වහන්සේ ද තමන් වහන්සේට පිදූ ධවලච්ඡත්‍රය රුවන්වැලි දාගබ් වහන්සේ ගේ කොත් කැරැල්ලෙ හි බැඳ සත් දවසක් පුදා දැසමන් මලින් පූජා කළ සේක. එ සේ හෙයින් මෙ දුටුගැමුණු මහරජ එකාසංඛ්‍ය කප් ලක්ෂයක් පිරූ පාර මිතා ඇති විසින් මේ රජ මහානුභාව ඇත්තේ ය. එ සේ හෙයින් ම දත යුතු.

සක්දෙව් රජ්ජුරුවන් ගේ නියෝගයෙන් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා මේ කර්මාන්ත ආදියෙ හි පටන් වඩුවා ඇඟ ආවේශ ව ගෙන කරවන ලද හෙයින් ඔහුගේ සෘද්ධිය යි කියාත් දත යුතු ය. කර්මාන්ත කරවන

ඉන්දගුත්ත මහ තෙරුන් වහන්සේ කුඩා මහත් කර්මාන්ත විධාන කරවන හෙයින් හුදෙක් තෙරුන් වහන්සේ මතු නො වන සේක. සියලු රහතන් වහන්සේ ම තම තමන් වහන්සේ කළමනා කටයුත්තෙ හි උත්සාහ පානා පිණිස තරව මේ තුන් සෘද්ධියෙන් කරන ලදැ යි දත යුතු. ඒ ද මහාවංසයෙ හි කියන ලද මැයි. ෂඩභිඥා ප්‍රාප්ත වූ මහා නුවණැති ඉන්දගුත්ත නම් මහ තෙරුන් වහන්සේ මේ දාගබෙ හි කර්මාන්ත විධාන කොට නිමවූ සේක.

ධාතුගර්භ වර්ණනාව නිමි.

"මෙ සේ දුටුගැමුණු මහරජ්ජුරුවෝ ධාතුගර්භයෙ හි කර්මාන්ත නිමවා තුදුස්වක් ලත් දවස් විහාරයට ගොස් මහා සංඝයා වහන්සේ රැස් කරව" යි කියා ආරාධනා කොට යවු හ. එ වේලෙ හි තිස් දහසක් දෙනා වහන්සේ රැස් ව වදාළ සේක. එ වේලෙ හි දුටුගැමුණු රජ්ජුරුවෝ මහා සංඝයා වහන්සේ වැඳ මෙ සේ දන්වන්නාහු. "ස්වාමීනි, මා විසින් ධාතු ගර්භයෙ හි කළමනා කාර්යය කොට නිමවීම් සෙට ඇසළ මස මැදි පොහෝ දවස් උතුරුසළ නකතින් ධාතු නිධාන වෙයි. එ සේ හෙයින් ස්වාමිදරුවන් විසින් ධාතු ඇති තැනක් දන මැනව" යි මහා සංඝයා වහන්සේට භාර කොට රජ්ජුරුවෝ තුමූ නුවරට ගියාහු ය.

## ධාතු ගෙන ඊට සොණුත්තර හෙරණපාණන්ට පැවරීම

ඉක්බිති භික්ෂු සඞ්ඝයා වහන්සෙ ධාතුන් වහන්සේ ගෙනෙන්නට සමර්ථ නෙකුන් වහන්සේ සොයන සෙක්, පුදපිරිවෙන වසන වයසින් සොළොස් හැවිරිදි වයස සිව් ක්ෂීණාශ්‍රව සොණුත්තර නම් සාමණෙරයන් වහන්සේ දැක ඔබ කැඳවා වදාරන සේක් "සොණුත්තරයෙනි, දුටුගැමුණු මහරජ්ජුරුවෝ ධාතුගර්භයෙ හි කර්මාන්ත නිමවා ධාතුන්වහන්සේ ගෙනෙන පිණිස මහා සංඝයා වහ්නසේ ට භාර කළෝය. එ සේ හෙයින් ධාතුන් වහන්සේ තොප විසින් ගෙනෙව මැනවැ" යි වදාළ සේක. මහා සංඝයා විසින් වදාරන ලද බස් ඇසූ සාමණෙරයන් වහන්සේ "ස්වාමිනි, මම ධාතූන් වහන්සේ ගෙනෙමි. ධාතුන් වහන්සේ කොයි වැඩ සිටින සේක් දැ" යි විචාළ සේක. එ සේ විචාළ සාමණෙරයන් වහන්සේට මහා සංඝයා වහන්සේ වදාරන සේක්, සොණුත්තරයෙනි, අප ගේ බුදු රජාණන් වහන්සේ කුසිනාර නුවර සල්ගස් දෙක මධ්‍යයෙ හි පැනවූ යහන් හි නැඟී නො සිටිනා සෙය්යා වෙන් වැඩ හොත් සේක් සක්දෙව් රජ්ජුරුවන් කැඳවා වදාරන සේක්, "මාගේ අටද්‍රෝණයක් පමණ ධාතුන් වහන්සේ අතුරෙන් එක් ද්‍රෝණයක් පමණ ධාතු කොලිය රජදරුවන් විසින් පුජා කරනු ලබන්නේ ය. ඒ ධාතු ද්‍රෝණයක් එන දවස ලංකාද්වීපයෙ හි රුවන්වැලි නම් දාගබෙහි පිහිටන්නේ ය" යි වදාළසේක. නැවත බුදුන් පිරිනිවන් පෑ කල ද්‍රෝණ නම් බමුණු ආචාරි ධාතු අට කොටසක් කොට අට රට රජදරුවන්ට බෙදා දින. ඒ රජදරුවෝ තම තමන් ගේ නුවරවල දාගප් බැඳ පූජා සත්කාර කළෝ ය. ඒ දාගප් අතුරෙන් රාම ග්‍රාමයෙහි කොලිය රජදරුවන් විසින් බඳවන ලද දාගබ මහ වතුරෙන් බිඳී දා කරඬුව මුහුදට වැද රුවන් වැලි මත්තෙහි සවනක් රුසින් දිලිසෙමින් තුබුයේ ය. එ සමයෙ හි මාඤ්ජෙරික නම් නාග භවනයෙ හි නයි දාකරඬුව දැක නාග භවනයට ගෙන ගොස් මහකෙල නම් නා රජ්ජුරුවන්ට දැන්වූ හ. ඒ තෙපුල් ඇසූ මහකෙල නම් නා රජ දස කෙළක් නයින් පිරිවරා අවුත් සුවඳින් මලින් මහත් වූ පූජා සත්කාර කොට, රන් ධජ රිදී ධජ මුතු ධජ පබළු ධජ මැණික් ධජ සත් රුවන් ධජ පඤ්චාඞ්ගික තූය්‍ය නාදයෙන් මහත් වූ පූජා සත්කාර කොට දාකරඬුව ඉන්ද්‍රනීල මාණික්‍යය කරඬුවෙක තබා තමා ඉසින් ගෙන මහත් වූ පූජා සත්කාර ධාතුන් වහන්සේට ඒ නාරජ කොට නාග වනයට ගෙන හැර සයානුකෙළක් ධන ධාතුන් වහන්සේට පූජා කොටසත් රුවනින් දාගෙයක් කරවා ධාතුන් වහන්සේ ඒ දාගෙයි පිහිටුවා පූජා සත්කාර කරන්නේ ය. නැවත මහසුප් මහ තෙරුන් වහන්සේ අජාසත් රජ්ජුරුවන් ලවා ධාතු නිධාන කරවන සේක් රාම ග්‍රාමයෙ හි ධාතුන් වහන්සේ තබා සෙසු සත් රට ධාතුන් වහන්සේ ගෙන හැර රජ්ජුරුවන්ට දී වදාළ සේක. ඒ අජාසත් රජ්ජුරුවෝ රාම ග්‍රාමයෙ හි ධාතුන් වහන්සේ නො දැක "ස්වාමිනි, කුමක් පිණිස රාම ග්‍රාමයෙ හි ධාතුන් වහන්සේ නො ගෙනෙන ලද දැ" යි විචාළ හ. එ වේලෙ හි ඔබ වදාරන සේක් "දේවයෙනි, ඒ රාම ග්‍රාමයෙ හි ධාතුන් වහන්සේට තීර්ථකයන් විසින් උපද්‍රව නැත. මතු එන දවස ලංකාද්වීපයෙ හි රුවන් වැලි නම් මහ දාගැබෙක ඒ ධාතුන්වහන්සේ පිහිටන සේකැ" යි රජ්ජුරුවන්ට වදාළ සේක. නැවත ධර්මාශොක රජ්ජුරුවෝ අජාසත් රජ්ජුරුවන් කරවූ ධාතු නිධානය උගුළුවාපියා ධාතුන් වහන්සේ ගන්නෝ සත් ද්‍රෝණයක් ධාතු දැක අට වැනි ධාතු ද්‍රෝණය නො දැක සංඝයා වහන්සේ අතින් විචාරන රජ්ජුරුවෝ "ස්වාමීනි, අනික් ධාතු ද්‍රෝණය කොයි දැ" යි විචාළෝ ය. එ සේ විචාළ රජ්ජුරුවන්ට රහතුන් වහන්සේ

වදාරන සේක් "දෙවයෙනි, කොලිය රජදරුවන් විසින් බඳවන ලද දාගබ පිහිටි ධාතූන් වහන්සේ මහ වතුරෙන් දාගබ බිඳී, දාකුස තුබූ දාකරඬුව මහ මුහුදට වන. එ සේ ගිය දාකරඬුව නයි දැක තමන් ගේ මාඤ්ජෙරික නම තාල භවනයට ගෙන ගොස් මහකෙල නම් නා රජ්ජුරුවන්ට දී පූජා කෙරෙති" යි වදාළ සේක. එ බස් ඇසූ ධර්මා ශොක රජ්ජුරුවෝ මහා සංඝයා වහන්සේ වැඳ දන්වන්නෝ "ස්වාමීනි, නාග භවනය නම් මා ගේ ආඥව පවත්නේ ය. ඒ ධාතූන් වහන්සේ ගෙන්වා ගනිම් දැ" යි දැන්වූ ය. එ සේ දැන්වූ රජ්ජුරුවන්ට රහතුන් වහන්සේ වදාරන සේක් "දෙවයෙනි" ඒ ධාතූන් වහන්සේ මතු එන දවස ලංකාද්වීපයෙ හි දුටුගැමුනු නම් රජක්හු විසින් රුවන්වැලි නම් දාගබක් බඳවා ඒ ධාතු ඒ දාගබහි පිහිටුවන්නේ ය. එ සේ හෙයින් ඒ ධාතූන් වහන්සේ ගෙන්වීමෙන් ප්‍රයෝජන නැතැ" යි වලකා වදාළ සේක.

(නැවත රහතුන් වහන්සේ වදාරන සේක්.) "එ සේ හෙයින් සොණුත්තර යෙනි, තෙපි මාඤ්ජෙරික නම් නාග භවනයට ගොස් මේ හැම අප කී සරුප මහකෙල නා රජ්ජුරුවන්ට කියාලා ධාතූන් වහන්සේ සෙට ධාතු නිධානයට ගෙන එව" යි වදාළ සේක. එතෙපුල් ඇසූ සොණුත්තර සාමණෙරයන් වහන්සේ, "යහපත, ස්වාමිනි" යි ගිවිස තමන් වහන්සේ වැඩ හිඳිනා පුද පිරිවෙනට වැඩ වදාළ සේක.

නුවර සැරැසීම දුටුගැමුණු මහ රජ්ජුරුවෝ නුවරට ගොස් බෙර ලවන්නෝ "යෙට දගැබෙහි ධාතු නිධාන වන්නේ ය. එ සේ හෙයින් නුවර වැස්සන් තමන් තමන් ගේ විභවානරූපයෙන් සැරහී සුවඳ මල් ආදිය හැර ගෙන දාගබ් මළුවට රැස්වන්නේ ය" යි කියා මේ සැටියේ බෙර ලැවූ ය. ඉක්බිති සක්දෙව් රජ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳවා මෙ සේ නියොග කෙළේ ය."සෙට මහ දාගබ ධාතු නිධාන වෙයි. තෝ ගොසින් සියලු ලංකාද්වීපය විශේෂ කොට සරහව" යි සම්මත කෙළේ ය. විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා දෙවෙනි දවස් එකුන් සියයක් යොදුන් පමණ ලඞකාද්වීපය වළක් ගොඩක් පර්වතයක් යන මේ සියල්ල ම අන්තර්ධාන කොට බෙර ඇසක් මෙන් සම කොට රිදි පට හා සමාන වැලි අතුට පස් වනක් මලින් සරහා හාත්සින් පූර්ණ සට පූර්ණ කලස පඞක්තින් තබා සියලු මේ ලක්දිව වට කොට තිරයක් ඇද මුදුනෙහි සුදු වියන් බැඳ පොළෝ තෙලෙහි පියුම් ද දියෙ හි පියුම් ද ආකාශයෙ හි ඕලම්බක නම් එලෙන්නා වූ පියුම් ද දක්වා අලංකෘත කොට සරහන ලද සුධර්මා නම් දිව්‍ය සභාව මෙන් සරහා ලී ය. මහ මුහුද රළ සිඳි කකාරා ගත් මීකිරි ඇතිළියක් මෙන් මිහිරි සිහිල් පැන් විය. පස් වනක් පියුමෙන් ද ඒ මුහුද සැරහුණේ ය. ඒ මාගේ බුදු රජාණන් වහන්සේ ගේ ධාතූන් වහන්සේගේ ආනුභාවයෙන්, සියලු සක්වළ ගබ, බුදුන් මවුකුස උපන් දවස් මෙන් ද බිහිවෙන දවස් මේන ද බුදුවන දවස් මෙන් ද සැරහුණේ ය.

ඉක්බිති රජ්ජුරුවන්ගෙ රාජ නියොගයෙන් නුවර වැස්සෝ රැස්ව රාජ විථිය කසළ හැර හැමද මුතු සුනු හා සමාන සුදු වැලි අතුට ලදපස්මල් ආදිය අතුට අනෙක ප්‍රකාර පැහැයෙන් දිලිසෙන ධජ පතාක නංවා පුන් කලස තනා කෙහෙල් තොරණ පන්තීන් ද මල් තොරණ පන්තීන් ද පිළී තොරණ පන්තීන් ද, යන මේ අතෙක ප්‍රකාර තොරණින් ද, මල් ඇගෑ පහන් ඇගෑ ආදිය ද ඉදි කොට නුවර සැරහු ය. දුටුගැමුණු මහ රජ ද එ වේලෙ හි සතර වාසල් දොර දුක්පත් මිනිසුන් අනුභව කරනු පිණිස මියුරු වූ ආහාර ද නොයෙක් වර්ගයේ කැවුම් ද මී පැන් අක් පැන් කස පැන් ඇටකෙහෙල් පැන් මේ ආදි අටළොස් වර්ගයෙ හි පාන වර්ගයන් ද සුවඳ කවා තුබූ සිහිල් පැන් ද මල් සුවඳ ද පිළී පලඳනා ද පස්පලවතින් යුක්ත වූ බුලත් ද යන මේ හැම තැබ්බවිය.

## ගැමුණු රජ ධාතු නිධාන ස්ථානයට යෑම

ඉක්බිති ඒ දුටුගැමුණු මහ රජ උදෑසන සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නහා රන් සළු හැඳ සුසැට ආභරණයෙන් සැරහී මියුරු වූ ආහාර අනුභව කොට ඇඹුල මල් පැහැ බඳු වූ අසුන් සතර දෙනකු යොදන ලද උතුම් රථයකට නැඟී, සරහන ලද කඩොලැතු තමන් නැඟී රථයට ඉදිරි කොට, රන් කරඬුව හිස තබා ධවලච්ඡත්‍රය යට රජ සිටියේ ය. ඒ ඇසිල්ලෙහි සක්දෙව් රජුහු ගේ දිව්‍යාඞ්ගනාවන් හා සමාන රූ ඇති අනෙක ප්‍රකාර ආභරණයෙන් සැරහුණු සොළොස් දහසක් බිසෝවරුන් හා නොයෙක් ස්ත්‍රීහු රජ්ජුරුවන් පිරිවරා නික්මුණා හ. උන්ට ඉක්බිතිව නන්දිමිත්‍රාදී දශ මහා යොධයන් හා එකොළොස් දහස් එක් සියයක් පමණ සිරි යොධයන් හා සිවුරහ සෙනඟ හා කුරුන් කුඳුන් හා රාජාමාත්‍යයන් හා යන මෙකී සියල්ලෝ ම රජ්ජුරුවන් පිරිවරා නික්මුණාහු ය. නැවත අටෝරා දහසක් පුරුෂයෝ ද අටෝරා දහසක් ස්ත්‍රීහු ද මල් කරඬු ද ඳඬුවැට පහන් ද පඤ්ච වර්ණයෙන් යුක්ත ධජ පතාක ද ගෙන රජ්ජුරුවන් පිරිවරා ගත් හ. මෙ සේ ඒ දුටුගැමුණු මහ රජ එ දවස් මහත් වූ රාජෛශ්වර්යයෙන් යුක්ත ව නන්දනොද්‍යානයට ගමන් ගත් සක්දෙව් රජහු මෙන් ධාතු නිධාන කෙරෙමි යි කියා නික්මුණේ ය. එ වේලෙ හි රජු ඉදිරියෙ හි නටන්නෝ ද ගී කියන්නෝ ද ගමන් ගත් හ. භෘඞගවීණා නකුලවීණා දද්දරවීණා බ්‍රාහ්මවීණා කඤ්චිතාලම රසුතාලම් සමුත්තාලම් හස්තතලම් ද දැදුරුබෙර පණාබෙර ගැටබෙර රෝදබෙර මහබෙර එකස්බෙර ලොහොබෙර තලප්පර වීරන්දම් තම්මැට නිසාන සමුද්‍රඝොෂා රණරඞගඝොෂා ඩැක්කි උඩැක්කි ඩවුර සක්පඤ්ච මේ ආදී භෙරි ශබ්දයෙන් ද, රන්සක් රිදිසක් රුවන්සක් තැලිසක් කරසක් යුවළ සක් දකුණුසක් රන්සින්නම් රුවන්සින්නම් රන්දාරා රිදිදාරා රුවන්දාරා දළදාරා දළහං ලෝහං ගවරහං විජයොධවනි ඔත්තු නන්තිරි පිට සිරිවිලි යන මෙකී කාහල ජාතියෙන් ද හස්තීන්ගේ කුඤ්චනාදයෙන් ද අශ්වයන් ගේ හේෂාරවයන් ද රථයෙ හි නිමවළල්ලෙ හි ශබ්දයෙන් ද සෙණහඬ මෙන් ගසන්නාවූ බලත් හඬෙ හි ශබ්දයෙන් ද යන මෙකී ශබ්දයෙන් යුගන්ධර පර්වත සමීපයෙ හි සාගර නාදයක් මෙන් ද පොළෝ පැළී යන කලක් මෙන් ද ඒ දුටු ගැමුණු මහ රජ පූජාවට නික්මුණු ඝොෂාව පැවැත්තේ ය.

## සොණුත්තර හෙරණපාණන් නා ලොවට වැඩම වීම

එ වේලෙ හි පුදපිරිවෙන වසන සොළෙස් හැවිරිදි සොණුත්තර සාමණෙරයන් වහන්සේ දුටුගැමුණු රජ දාගබ ධාතු නිධානයට නික්මුණු භෙරි නාද ඝොෂාව අසා අභිඥාපාදක කොට ඇති චතුර්ථ ධ්‍යානයට සමවැද මහ පොළොව පළා ගෙන දිය කිමිද ගෙන යන දිය කාවකු සේ පොළොව කිමිද ගෙන මාඤ්ජේරික නම් නාග භවනයෙ හි මහකෙල නම් නාග රාජයා අභිමුඛයෙ හි ගොස් පෙනුණු සේක.

එ වේලෙ හි මහකෙල නම් නාග රාජයා ද තමා අභිමුඛයෙ හි වැඩ සිටි සාමාණෙරයන් වහන්සේ දැක වහා හුනස්නෙන් නැඟී සිට ඔබගේ ශ්‍රී පාදය වැඳ සුවඳ පැනින් පය සෝධවා සුවඳින් මලින් ඔබට පූජා කොට ඔබ හා සමග පිළිසඳර කථා කොට එකත් පස් ව හිඳ "ස්වාමිනි, කොයි සිට අප ගේ මේ නාග භවනයට වැඩිසේක් දැ" යි විචාළේ ය. එ සේ විචාළ නාග රාජයාට සොණුත්තර සාමණෙරයන් වහන්සේ වදාරන සේක් "මහරජ, ලංකාද්විපයෙ හි සිට ආම් හ" යි වදාළ සේක. එ සේ වදාළ සාමණෙරයන් වහන්සේට නා රජ කියන්නේ, "ස්වාමිනි, කුමක් පිණිස ලඞකාද්වීපයෙන් මේ මාගේ නාග දිවයිනට වැඩි සේක් දැ" යි විචාළේ ය. මෙ ලෙස විචාළ නා රජහට වදාරන සේක් "ලක්දිව රජ කරන දුටුගැමුණු මහරජ රුවන්වැලි

නම් දාගබක් බඳවා දාකුස ධාතු නිධාන කරනු පිණිස ඒ රජ මහා සංඝයා වහන්සේට භාර කෙළේ ය. රජුගෙන් එ පවත් ඇසූ මහාවිහාරයෙ හි වැඩ හිඳිනා තිස් දහසක් පමණ භික්ෂූන් වහන්සේ එක්තැන්ව වැඩ හිඳ මට වදාරන සේක්, "සාමණෙරයෙනි, දුටුගැමුණු මහ රජ බැඳවූ මේ රුවන්වැලි දාගබ් වහන්සේ නිසා තුබූ ද්‍රෝණයක් පමණ ධාතූන් වහන්සේ මහකෙල නම් නාගරාජයා සමීපයෙ හි තුබූ සේක. එ සේ හෙයින් තෙපි ඔහු සමීපයට ගොස් අප හැම දෙනා වහන්සේ කී මෙ පවත් ඒ නා රජහට කියා ධාතූන් වහන්සේ ගෙනෙව" යි මා තොප සමීපයට එවා වදාළ සේක. එ සේ හෙයින් මම තොප සමිපයට ආමි" යි වදාළ සේක.

## දාකරඬුව සැඟවීම

සාමණෙරයන් වහන්සේ වදාළ බස් ඇසූ මහකෙල නම් නාග රාජයා එබස් අසමින් ම පර්වතයකින් මඩනා කලක් මෙන් මහත් වූ ශොකයට පැමිණියේ මෙ සේ සිතී ය. "අපි මේ ධාතූන් වහන්සේට පූජා සත්කාර කොට මේ තිරිසන් ආත්ම භාවයෙන් මිදි මතු දිව්‍ය ලොක සම්පත් අනුභව කරම්හ යි සිතුම් හ. මේ සොණුත්තර සාමණෙරයන් වහන්සෙ ද මහත් වූ සෘද්ධ්‍යානු භාව ඇති සේක. එ සේ හෙයින් ඉදින් මුන් වහන්සේ මේ ධාතූන් වහන්සේ මේ දැගැබෙ හි තුබුවා දුටු සේක් වී නම්, අප අත්මැඩ පියා ඇර ගෙන යන්නට පොහොසත් සේක. එ බැවින් මා විසින් මුන් වහන්සේට ධාතූන් වහන්සේ නො දි දාගෙන් ධාතූන් වහන්සේ ඉවත් කොටපුව මැනවැ" යි සිතා තමන් ගේ නාග පර්ෂත් කෙළවර සිටි වාසුලදත්ත නම් තමා ගේ බෑනකු දැක ඕහට අත්සන් කොට ඔහු ලවා ධාතූන් වහන්සේ සඟවනු කැමැතිව සලකුණු දින. එ වේලෙ හි වාසුලත්ත නම් වූ ඔහුගේ බෑනා මයිලා කළ සංඥාව දැන දාගෙට ගොස් දාකරඬුව හැර ගෙන ගැලපියා මහාමෙරු පර්වත පාමුලට ගොස් මහත් වූ නාග වෙශයක් මවා ගෙන වැද හොත්තේ ය. හේ කෙසේ ද යත්, සාරසියයක් ගවු වට ඇති එක් දහස් දෙසියයක් ගවු දිග ඇති නොයෙක් දහස් ගණන් පෙණ මවා ගෙන මහත් වූ සෘද්ධි ඇති ඒ නාග රාජ තෙම, මහාමෙරු පර්වත පාර්ශ්වයෙ හි විෂ දූමයෙන් ද වහනින් ද දිලිසෙන්නා වූ ඒ නාග රාජතෙම දරණ වැල බැඳගෙන රුවන් වැලි මත්තෙහි වැදහෙව තමා හා සදෘශ වූ නොයෙක් දහස් ගණන් සර්පයන් විසින් පිරිවරන ලදුව වැද හොත්තේ ය.

එ වේලෙ හි සර්වඥ පුත්‍ර වූ ප්‍රතිපත්තියට දිවි පුදන්නා වූ අෂ්ටාර්ය පුද්ගල වූ සොණුත්තර නම් සාමණේරයන් වහන්සේ ගේ හා මහකෙල නම් නාග රාජයා ගේ හා දෙදෙනා ගේ යුද්ධයෙ හි ජය ගන්නෝ කවුරු දෝ හෝ පරදින්නෝ කවුරුදෝ හො යි බලම් හ’’ යි බොහෝ දේවතාවෝ ද නාග සුපර්ණයෝ ද එතැන් හි එ වේලෙ හි රැස්වූ හ. ඉක්බිති මහකෙල නම් නාග රාජයා තමා ගේ බෑනන් විසින් ධාතූන් වහන්සේ සඟවාපු බව දැන සාමණේරයන් වහන්සේට මෙ සේ දැන්විය. ‘‘ස්වාමීනි, සමීපයෙ හි ධාතූන් වහන්සේ නැත. එසේ හෙයින් මේ නාග භවනයෙහි කල් නො යවා වහා ගොස් භික්ෂූන් වහන්සේට මා කී පවත් කියා වදාළ මැනව. එසේ කල මහා සඞ්ඝයා වහන්සේ අනිත් තෙනකින් ධාතූන් වහන්සේ සොයන සේකැ’’ යි නා රජ සාමණේර යන් වහන්සේට දැන්වී ය.

## නාලොව සත් රුවන් දාගැබ හා දාගෙය

එ බස් ඇසූ සාමණේරයන් වහන්සේ තමන් වහන්සේට මහා සංඝයා වහන්සේ කී පරිද්දෙන් ආදියෙහි

පටන් ධාතූන් වහන්සේ පරම්පරායෙන් නා රජු සමීපයට ආ නියාව වදාරා "එ සේ හෙයින් ධාතූන් වහන්සේ තොප සමීපයෙහි ම ය. කල් නො යවා දෙව" යි වදාළ සේක. එ වේලෙ හි සාමණේරයන් වහන්සේ වදාළ තෙපුල් ඇසූ නාරජ සිතන්නේ "මේ වහන්සේ මහානුභාව ඇතිදැ ය. කිසි උපායකින් ධාතූන් වහන්සේ මුන්දැට නො දී යවා පියන බව සුදුසු ය" යි සිතා සාමණේරයන් වහන්සේ කැඳවා ගෙන දාගෙට ගොස් ඒ දාගෙයි සත් රුවන් දාගබ ද එ සේ ම සත් රුවනින් විසිතුරු වූ දාගෙය ද නා රජ සාමණේරයන් වහන්සේට පෑයේ ය.

ඒ දාගෙයි වර්ණනාව මහාවංශයෙ හි කියන ලද මැ යි. හේ කෙ සේ ද යත්, අනේක ප්‍රකාර වූ රුවනින් මනා කොට කරවන ලද්දා වූ දාගෙය ද එ සේ හෙයින් ම විසිතුරු කොට බඳවන ලද්දා වූ දාගබ ද බැලුව මැනැවයි සාමණේරයන් වහන්සේට පෑ නැවත නා රජ සාමණේරයන් වහන්සේ කැඳවා ගෙන දාගෙන් මැතට අවුත් සඳකඩ පහණ පබළුමය පියුම මතුයෙ හි සිට "ස්වාමීනි, මේ දාගබට ද මේ දාගෙට ද මිල වදාළ මැනව" යි දැන්වීය. එ ලෙස වදාරා නැවත වදාරන සේක් "එකානුසියයක් යොදුන් ලඞ්කාද්වීපයෙ හි සියලු රත්නයෝ තොප ගේ මේ දාගෙට මැඩ ගෙන වදනා මේ සඳකඩ පාණටත් නො හඟනේ ය" වදාළ සේක.

එ බස් ඇසූ නා රජ "එසේ කල ස්වාමීනි, මෙ සේ මහත් වූ පූජා සත්කාර ඇති තෙනින් ස්වල්ප වූ පූජා ඇති තෙනට ධාතු ගෙන යාම යුක්ත නො වෙයි" දැන්වී ය. එ සේ කී නා රජුට නැවත සාමණේරයන් වහන්සේ වදාරන සේක්, "දේවයෙනි, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ නම් සද්ධර්මය ම ගරු කොට වසන බව මුත් ආමිසය ගරු කොට නො වයන සේක. එ සේ හෙයින් තෙපි මෙව්වරක් තබා සක්වළ පමණ සා සත් රුවන් ගෙයක් මවා ඒ ගෙය සත් රුවනින පුරා ධාතූන් වහන්සේට තෙපි පූජා කොට පරිහරණය කරන්නාහු වී නමුත් ධර්මාභියොගයක් කොට ගන්ට අසමර්ථ ය" යි වදාළ සේක. ඉක්බිති සාමණෙරයන් වහන්සේ නා රජුට වදාරන සේක්, "දුටු ගැමුණු මහ රජ අද ම ධාතු නිධාන කරවන්නේ ය. එ සේ හෙයන් තෙපි මට නො ලස් කොට වහා ධාතූන් වහන්සේ දෙව" යි වදාළ සේක. මෙ සේ සාමණෙරයන් වහන්සේ වදාළ බසට නා රජ පසු නො බැස තමා ගේ බෑනා විසින් ධාතූන් වහන්සේ සඟවාපියන ලදැ යි සිතා සාමණෙරයන් වහන්සේට මෙ සේ දැන්වී ය: "ස්වාමීනි, මේ මාගේ දාගබෙ හි ධාතූන් වහන්ස් ඇති බවත් නැති බවත් නො දන්නා සේක්, "දෙවයෙනි, මට ධාතූන් වහන්සේ දෙව" යි වදාරන සේක. මම නැතැ යි කියමි. එ සේ හෙයින් මෙ සේ දොඩා කම් කිම් ද? ඉදින් ධාතූන් වහන්සේ දුටු සේක් වී නම් හැර ගෙන වැඩිය මැනවැ" යි දැන්වී ය.

## හෙරණපාණන් සෘද්ධි බලයෙන් දාකරඬුව ගැනීම

එ වේලෙ හි නාග රජු කී බස් ඇසූ සාමණෙරයන් වහන්සේ ඒ නාග රාජයා අභිමුඛයෙ හි වැඩ සිටි සේක් සූක්ෂම වූ අතක් මවා එකෙණෙහි ම මෙර පාමුල නා කැලන් පිරිවරා වැද හොත් ඔහුගේ බෑනාගේ මුඛයට අත පොවා වදාරා දාකරඬුව හැරගෙන වදාරන සේක් නා රජ, අප ආ කාරිය සිද්ධ විය. තෙපි සිටුවයි වදාරා සියුම් වූ මකුළු හුයක් යටි පටින් දා උඩු පිටින් කළවන් පෑ නො වන තෙන් පොළොව කිම්ද ගෙන අවුත් තමන් වහන්සේ වැඩ හිඳිනා පුදපිරිවෙන පෙනුණු සේක.

ඉක්බිති එ දවස් සාමණෙරයන් වහන්සේගේ හා නා රජු ගේ හා දෙදෙනා ගේ යුද්ධ බලම් හ යි රැස් වූ දෙවතාවන් හා නාග පර්ෂද් හා සාමණෙරයන් වහන්සේ ජය ගත් බව දැක සතුටු වූ දෙවතාවෝ ධාතූන් වහන්සේට පූජා සත්කාර කරන්නාහු සාමණෙරයන් වහන්සේ හා සමග අවුත් විහාරයට ම වන් හ. ඉක්බිති මහකෙල නාග රාජයා ද සාමණෙරයන් වහන්සේ වැඩපු වේලෙ හි "සාමණෙරයන් වහන්සේ වඤ්චා කොට යවාපීම් යි සතුටු වූයේ ළඟ සිටියවුන් බණවා කියන්නේ "වහා ධාතූන් වහන්සේ දාගෙට වඩනා නියායෙන් හැරගෙන එන්නේ ය" යි බැනා සමීපයට මෙහෙවර කරන්නන් යවී ය. එ වේලෙ හි වාසුලදත්ත නම් නාග රාජයා ද තමා බඩ තුබූ දාකරඬුව නො දැක හිස තුබූ අතින් හඬමින් අවුත් මයිලා පාපට හි තමා බඩින් දාකරඬුව හැර ගත් බව මයිලාට දැන්වී ය. එ වේලෙ හි බැනා කී තෙපුල් ඇසූ නා රජ ද "අපි වඤ්චා කරම්හ යි සිතුම්හ. මේ බව නො දත්තම් හ" යි හැඬී ය. ඔහු ගේ හඬ අසා සියලු නායි ම රැස් වුවාහු ධාතූන් වහන්සේට කළ සොකයෙන් හැඬූ ය.ඉක්බිති නාග භවනයෙ හි සියලු නායි රැස් ව හිසකේ මුදා පිට මැද හෙළා ගෙන දැතින් ළය වහල් කොට ගෙන නිල් මහනෙල් මල් හා සදෘශ වූ ඇස්වලින් තමන් ගේ සොක විරුවන්නවුන් මෙන් දැස්වලින් හුණු කඳුළු ධාරාවන් වගුරුවන්නාහු නාග භවනයෙන් අවුත් සොණුත්තර සාමණෙරයන් වහන්සේ පුදපිරිවෙනට රැස් ව හඬන්නාහු මෙ සේ කියා හැඬූ ය. කෙ සේ ද යත්,

## නාගයන් හඬාවැලපීම

සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණායෙ හි මුල් බවට පැමිණි සර්වඥ පුත්‍රයන් වහන්ස, මේ සසර දුක් දැඩි වූයේ මිනිසුන්ට ම ද? නිවන් මිහිරි වූයේ මිනිසුන්ට ම ද? බුදු වූ ස්වාමිදරුවාණන් පාරමිතා පුරා බුදු වූයේ මිනිසුන්ට ම ද? ඒ සදහම් අමා වූයේ මිනිසුන්ට ම ද? ඒ සඟුරුවන් දුක් දොම්නස් නැති කරන්නේ මිනිසුන්ගේ ම ද? ඒ ස්වාමිදරු වූ බුදු රජාණන් වහන්සේ ගේ ශරීරයෙන් විසිරුණු ශරීර ධාතූන් වහන්සේ අප විෂඝොර විසින් අප ඇසට හලාහල වී ද? මිනිසුන් ඇසට කර්පූර සලාක වී ද? ඒ ස්වාමි දරුවන් ගෙ රූප ශ්‍රී මිහිරි වූයේ මිනිසුන්ට ම ද? ස්වාමිදරුවාණන් ගේ ධාතු වැඳ පිදු පමණින් සතර අපායෙ හි අකුල් හෙළා නිවන් මහවත් රජ මහවත් වන්නේ මිනිසුන්ට ම ද? ඇයි, අපිත් සසර නො සිටියමෝ ද? මිනිසුන් ගේ දුක් පහ කරම් හ යි බුදු වූ බව මුත් නා ලොව ඇත්තන් ගේ දුක් පහ කරම් හ යි නො සිතූ සේක ද? මෙ සේ ම අපට තද වන්ට මුළු ලොව පැතිරි ඒ බුදුන් ගේ කරුණාව අප විෂඝොර හෙයින් ඇකිළි අප කරා නො වන්නේ ද? නැවත බුදු වන්ට වඩනා ස්වාමි දරුවාණන් වළඳ හළ පාත්‍රය ගඟට හළ කල උඩුගං බලා අසූ අතක් ගොස් සළාවැටුමෙක්හි වන්නේ අප කුලයෙ හි එකක්හු ගේ භවනයට නො වේ ද? ප්‍රථම බොධියෙ හි සත් දවසක් වස්නා මහ වැස්සෙ හි රිදි උළින් බැඳි ආසනයක් මෙන් දරණවැල් ගැබ හිඳුවාගෙන ගඳකිළි කොට වඩා හිඳුවූයේ අප කුලෙහි නයෙක් නො වේ ද? බුදු වන මඟුලෙ හි දි දහසක් තුඩු මවා ගෙන ස්වාමි දරුවන්ට වන්දිභට්ටයකු සේ ස්තුති ඝොෂා කෙළේ අප කුලෙහි ගැත්තෙක් නො වේ ද? එ සේ හෙයින් ස්වාමි දරුවාණන්ට මේ හිමිකම් බිණීමෙ හි අපිත් අවශ්‍යයෙන් ම ගැත්තම් හ. එ සේ හෙයින් අපට අනුග්‍රහ කොට වදාළ මැනව. නුඹ වහන්සේ ධාතූන් වහන්සේ හැර ගෙන හීමෙන් පීඩාවට පැමිණියම් හ යි සඟමැද අනෙක කාරණ කියා ඒ නායි මේ සැටියේ හැඬූ ය. මෙ සේ ඒ නායි හඬා නැවත භික්ෂු සංඝයා වහන්සේට මෙ සේ දැන්වූ ය.

"ස්වාමිනි, අප විසින් කිසි කෙනකුන්ට පීඩාවක් නො කොට අප ගේ කුසලානුභාවයෙන් මේ ධාතූන් වහන්සේ ලැබ බොහෝ කලක් පරිහරණය කළ ධාතූන් වහන්සේ කුමක් පිණිස අපට කිසි ධාතු සිඟිත්තකුත් නො දි, නිරවශෙෂයෙන් ගෙන්වා වදාළ සේක් ද? අප ගේ ස්වර්ග මොක්ෂ දෙකට කුමක්

පිණිස බාධා කොට වදාළ සේක් ද" යි යනාදීන් මෙ ලෙස ඒ නයි මුනි දරුවන් සිත පෙම් වඩා බැගෑපත් ව හැඬු ය. මෙ සේ ඒ නයි හැඬූ පසු, මහා සංඝයා වහන්සේ ඒ නයින් කෙරෙහි කරන ලද අනුග්‍රහයෙන් ඒ නයින්ට මද යම්තම් ධාතු කෙනකුන් වහන්සේ දෙවා වදාළ සේක. එ වේලෙ හි ඒ නයි ධාතූන් වහන්සේ ලැබ සතුටු වූවාහු තමන් ගේ නාග භවනයට ගොස් පූජා භාණ්ඩ ගෙනවුත් තමන් ලද ධාතූන් වහන්සේට මහත් වූ පූජා සත්කාර කොට නාග භවනයට ගෙන ගොස් දාගෙට ධාතූන් වහන්සේ වැඩූවාහු ය.

## දෙවියන් ගේ පුද සත්කාර

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙමේ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳවා "දරුව, තෙපි ගොස් සාමණෙරයන් වහන්සේ ධාතූන් වහන්සේ ගෙන පොළොව පළා ගෙන නැඟී තෙන සත්රුවන් මණ්ඩපයක් මවව" යි සම්මත කෙළේ ය. එ බස් ඇසූ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා ඒ ක්ෂණයෙ හි එතැන සත්රුවන් මණ්ඩපයක් මැවී ය. ඉක්බිති සක්දෙව් රජ දෙදෙව්ලොව දෙවතාවන් විසින් පිරිවරන ලදුව රුවන් ආසනයක් ද රන් කරඬුවක් ද ගෙනහැර ඒ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද සත්රුවන් මණ්ඩපයෙ හි රුවන් ආසනය ද ඊපිට රන් කරඬුව ද තබා සාමණෙරයන් වහන්සේ අතින් දාකරඬුව ගෙන පළමු කියන ලද රත්න පර්යඞ්කයෙ හි පිහිටවී ය. එ වේලෙ හි මහා බ්‍රහ්මයා දොළොස් ගවු වට ඇති අටසාළිස් ගවු උස ඇති ධවලච්ඡත්‍රය ඒ ධාතූන් වහන්සේ මුදුනට ධැරී ය. සන්තුෂිත දිව්‍ය පුත්‍රයා වල්විදුනා ගෙන සිටියේ ය. සුයාම දිව්‍ය පුත්‍රයා මැණික් තල්වැට ගෙන සටියේ ය. සක්දෙව් රජ එක්සිය විසි රියන් ජයතුරා සක පිඹ පිඹ සිටියේ ය. ඉක්බිති සතර වරම් රජ දරුවෝ සතර දෙන කඩු ගත් අත් ඇතිව, "ඒ ධාතූන් වහන්සේට සතුරු කෙනකුන් වැද්ද නො දෙම් හ" යි දෙලක්ෂ අසූ දහසක් යක්ෂයන් හා අටවිසි යක් සෙනෙවියන් හා පිරිවරා අවුත් ඒ ධාතූන් වහන්සේට රකවල් ගෙන සිටියා හ. මහත් වූ ඍද්ධ්‍යානුභාව ඇති දෙතිස් දිව්‍ය පුත්‍රයෝ රන් කරඬු ගත් අත් ඇති ව පර සතු මදාරා මලින් පුදන්නාහු එතැන් හි සිටියා හ. නැවත දෙතිස් දිව්‍යක කුමාරි කාවරු ද දඬුවැට පහන් ගෙන සිටියා හ. පංචශිඛ දිව්‍ය පුත්‍රයෝ ද තුන්ගවු දිග ඇති බෙළුවපණ්ඩු වීණායෙ හි සත් තතක් නඟා සරහා දසදහස් නවසිනය එකානු හඬෙකින් මුළු ලොව කර්ණාමෘත කෙරෙමින් ඒ ධාතූන් වහන්සේට පූජා කෙරෙමින් වැඳ වැඳ සිටියෝ ය.

නැවත තිම්බරු නම් ගන්ධර්ව දිව්‍ය රාජයා ද රඟ මඬලක් මවා ගෙන ඒ ධාතූන් වහන්සේට අනෙක විධ වූ භෙරි නාදයෙන් පූජා කෙරෙමින් වැඳ වැඳ සිටියේ ය. නැවත එකී එකී කුට්ටමකට අටසැට දහසක් බෙර හා ගී කියන දෙව්දුන් දස දහසක් සහිත වූ බෙර කුට්ටම් පනස් දහසෙක් බුදු ගුණ කිය කියා ඒ ධාතූන් වහන්සේ අභිමුඛයෙ හි බෙර ගසන්නට පටන් ගත්හ. තුන් ලක්ෂ විසි දහසක් දිව්‍ය කුමාරවරුන් හා එ පමණ දිව්‍ය කුමාරිකාවරු හා දඬුවැට පහන් ගෙන සිටියා හ. නැවත අනන්තාපරිමාණ දෙවියෝ ඒ ධාතූන් වහන්සේ පැදකුණු කොට අතින් අත් බැඳ කරින් කර වැලඳ දිවන්නා වූ බුදුගුණ කිය කියා තුනුරුවන් අරහයා දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ද සවනක් ඝන බුදුරැස් ද පන්සිය පනස් ජාතකයන් ද චුද්දස බුද්ධ ඥානයන් ද නව අරහාදි බුදුගුණ ද කිය කියා ඒ ඒ සන්ධියෙහිදී ඔවුනොවුන්ට, "සබඳිනි, සබඳිනි" යි කියමින් මේ සැටියේ ඒ දෙවියෝ ධාතූන් වහන්සේට පූජා කළා හ. මහ කෙල නම් නාග රාජයා ද අනෙක ප්‍රකාරයෙන් ස්තුති ඝොෂා පවත්වමින් අසූකෙළ දහසක් නාග මාණවිකාවන් පිරිවරා ඒ ධාතූන්වහන්සේට වැඳ වැඳ සිටියේ ය.

නැවත අනන්තාපරිමාණ දෙවතාවෝ ඒ ධාතූන් වහන්සේ පිරිවරා ගෙන සත්රුවන් කාහල පිම්බාහු ය. ඒ

කාහල කුමක් කියා පිම්බෝ ද යත්, "සමන්තභද්‍රණ වූ ශාක්‍යසිංහ වූ පරදුඃඛ දුඃඛිත වූ සද්ධර්ම ගංගා ප්‍රවාහ වූ හෘදයානන්දකර අශරණශරණ ශරණගත වජ්‍රිපඤ්ජර ත්‍රිභුවනවන්ද්‍යාභිමාන වන්ද්‍යාව දෙවාතිදේව ශක්‍රාතිශක්‍ර බ්‍රහ්මාතිබ්‍රහ්ම" යනාදී වූ විරිදු කියා ඒ ධාතූන් වහන්සේට ජය කාහල පිම්බාහු ය. ඒ කාහල පිඹි දෙවියෝ කෙතෙක් දෙනා ද යත්, දාවල් ආකාශයෙහි තරු පිපි වැනි ගියේ ය. භූමියෙ හි සත් රුවන් ඉපිල වැනි ගියේ ය. සාගරයෙ හි මත්ස්‍යයෝ දිය පිට ඉපිල කන් පත් වරල් පත් නො සොල්වා ඒ ධාතූන් වහන්සේ ගේ ප්‍රාතිහාර්යය බලන්ට සැරහි දිය පිට වැද හොත්තා හ.

## රජු ධාතූන් වහන්සෙ වැඩමවීම

එ වේලෙ හි ඉන්ද්‍රගුත්ත මහ තෙරුන් වහන්සේ සිතන සේක "වශවර්තිමාරයා මේ පූජාව උගුළුවනු පිණිස එන මුත්, ඔහු වලකමි" යි සිතා සතිස් ලක්ෂ දස දහස් තුන් සිය පණස් යොදුන් සක් පඤ්ච නිකායික තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ඇති සයානූ කෙළක් රහතුන් වහන්සේ ඒ ධාතූන් වහන්සේ පිරිවරා පස් තෙනක වැඩ හිඳ පිරිත් බැණ වදාළ සේක.

එ වේලෙ හි දුටුගැමුණු මහරජ එතනට අවුත් තමා හිස තුබූ රන් කරඬුව බහා ඒ කරඬුවෙහි ධාතූන් වහන්සේ වැඩ හුන් කරඬුවෙන් වඩාලා සත් රුවන් ආසනයෙහි තිබ් ය. නැවත සුවඳ ද සුවඳ සුනු ද සුවඳ මල් ද යන මේ ආදියෙන් ධාතූන් වහන්සේට ඒ රජ පූජා කොට පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳ දොහොත් මුදුනෙහි තබා මහත් වූ සොම්නසින් දෑස් දල්වා බලා වැඳ වැඳ සිටියේ ය. එ වේලෙ හි රජු බලා බලා සිටියදී ධාතූන් වහන්සේ ද තමන් වහන්සේ ගේ මුදුන් හි පිහිටි ධවලඡත්‍රය ද පෙනෙන්නේ ය. කුඩ ගත් මහා බ්‍රහ්මයා නො පෙනෙන්නේ ය. එ සේ ම තල්වැට වල්විදුනා ආදිය ධාතූන් වහන්සේට සලන්නා පෙනෙන්නේ ය. ඒ ඒ වස්තු ගෙන සිටි දෙවියෝ මිනිසුන්ට නො පෙනෙන්නා හ. දෙවියන් ගසන දිව්‍ය භෙරි ශබ්ද ද දිව්‍ය ගිතිකා ද ඇසෙන්නේ ය. දෙවතාවෝ මිනිසුන්ට නො පෙනෙන්නාහු ය.

## ලංකා රාජ්‍යයෙන් ධාතූන් වහන්සේ පිදිම

ඉක්බිති දුටුගැමුණු මහරජ මේ ආශ්චර්ය දැක ඉන්ද්‍රගුත්ත මහ තෙරුන් වහන්සේට මෙ සේ දැන්වී ය. "ස්වාමිනි, දෙවතාවෝ දිව්‍යච්ඡත්‍රයෙන් පූජා කළෝ ය. එ සේ හෙයින් මම ද මා සන්තක මනුෂ්‍යච්ඡත්‍රයෙන් පුදමි" යි දැන්වී ය. එ බස් ඇසූ ඉන්ද්‍රගුත්ත මහ තෙරුන් වහන්සේ ද "මහරජ එ ලෙස ම පිදිය යුත්තේ ය" යි වදාළ සේක. එ බස් ඇසූ ගැමුණු රජ තමා ගේ රන්පුඩු සේසතින් දාතූන් වහන්සේට ස්වරණාභිඩ්කාරයෙන් පැන් වත් කොට ලක්දිව පුදා, ආතත ය විතත ය විතතාන ය සන ය සුසිර ය යන පංචාංගික තූර්ය ද නාදයෙන් ඒ ධාතූන් වහන්සේට පූජා කොට නැවත ඒ දුටුගැමුණු මහරජ ඉන්ද්‍රගුත්ත මහ තෙරුන් වහන්සෙට මෙ සේ දැන්වී ය. "ස්වාමිනි, අප ගේ බුදු රජාණන් වහන්සේ දිව්‍යමනුෂ්‍ය යන මේ ඡත්‍ර දෙක ම දැරූ සේක් ද, ස්වාමිනි යි" දැන්වී ය.

එ සේ විචාළ රජ්ජුරුවන්ට තෙරුන් වහන්සේ මෙ සේ වදාළ සේක. එ සේ වදාළ තෙරුන් වහන්සේට රජ්ජුරුවෝ කියන්නාහු, "ස්වාමිනි, අනික් ඡත්‍ර නො දකිමි ද" යි විචාළ හ. "ගැමුණු රජ්ජුරුවන්ට අනික් ඡත්‍ර

නම් මෙ ලෙස ය" යි වදාරන තෙරුන් වහන්සේ චතුපාරිසුද්ධි සීල නමැති ආධාර ඇති සමාපත්ති නමැති දඬු ඇත ද්වාවීසති ඉන්ද්‍රිය නමැති ගොනැස් ඇති දශ බල නමැති පත් පෙළ ඇති මාර්ග ඵල නමැති පත් සෙවෙනි ඇති විමුක්ති නමැති උතුම් සේසත් ඡත්‍ර නංවා ප්‍රාඥා නමැති අභිෂේකයට පැමිණ සද්ධර්ම නමැති රත්න චක්‍රය පවත්වා දස දහසක් සක්වළෙ හි බුද්ධ රාජ්‍ය අත්පත් කොට රාජ්‍ය කොට වදාළ සේක් වේ දැ" යි කියා තෙරුන් වහන්සේ ඒ රජහට කී සේක. ඒ ඇසූ දුටුගැමුණු රජ "ධවලච්ඡත්‍ර තුනක් දැරූ බුදු රජාණන් වහන්සේට මේ මා සන්තක වූ එකුනනූසියක් යොදුන් ලඞ්කාද්වීපය පුදමි" යි ධාතූන් වහන්සේට තුන් වරෙක ලඞ්කාද්වීපය පිදි ය.

## ධාතු නිධානය හා ප්‍රාතිහාර්යය

ඉක්බිති දෙවතාවන් ද මිනිසුන් ද දිව මල් දිව සුවඳ දිව පහන් පුදන කල් හි, දිව්‍ය තූර්ය වල දිව්‍ය ගීතිකාදීන් පූජා කෙරෙමින් සිටියදි, දුටුගැමුණු මහරජ දාකරඬුව තමන් ඉසින් ගෙන හැර රුවන් මඬුවෙන් මැත් ව සයානූ කෙළක් රහතුන් වහන්සේ විසින් පිරිවරන ලදුව රුවන්වැලි දාගබ තුන් විටක් පැදකුණු කොට නැඟෙනහිරි දිසා භාගයෙන් දාගබට පැන නැඟී ඇතුළු දාකුසට රජ බැස සයානූ කෙළක් රහතුන් වහන්සේ ද ඇතළු දාකුසට බැස පිළිවෙළින් වැඩ සිටි සේක. එ වේලෙ හි දුටුගැමුණු මහරජ "තමා ඉස තුබූ දාකරඬුව බහා මැහැඟි වූ කෙළක් අගනා රිදි යහන් පිට ධාතූන් වහන්සේ තබමි" යි සිති ය. එසේ රජු සිතූ ක්ෂණයෙ හි දාකරඬුව ඒ රජු හිසින් සත් තලයක් පමණ තන්හි ආකාශයට පැන නැඟි තමන් වහන්සේ ම කරඬුවෙන් මැත් ව, නැඟෙනහිරි සක්වළ මුවවිට පටන් බස්නාහිරි සක්වළ මුවවිටට දසදහසක් සක්වළ මහාමෙරු පර්වත රුවන් ටැම් කාට හිඳුවා, ඊපිට මවන ලද රුවන් සක්මන් හි අටළොස් රියන් උස බුදුබඳ මවා වැඩ සිට, "සුප්පතිට්ඨිතපාදො හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිනි සනාභිකාන" යනාදි දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අශීතිඅනුබ්‍යිඤ්ජනයෙන් හා ව්‍යාමප්‍රභා කෙතුමාලා ලඞ්කාරයෙන් හෙබියා වූ, නිල පිත ලොහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර ය යි යන ෂඩ්වර්ණ඲ ඝන බුද්ධර්ශ්මි මාලාවෙන් දිලියෙන්නා වූ බුද්ධ රූපය මවාගෙන ගණ්ඩම්බ නම් අඹරුක් මුල් හි තීර්ථකයන් ගේ මන් බිඳිනා පිණිස යමක ප්‍රාතිහාර්යය කොට වදාළ සේක් ද එ සේ වූ රජහු ප්‍රධාන වූ සියලු පර්ෂද් මධ්‍යයෙ හි පෑ වදාළ සේක.

ඒ ධාතූන් වහන්සේ ගේ මෙබඳු වූ ආශ්චර්යයමත් ප්‍රාතිහාර්ය දුටු ස්ත්‍රී පුරුෂයන්ගෙන් දොළොස් කෙළක් පමණ සත්වයෝ සිවු පිළිසිඹියා පත් රහත් බවට පැමිණියා හ. සෙසු සෝවාන් සෙදගමි අනගැමි යන තුන් මහ තුන් ඵලයට පැමිණි සත්වයෝ මෙතෙකැ යි ගණන් නැත්තා හ. මෙ සේ ඒ ධාතූන් වහන්සේ අනෙකප්‍රකාර දිය කඳ ගිනි කඳ ආදි ප්‍රාතිහාර්ය දක්වා මවා ගත් බුද්ධවෙසය අන්තර්ධාන කොට රුවන් කරඬුවට වැඩ ඒ රුවන් කරඬුවෙන් ම අහසින් බැස දුටුගැමුණු මහ රජාණන් හිස් මුදුනෙ හි ම පිහිටි සේක. එ වේලෙ හි තොලබෝ විතෙක සුළං පුරාපී කලක් මෙන් ඒ රජ ප්‍රීතීන් පිනා, අභිෂෙකයට පැමිණි කලක් මෙන් "මාගේ මනුෂ්‍යාත්මභාවයෙ හි ඵල ලදිමි" යි, "ගිය ජාතියෙ හි පින් නො කළ එකෙක්මුත් නො වෙමි" යි සිත සිතා රජ තමා දැතින් දාකරඬුව ගුන තමා ගේ සොළොස් දහසක් බිසෝවරුන් පිරිවරන ලද්දේ සරහන ලද කෙළක් අගනා රිදී යහන සමීපයට ගොස් දාරකඬුව නැවත රුවන් කරඬුව හැර නැවත රුවන් කරඬුව මත්තෙහි තබා පෙරහා සුවඳ කවන ලද පැනින් රජ අත දෙවැ සිවුදෑ ගඳින් අත උළා රුවන් කරඬුව හැර ධාතූන් වහන්සේ ගෙන ඒ දුටුගැමුණු මහරජ මෙ සේ සිතී ය. කෙ සේ ද යත්,

“මේ ධාතූන් වහන්සේ, කිසි කෙනකුන් විසින් පන් දහසක් හවුරුදු කිසි උපද්‍රවයක් නො කොට හැකි වේ දැ යි සියලු සත්වයන්ට පිහිට ව වැඩ සිටිනා සේක් වී නම්, ලොවුතුරා බුදු රජාණන් වහන්සේ කුසිනාරා නුවර යමහල සල්රුක් දෙකට මධ්‍යයෙ හි පැනවූ යහන් හි උතුරු දිග සල් රුකට හිස ලා දකුණු දිග සල් රුකට පය ලා නැඟෙනහිරට පිට ලා බටහිරට මුහුණ ලා නැඟි නො සිටිනා සෙය්යාවෙන් බුදුන් පිරිනිවන් පානට වැඩ හොත් කලක් මෙන් මේ ධාතූන් වහන්සේ ද ඒ ලෙස ම මේ යහන් හි හෝනා සේක්ව" යි රජ සිතා උතුම් යහන මුදුනෙහි ඒ ධාතූන් වහන්සේ ඒ රජ තිබී ය. ඒ ක්ෂණයෙ හි ධාතූන් වහන්සේ ද රජ්ජුරුවන් සිතූ සැටියේ ම මාහැඟි වූ ඒ යහන් හි බුද්ධ විලාසයෙන් බැලූ බැලූවන් තාක් සතුටු සොම්නස් කරවමින් මුළු ලෝ බබුළුවමින් වැඩ හොත් සේක.

## ධාතු පූජා

මෙ සේ ඒ දාගැබ ධාතූන් වහන්සේ පිහිටියේ කවර දවසෙක ද යත්, ඇසළ මස පුර පසළොස්වක් ලත් මැදි පොහෝ දවස් උත්‍රසළ නකතින් පිහිටු වන ලද. ධාතු පිහිටවීම හා සමඟ මහ පොළොව නාරාවයෙන් ගැසූ ලෝතලී සමූහයක් මෙන් ගුගුරා පැන නැංගේ ය. මහාමේරු පර්වතය ද නැමී වැඳුම් ගෙන සිටියේ ය. සප්තකුල පර්වතයෝ ද ඉසින් ඉස අන්නාක් මෙන් ඔවුනොවුන් පැහැර නැටූ හ. සප්ත මහ විල් ද පස් පියුමෙන් සැදුණේ ය. ලුණුරස වූ මහ මුහුද ද මිහිරි පැන් විය. සදෙවුලොව දෙවියෝ ද බ්‍රහ්මයෝ ද සාධුකාර ශබ්ද පැවැත්වූ හ. අහස් හි විදුලිය පහළ වී ය. ඒ ඇසිල්ලෙ හි අකාල මෙඝ නඟා ගෙන පොකුරු වැසි ද වට. දස දහසක් සක්වළ එකකොලාහල විය. මේ ආශ්චර්ය්‍යගෙන දැක පහන් වූ දුටුගැමුණු මහ රජ ද තමා හිසට කරන ලද රන්දඬු ඇති ධවලච්ඡත්‍රයෙන් ඒ ධාතූන් වහන්සේට පූජා කොට මේ සියලු ලංකාද්වීපයෙහි රාජ්‍යය සත් දවසක් ඒ ධාතූන් වහන්සේට පූජා කොට නැවත තමා පැලඳ ගෙන සිටියා වූ තිස් දහසක් අගනා ආභරණ ද ගලවා ඒ ධාතූන් වහන්සේට පිදී ය. මෙ සේ ඒ රජ්ජුරුවන් පූජා කළ වෙලෙ හි ඒ රජ්ජුරුවන් ගේ සොළොස් දහසක් බිසෝවරු ද රාජ රාජ මහා අමාත්‍යයෝ ද නන්දිමිත්‍රාදි දශමහා යෝධයෝ ද එකොළොස් දහස් එක් සියයක් පමණ සිරි යෝධයෝ ද බොහෝ ස්ත්‍රී පුරුෂයෝ ද දිව්‍ය බ්‍රහ්මයෝ ද නාග සුපර්ණයෝද ලක්ෂ රාක්ෂයෝ ද සිද්ධ විද්‍යාධරයෝ ද යන මේ සියල්ලෝ ම තම තමන් පැලඳ ගෙන සිටි ආභරණ ගලවා ධාතූන් වහන්සේට පූජා කළා හ. එ සේ හෙයින් තුන් ලෝ වාසීන් විසින් පුදන ලද්දාවූ ජීවමාන සර්වඥයන් වහන්සේට මෙන් ආදර සහිතව යමක්හු විසින් පුදන ලද්දා වූ, එසේ ම අබ ඇටක පමණ වූ ඒ සර්වඥයන් වහන්සේගේ ධාතුවක් යම් කෙනෙක් පුදද් ද, ඒ චිත්ත ප්‍රසාදයෙ හි කුශල විපාකය ජීවමාන සර්වඥයන් වහන්සේට කළ පූජාව හා සමාන ය යි දැන සියලු සත්වයන් විසින් ම ඒ ධාතූන් වහන්සේට මල් පහන් පිදිය යුත්තේ ය.

ඉක්බිති දුටුගැමුණු මහරජ සිවුරු පිළි ද උක් සකුරු එළඟිතෙල් මේ ආදි බෙහෙත් ද සයානු කෙළක් රහතුන් වහන්සේට පිළිගන්වා දොහොත් මුදුනෙහි තබා ගෙන, "ස්වාමීනි, තුන් යම රාත්‍රිය මුළුල්ලෙ හි මේ ධාතූන් වහන්සේ පිරිවරා පිරිත් බැණ වදාළ මැනැව" යි ආරාධනා කෙළේ ය. රහතුන් වහන්සේ ද ඒ රජුගේ ආරාධනායෙන් එ දවස් රාත්‍රිය මුළුල්ලෙ හි පිරිත් බැන වදාළ සේක. දෙවන දවස් රජ නුවර බෙර ලැවී ය. කුමක් කියා බෙර ලැවී ද යත්, 'සියලු සත්වයෝ ම සත් දවසක් මුළුල්ලෙ හි ධාතූන් වහන්සේට සුවඳ සුනු සුවඳ මල් පහන් තෙල් ද යන මේ ආදිය ගෙනහැර ධාතූන් වහන්සේ පූජා කොට වඳිත්ව" යි කියා මේ සැටියේ බෙර ලැවී ය. ඉන්දගුත්ත නම් මහ තෙරුන් වහන්සේ ද" සියලු ලංකාද්වීපයෙ හි සියලු ස්ත්‍රී පුරුෂයෝ මල් පහන් පූජා ගෙනහැර පෙහෙව ගෙන කිසි ආයාසයක් නැති ව තම තමන් ගේ ගෙට

යන්නවුන් මෙන් ධාතූන් වහන්සේ වැඳ මේ ඇසිල්ලෙහි ම යෙත් ව" යි කියා අධිෂ්ඨාන කොට වදාළ සේක. ඔබ ගේ ඒ අධිෂ්ඨාන බලයෙන් මේ ලංකාද්වීපයෙ හි සියලු මනුෂ්‍යයෝ ම එ දා ම අවුත් ධාතූන් වහන්සේ වැඳ පුදා එ ම දවස් ම තම තමන් ගේ ගම්බිම්වලට ගියා හ.

## ධාතු ගර්භය වැසීම

ඉක්බිති රජ්ජුරුවෝ සද්දවසක් මුළුල්ලෙ හි සයානු කෙළක් රහතුන් වහන්සේට මහ දන් දී, සද්දවස ගිය කල අට වැනි දවස් රජ්ජුරුවෝ මහා සංඝයා වහන්සේට මෙ සේ දන්වන්නාහු, 'ස්වාමීනි, මා විසින් ධාතු ගර්භයෙහි කළ මනා කාර්යය කොට නිමවිමි. එ සේ හෙයින් ස්වාමිදරුවන් විසින් මෙහෙවන් පහණින් ම දාකුස වසා වදාළ මැනව" යි දැන්වූ ය. එබස් ඇසූ මහා සංඝයා වහන්සේ ද උත්තර සුමන නම් සාමණේර දෙදෙනා වහන්සේ කැඳවා වදාරන සේක් "තොප විසින් පෙර ගෙනා මෙහෙවන් පහණින් ධාතු ගර්භය වසව" යි වදාළ සේක. ඒ දෙදෙනා වහන්සේ ද හැම දෙනා වහන්සේ විසින් වදාරන ලද මෙහෙවර අසාගෙන වැලි මළුයෙහි සඟවා තුබ මෙහෙවන් පහණ ගෙනවුත් දාකුස වසා වදාළ සේක. ඉක්බිති සයානු කෙළක් මහරහතන් වහන්සේ සමඟ අධිෂ්ඨාන කොට වදාරන සේක් "මේ දුටුගැමුණු මහ රජහු විසින් මේ දාකුසෙ හි ගැල්වූ සුවඳ පන් දහසක් හවුරුදු මුළුල්ලෙහි නො විය ලෙව යිම, දාකුස පිදූ මල් ද නො මලාව යි. රන් වැට ඇවිළෙන සුවඳ තෙල් පහන් ද නො නිවේ ව යි. පුදන ලද රුවන් හි මල නො ගනීව යි, මේ දාකුස පූජා භාණ්ඩ මරහු විසිනුත් සොලවාලිය නො හේව යි, මෙහෙවන් පහණ ද කෙසඟක් පමණකුත් හිරක් නැති ව විශේෂයෙන් සන්ධි ගැළපීයේව යි, පරසතුරන් විසින් පහණ පමණකුත් දැක්ක නො හේව" යි, කියා මේ සැටියේ අධිෂ්ටාන කොට වදාළ සේක. මෙ සේ ඒ දුටුගැමුණු මහරජ ධාතු නිධානය නිමවා නුවරට වැද මේ සැටියේ කියා බෙර ලැවී ය. "මා විසින් බඳවන ලද මහ දාගබ ධාතු නිධාන කරනු කැමති කෙනෙක් තමන් තමන් ගේ ධාතූන් වහන්සේ ගෙන හැර මෙහෙවන් පහණ මුදුනෙ හි නිධාන කෙරෙත්ව" යි කියා බෙර ලැවී ය. එ පවත් ඇසූ බොහෝ දෙන තමන් තමන්ගේ ශක්ති වූ පරිද්දෙන් රන් කරඬු රිදී කරඬු කරවා ඒ කරඬුවල තමන් තමන් ගේ ධාතූන් වහන්සේ පිහිටුවා ගෙනවුත් මෙහෙවන් පහණ මත්තෙහි නිධාන කළාහු ය. එ සේ හැම දෙනා විසින් නිධාන කරනු පිණිස ගෙනා ධාතූන් වහන්සේ කෙනෙක් ඇති සේක් ද යත්, දහසක් දෙනා වහන්සේ ය යි දත යුතු. එ සේ හෙයින් සත්පුරුෂයන්ගේ සිත් පහදවනු පිණිසකියන ලද ථූපවංසයෙ හි ධාතු නිධාන කථාවමෙලෙස කියා නිමවන ලදැ යි දත යුතු.

## ගැමුණු රජු ගේ ව්‍යාධිය හා කුමරු ගේ පැමිණීම

මෙ සේ ඒ දුටුගැමුණු මහරජ ඒ සියලු ධාතූන් වහන්සේ නිධාන කරවා දාගබ බඳවන්නේ බුබ්බුලාකාරය හා සිවුරැස් කොටුව බඳවා නිමවිය. ඉක්බිති ඒ දාගබ කැරැල්ල හා කොත් කර්මාන්ත හා සේසත හා දාගබ සුනු කර්මාන්ත හා මේ හැම නො නිමෙන තෙක් ම ඒ දුටුගැමුණු මහරජ මරනාන්ත ව්‍යාධියෙන් ගිලන් වූ රජ දිගාමඬුල්ලේ හුන් මලණුවන් තිස්ස කුමාරයන් ගෙන්වා මලණුවන් ඉස හයා, තමන් ළෙහි තබා ගෙන සිඹ සනහා "මලණ්ඩ, මේ ලොකයෙ හි සහාය නම් ඉතා ලාමක දෙයෙක. එ සේ හෙයින් නෑයන් මිත්‍රයන් විසින් සහායයෝ නම් පරලොව සහායයෝ ම ය. එ බැවින් මේ දාගබ නො නිමි සියලු කර්මාන්ත නිමවා, නො මියන තෙක් මා ඇස දක්වා මා සතුටු කරව" යි කියා මේ ලෙස මලණුවන් තිස්ස කුමාරයන්ට සම්මත කළේ ය.

බෑණන් කී එතෙපුල් ඇසූ තිස්ස කුමාරයෝ නුවනින් කඳුළු ඉස "මාගේ බෑණන් වහන්සේ ඉතා ම දුර්වල සේක. එ සේ හෙයින් මේ දාගැබෙහි නො නිමි කර්මාන්ත උපායකින් මුත් අනික් සැටියෙක කොට නිමවිය නො හැක්කැ" යි සිතා භාණ්ඩාරයෙන් සළුපිළිසම්බඩම් මැත් කරවා රදවුන් ලවා අතිධවල කොට දෙව නංවා සන්නාලින් ලවා මස්වා, කුළුපත්තන් ලවා හුණුදඬුයෙන් කැරැල්ල සැටියේ සැර බඳවා එක්සිය විසි රියන් උස ඇති දාගබ් වහන්සේ පළමු සුදු කරවූ පිලියෙන් සන්නාලින් ලවා පිළිකස්සෙහි ලවා චිත්‍රාකාරයන් ලවා ඒ දාගබ අනෙක ප්‍රකාර වූ සිතියම් ද කරවා මේ සැටියේ දාගබ කර්මාන්ත කරවා ඒ තිස්ස කුමාරයෝ දාගබ කොත් පලඳවා මුදුනෙ හි ධවලච්ඡත්‍ර නංවා විශ්වකර්මයා විසින් කොට නිමි කර්මාන්තයක් මෙන් විසිතුරු කොට දාගබ සියලු කර්මාන්ත නිමවා බෑණන් සමීපයට ගොස් "ස්වාමිනි, මා විසින් දාගබ කළමනා සියලු කර්මාන්ත නිමිණැ" යි රජ්ජුරුවන්ට දැන්වූ හ. එ වේලෙ හි මලණුවන් කී බස් ඇසූ ගැමුණු රජ සතුටුව "එ සේ වීනම් මලණ්ඩ, දාගබ් වහන්සේ මා ඇස දක්ව" යි කි ය. එ වේලෙ හි තිස්ස කුමාරයෝ බෑන් රන්සිවිගෙයකින් ගෙන වුත් රුවන්වැලි දාගබ පැදකුණු කරවා දකුණු දිග දොරටුව සමීපයෙ හි බිම අතුළමනා ඇතිරිලි අතුට ඒ මත්තෙහි රජ්ජුරුවන් සැතැප්පූ හ. එ හි සැතපුණු රජ්ජුරුවෝ දකුණැලයෙන් නැමී රුවන්වැලි දාගබ වඳිනාහු ය. වමැලයෙන් නැමී නව මහලක් ඇති ලෝවා මහසාය දක්නාහු ය. මෙ සේ ඒ දෙක බල බලා සිත ප්‍රසන්න ව ප්‍රීතියෙන් පින පිනා ගැමුණු රජ්ජුරුවන් වැදහොත් වේලෙහි ඒ ඒ තෙන වැඩ හුන් සියලු මහා සංඝයා වහන්සේ රජ්ජුරුවන් ගිලන් බව අසා සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේගේ පස්වා දහසක් මුළුල්ලෙ හි පවත්නා ලෝක ශාසන දෙකට බොහෝ උපකාරී වූ දුටුගැමුණු රජ්ජුරුවන් සුවදුක් විචාරනු පිණිස ඒ ඒ තැනින් ආකාසයෙන් වැඩියා වූ භික්ෂූන් වහන්සේගෙන් සයානූ කෙළක් පමණ රහතුන් වහන්සේ රජ්ජුරුවන් පිරිවරා වැඩ සිටි සේක. බිමින් වැඩි පෘථග්ජන භික්ෂූන් වහන්සේ මෙතෙකැ යි ගණන් නැති සේක. ඉක්බිති එසේ රැස්වූ මහා සංඝයා වහන්සේ රජ්ජුරුවන් මැදි කොට මුළු මුළු වගෙන පිරිත් බැණ වදාළ සේක.

## ථෙරපුත්තාභය හිමියන් රජුට බණ කීම

එ වේලෙ හි ගැමුණු මහ රජ ඒ සමාගමයන්හි ථෙරපුත්තාභය මහ තෙරුන් වහන්සේ නො දැක මෙ සේ සිතී ය. කෙ සේ ද යත්, "මා හා සමග මියුහුණේ පටන් දෙමළුන් හා කැටිව අටවිසි මහ සටහනක් කරන කල් හි මා අත් නො හැර පසු නො බැස, දැන් මරහු හා කරන යුද්ධයෙ හි මා පරදිනා බව දැන දෝ හෝතෙරුන් වහන්සේ නො වඩිති සිතමි" රජ්ජුරුවන් සිතූ ක්ෂණ යෙහි ඒ ථෙරපුත්තාභය මහ තෙරුන් වහන්සේ ගුත්හල කිරිදිහොය අසල අඤ්ජලි පර්වතයෙ හි පන්සියයක් රහතුන් හා සමග වසන සේක් රජ්ජුරුවන් සිතූ සිත් තමන්නහන්සේ ගේ පරසිත් දන්නා නුවණින් දැන වදාරා රහතුන් වහන්සේ පන්සියයක් පිරිවරන ලදුව ආකාසයෙන් අවුත් ගැමුණු රජ්ජුරුවන් අභිමුඛයෙ හි පෙනුණු සේක. එ සේ වැඩියා වූ තෙරුන් වහන්සේ, ගැමුණු රජ්ජුරුවෝ දැක සතුටුව තමන් අභිමුඛයෙ හි තෙරුන් වහන්සේ වඩා හිඳුවා මෙ සේ දන්වන්නාහු, 'ස්වාමීනි, නුඹ වහන්සේ ඇතුළු වූ දශමහා යෝධයන් හැරගෙන දෙමළුන් හා සමග අටවිසි මහා සටනක් කෙළෙමි. දැන් මම හුදකලාව මරු හා සමග යුද්ධයට පටන් ගතිමි. ඒ මරු නැමැති සතුරා පරදවා ගත නො හෙමි. එ සේ හෙයින් නුඹ වහන්සේ ද ස්වාමිනි, මට සහාය ව වදාළ මැනවැ"යි කියා තෙරුන් වහන්සේව දැන්වූ හ. ඉක්බිති රජ්ජුරුවන් විසින් කියන ලද එබස් ඇසූ ථෙරපුත්තාභය මහ තෙරුවන් වහන්සේ වදාරන සේක, "මහ රජ තෙපි භය නො ගනුව. කෙලෙස් නමැති සතුරා තොප පරදවා ගත නො හෙයි. මරු නමැති සතුරා හා නො දිනිය හැක්කේ ය" යි වදාරා, නැවත ඒ තෙරුන් වහන්සේ රජහට මෙලෙස අවවාදානුශාසනා කොට වදාළ සේක. "දෙවයෙනි, සියලු ලෝවැසියෝ ම ජාතිය අනුව ගියාහු ය. ජරාවෙන් මඩනා ලද්දාහු ය. මරහු විසින් පරදවනු ලද්දාහු ය." යි වදාරා නැවත අනිත්‍යතාව රජ්ජුරුවන්ට වදාරන තෙරුන් වහන්සේ මෙසේ වදාළ සේක. "යම් සේ වාතයෙන් නස්නා

කපෙ හි පළමු කොට සිහින් වැලිය, අකුරුකැට පහණ පර්වත පන්දුවට සේ උඩ නඟ නඟා ඉක්බිති හිමාලය පර්වත, සක්වළගල්, මහාමේරු පර්වත යන මෙකී සියල්ල ද පොළොවින් උපුටා බාලයන් කෙළනා අත් බඹරක් මෙන් ආකාසයෙ හි නඟා ගෙන ඊ ඊ පැහැර සුනු විසුනු කොට ඉන් රජස් පමණකුත් බිම ගිය නො දී ආකාසයෙ හි ම නසාපියා කෙළවර වාතය තෙමේ ම නැසී යන්නේ ය. එ පරිද්දෙන් ම මහරජ, සියලු දෙව් බඹුන් ආදි වූ සත්වයන් ජරා මරන යන දෙදෙන එක් ව ගෙන, සත්රුවන් පහළ ව සතර මහා ද්වීපයට ආකාශයෙන් ගොස් අනුශාසනා කොට දාවල් බත් දඹදිව තමන් ගේ ගෙයිදී අනුභව කොට රාජය කරන්නා වූ මේ සා මහත් ආනුභාව සම්පන්න වූ සක්විති රජදරුවන් ද, ප්‍රදේශ රජදරුවන් ද, මහාසම්මත රොජ වරරොජ කල්‍යාණාදි වූ අසංඛ්‍යායුෂ්ක රජදරුවන් ද, මහ පිනැති ජොතිය සිටාණන් මැඩ මහ සිටාණන් ආදි වූ බොහෝ සම්පත් ඇති සිටුවරුන් ද, මහත් වූ ශක්ති ඇති වාසුදේව බලදෙවාදි දසබෑ රජදරුවන් ද, ඍද්ධිමතුන්ට අගතැන් පත් වූ මුගලන් මහ තෙරුන් වහන්සේ ආදි වූ ඍද්ධි ඇත්තවුන් ද, නුවණැත්තන්නට අගතැන් පත් වූ ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ ආදි වූ නුවණැත්ත වුන් ද, ස්වයම්භූඥානයෙන් පැමිණෙන ලද ගුණ විශේෂයන් ඇති පසේ බුදුවරුන් ද, සියලු ගුණයෙන් අපරිමිත වූ අතුල්යේ වූ සම්‍යක් සම්බුද්ධයන් ද මරණ නමැති මහ ඇත්හු විසින් මඩනා ලද කල් හි, රාගාදි සියලු කෙලෙසුන් විසින් ගැවසි ගත් අවශෙප සියලු සත්වයන් මරණ නමැති බඩබා මුඛයෙ හි පතිත ව විනාශයට පැමිණෙති යනු ආශ්චර්ය නො වෙයි" වදාරා, නැවත රජ්ජුරුවන්ට අවවාද කරන තෙරුන් වහන්සේ, "මහරජ, ගිය ජාතියෙ හි තොප ගේ කුශලයෙ හි අදහස් මහත් බැවින් එළඹ සිටියා වූ දිව්යි ලොකයෙ හි දිවසුව හැර තෙපි මේ මනුෂ්‍ය ලෝකයට අවුත් මේ රාජවංශයෙ හි ඉපද බොහෝ කුසල් කොට බුදුසසුන් බැබළවූ හ. එ සේ හෙයින් දෙවයෙනි, සෙසු සැකයක් නො සිතා අද දක්වා තොප විසින් කරන ලද සියලු පින්කම් සඳහන් කරව" යි වදාළ සේක. එ වේලෙ හි එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටු ව "ස්වාමීනි" නුඹ වහන්සේ මරු හා කරන යුද්ධයෙ හි ද මට පිටිවහල් වූ සේකැ" යි කියා ලබන ලද අස්වැසිලි ඇතිව පින් කිරියවත් කියවන්ට එ වේලෙ හි ම සම්මත කළ හ.

## පින් පොත කියැවීම

ඉක්බිති පින්කිරියවත් කියවන ලියන්නෝ ගැමුණු මහරජහට මෙ සේ කියවූ හ. "දෙවයන් වහන්ස, අද දක්වා නුඹ වහන්සේ එකක් අඩු විහාර සියයක් කරවූ සේක. එ සේ කරවූ විහාරවලින් මිරසවැටි විහාරය එකුන් විසි කෙළක් වස්තු වියදම් කොට කරවන ලදි. නැවත උතුම් වූ ලෝවාමහ පාය තිස් කෙළක් වස්තු වියදම් කොට කරවූ සේක. නැවත රුවන්වැලි මහ සෑයෙහි අගය නැති අනර්ඝ වස්තු සූවිස්සක් හැර කරවන ලද සෙසු කර්මාන්තයෝ කෙළ දහසක් වස්තු අගනා හ. නැවත මිරිසවැටි විහාරය පිළිගන්වන සත් දවස ද, ලෝවාමහපාය පිළිගන්වන සත් දවස ද රුවන් වැලි දාගබ මඟුල් උළු ඔබන සත් දවස ද ධාතු නිධාන කළ සත් දවස ද යන මේ සිව් තැන් හි සතර දිගින් වැඩි භික්ෂූ භික්ෂූණී සංඝයා වහන්සේට මහ දන් දී තුන් සිවුරු පාත්‍ර දෙවූ සේක. සූවිසි මහ වෙසක් පූජාවක් කරවා වදාල සේක. නැවත සිංහල ද්වීපයෙ හි සියලු භික්ෂූ සංඝයා වහන්සේට තුන් වරෙක තුන් සිවුරු පාත්‍ර දෙවූ සේක. සත් සත් දවස් ලංකා රාජ්‍ය පස් වරෙක තුනුරුවන්ට පිදූසේක. එළඟිතෙලින් සකස් සුදු කඩින් පාන් පියලි අඹරා දොළොස් තෙනක් නිරන්තරයෙන් පාන් දහසක් පූජා කළ සේක. ලංකාද්වීපයෙ හි අටළොස් තෙතෙක වෙදහල් නංවා වෙදවරුන්ට භාණ්ඩා රයෙන් මිල දි රෝගී සියලු ගිලනුන්ට පිළියම් කරවා වෙදවරුන් කී සැටියේ නිරන්තරයෙන් බතුන් දෙවා වදාළ සේක. නැවත සිවුසාළිස් තෙනෙක මනා කොට කරවන ලද මීපිඩු දන් දෙවූ සේක. එ සේ ම සිවු සාළිස් තෙනෙක නිරන්තරයෙන් තෙල් උපුල්වා සියල්ලවුන්ට කිරිබත් දන් දෙවූ සේක.

"නැවත එපමණ තෙන එළඟිතෙලින් බදනා ලද පුළුබ් බදනා හා බත් නිරන්තරයෙන් ම දෙවා වදාළ සේක. මසකට දොළොස් දවසක් බැගින් මේ සියලු ලංකාද්වීපයෙ හි ඇතැ යි කී සියලු විහාරයකට ම පාන් තෙල් තබා දෙවූ සේක. එ සේ ම හැම තැන් හි ම මැදහත් ව පසිඳිනා ධර්මාධිකරණ ද කරවූ සේක. සියලු ලංකාද්වීපයෙහි ගර්භිණීන්ට මිරිස් ලුණු ද ප්‍රසව කරවූ මිනිනඹුවන්ට පිළි ද භාණ්ඩාරයෙන් දෙවූ සේක. ලංකාද්වීපයෙ හි සියලු සතුන්ට, දවල් ගෝනි ඇද රෑ සයින් සිටිනා ගොනුන්ට මීයේ වැකූ පිදුරු දෙවූ සේක. නැවත මේ සියලු දානයට වඩා ලොවුතුරා බුදුන් ගේ ධර්ම දානය ම උත්තම ය යි අසා ලෝවාමහපායෙ හි රැස් ව වැඩ හුන් සයානු කෙළක් රහතුන් වහන්සේ මාධ්‍යයෙ හි "ධර්ම දානයක් දුන මැනවැ" යි ධර්මාසනයට පැන නැඟී හිඳ මංගල සූත්‍රය කියන්ට පටන් ගත් සේක. වැඩ හුන් මහා සංඝයා වහන්සේ බලා ඔබ කෙරෙහි ගෞරවයෙන් සූත්‍රය කියා නිමවා ගන්ට නො පොහොසත් ව "බණ කීම නම් ඉතා බැරි දෙයෙකැ" යි සිතා එතැන් පටන් මේ සියලු ලංකාද්වීපයෙ හි හැම දෙනාට බණ අසන්නට ගමකට පණ්ඩිත කෙනකුන් බැගින් සලස්වා ඒ සියලු පණ්ඩිතවරුන්ට බත් පිළි තමාගෙන් දී ඔවුන්ට සත්කාර කොට ලංකාද්වීපයෙ හි සියලූ තැන් හි ම බණ කියවූසේක. "නැවත එ සේ බණ කියන පණ්ඩිතවරුන්ට භාණ්ඩාරයෙන් පෝය කට එළඟිතෙල් නැළියක් බැගින් මසකට එළඟිතෙල් සතර නැළියක් ද උක් සකුරු ද උක් දඬු ද කෙහෙල් වැලවරකා ද සතරඟුලක් දිග ඇති වැල්මී ගැටයක් ද පොහොයකට පිළීසළක් දැ යි යන මෙ කී සියල්ල පණ්ඩිත වරුන්ට දී ධර්මදානයත් සියල්ලවුන්ට දෙවූ සේක.

## මරණාසන්න මොහොතෙ හි සිත පැහැදවූ දාන දෙක

නැවත කොළොම්ගල මඩු කන සායෙ හි මාහැඟි වූ කන තුබූ කුණ්ඩලා හරණ දෙක දී තණසාලේ පැසිබත් මුලක් හැර ගෙන ක්ෂීණාශ්‍රවයන් පස දෙනකුන් වහන්සේට ප්‍රසන්න වූ සිතින් දන් දි වදාළ සේක. නැවත යුදගණා පිටියෙ හි දි මලණුවන් වහන්සේ හා සමග කළ යුද්ධයෙ හි පැරද පලා යන්නා වූ නුඹ වහන්සේ සප්පඳුරුහොය සැතපි වැඩ හිඳ "ලද බත් දන් දී කමි" යි කියා ඇමැත්තවූ ලවා "සිහා වඩනා කලැ" යි හඬගාවා, එ වේලෙ හි ආකාසයෙන් වැඩියා වූ ක්ෂීණාශ්‍රව භික්ෂු කෙනකුන් වහන්සේ දැක, 'බතෙ හි උපෙක්ෂාවක් නො කොට තැටිබත් දෙන ලදැ" යි කියා මේ සැටියේ ලියන්න වුන් විසින් පින්කිරියවත් කියවූ කල් හි ඒ පින්කිරියවත් අසා සතුටු වූ දුටුගැමුණු මහරජ පිනිකිරියවත් කියවූ කල්හි ඒ පින්කිරියවත් අසා සතුටු වූ දුටුගැමුණු මහරජ පින්කිරියවත් කියා තමන් සිත් සතුටු කළ ඒ ලියන්නන්ට අපමණ සම්පත් දී පිනිකිරියවන එ පමණකින් තබා පියා "මෙ කී සියලු පින්කම්, රාජශ්‍රීයෙ හි සිට කළ හෙයින්, මා සිත සතුටු කොට ලිය නො හෙයි. මාගේ ජීවිතයෙ හි අපේක්ෂාවක් නො කොට දුක්පත් ව සිටි මා විසින් දෙන ලද්දාවූ මේ දන් දෙක හා සම දන් දෙකක් නැත. මෙ පමණෙක් ම මට සෑහෙ" යි කී රජ්ජුරුවන්ගේ බස් ඇසූ ථෙරපුත්තාභය මහ තෙරුන් වහන්සේ, "දෙවයෙනි, සිත පහදවා ගතමනා තෙන ම ප්‍රසාද එළවූව. එ සේ හෙයින් ඒ දන් දෙක ම කිසි කෙනකුන්ට පීඩාවක් නො කෙට දැහැමින් සෙමෙන් ලබන ලද දෙය හෙයින් ද තමා නො බලා නො පසුබැස දන් දුන් හෙයින් ද පිළිගන්නවුන්ගේ සිත් පුරා දුන් හෙයින් ද ප්‍රීති බලවත් හෙයින් ශ්‍රද්ධාවෙන් දුන් හෙයින් ද ධර්මය නිරවශෙෂයෙන් අනුභවයට ගිය හෙයින් දැයි මේ පස් කාරණයෙන් මහා එල ය" යි වදාරන මහ තෙරුන් වහන්සේ "තණසාලේ පැසිබත් දන් ගත් තෙරුන් වහන්සේ අතුරෙන් මලියදෙව මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේ පිළිගත් බත් කොටස ගෙන ගොස් සමනළ පර්වතයෙ හි වසන පන්සියයක් රහතුන් වහන්සේට දන් දී වළඳා වදාළ සේක. අනික් පය්විවාලක ධම්මගුත්ත නම් තෙරුන් වහන්සේ තමන් වහන්සේ පිළිගත් බත් කොටස ගෙන ගොස් කැලණී මහා විහාරයෙ හි පන්සියයක් දෙනා වහන්සේට දන් දී වළඳ වදාළ සේක. තලඟුරු විහාරවාසී ධම්මගුත්ත නම්

මහ තෙරුන් වහන්සේ තමන් ලත් බත් කොටස ගෙන ගොස් පුවඟු දිවයින දොළොස් දහසක් රහතුන්වහන්සේට බෙදාදි වළඳා වදාළ සේක. මහාවන වාසි තිස්ස නම් මහතෙරුන් වහන්සේ තමන්වහන්සේ ලත් බත් කෙටස ගෙන ගොස් කෙසකුට නම් විහාරයෙ හි වසන සැටදහසක් රහතුන්වහන්සේට බෙදා දී වළඳා වදාළ සේක. මහාහක්ග නම් තෙරුන්වහන්සේ තමන්වහන්සේ පිළිගත් බත් කොටස ගෙන ගොස් අක්කානගර නම් විහාරයෙ හි වසන පන්සියයක් රහතුන්වහන්සේට බෙදා දී වළඳා වදාළසේක. තැටිබත් පිළිගත් නායක තෙරුන්වහන්සේ පුවඟු දිවයින දොළොස් දහසක් දෙනාවහන්සේට දන්දි වළඳා වදාළසේකැ"යි කියා මේ සැටියේ ඵෙරපුත්තාභය මහතෙරුන්වහන්සේ රජ්ජුරුවන් සිත් පැහැදවූ සේක.

## රජුගේ ආයාචනය හා අනුශාසනය

ඉක්බිති දුටුගැමුනු මහරජ තෙරුන්වහන්සේට මෙ සේ දැන්විය. "ස්වාමිනි, මම සූවිසි හමුරුද්දක් රාජ්‍ය කරන්නෙම් භික්ෂු සංඝයාවහන්සේ ට උපකාරිව සිටියෙමි. එ බැවින් මාගේ ශරීරය ද සංඝයාවහන්සේට උපකාරී වේ දැ යි, එ සේ හෙයින් මා මළ කල මාගේ ශරීරය රුවන්වැලි දාගබ් වහන්සේ සමිපයෙහි පොහෝ කරන මළුවෙහි දවා වදාළ මැනවැ"යි දන්වා ඉක්බිති දුටුගැමුණු මහරජ මලණුවන් තිස්ස කුමාරයන් ගෙන්වා කියන්නේ "මලණ්ඩ, තිස්ස කුමාරයෙනි, මාගේ මහ දාගැබෙ හි නො නිමි කර්මාන්ත යෙක් ඇත්නම්, ඒ මෙහෙවර ද යහපත් කොට කරවා ලව. සවස උදැසන ම දාගබ්වහන්සේට මල්පහන් පූජා කරව. දවස තුන් වේලෙ හි සක්පඤ්ච මේ ආදිවූ පූජා සත්කාර කරවව. මා තබාලූ දන්වැට නො පිරිහෙළා දෙවාලව. මහසංඝයාවහන්සේට කළ මනා සියලු උපස්ථානයෙ හි ප්‍රමාද නො වව. තොප දිව්රැක්මෙ හි ද සිහි ඇති වව. ලංකා වාසීන්ට කිසි පීඩාවක් නො කොට දැහැමෙන් සෙමනේ රජ කරව"යි මෙ ලෙස මලණුවන්ට අනුශාසනා කොට මුවෙන් නො බැණ වැදහොත් රජ්ජුරුවන්ට සයානු කෙළක් රහතුන්වහන්සේ බණපිරුවන්ට පටන්ගත් සේක. එ වේලෙ හි සදිව්‍යලොකයෙන් දෙවියෝ රථසයක් ගෙනවුත් පිළිවෙළින් තබා ආකාසයෙ හි සිට ගෙන රජ්ජුරුවන්ට මෙ සේ දන්වන්නාහු, "දෙවයෙනි, අප ගේ දෙව්ලොව රම්‍යය. අප ගේ දිවය ලෝකයෙ හි ආයුෂයත් බොහෝ ය. එ සේ හෙයින් අප ගේ දිව්‍ය ලෝකයට වැඩිය මැනව, අප ගේ දිව්‍යලොකයට වැඩිය මැනවැ" යි කියා සදෙව්ලොව දෙවියෝ වෙන වෙනම රජ්ජුරුවන්ට ආරාධනා කළ හ. දෙවියන් කී බස් ඇසූ රජ්ජුරුවෝ දෙවියන්ට කියන්නාහු, "යම්තාක් මම බණ අසම් ද, ඒතාක් ඉවසව" යි ඒ දෙවතාවන්ට දකුණත ඔසවා සංඥා කළ හ. රජ්ජුරුවන් කළ සංඥාව දැක මහාසංඝයා වහන්සේ පිරුවමින් සිටි බණ තබා වදාළ සේක.

එ වේලෙ හි රජ්ජුරුවෝ බණ වැලකූබව දැක "ස්වාමිනි, පිරුවමින් සිටි බණ නොපිරුවා තබා වදාළේ කුමකට දෝහො,යි විචාළ හ. එ විට රජ්ජුරුවන්ට මහාසංඝයා වහන්සෙ වදාරනසේක්, "දෙවයෙනි, තොප අතින් සංඥා කොට වැකූ හෙයිනැ"යි වදාළ සේක. එතෙපුල් ඇසූ රජ්ජුරුවෝ කියන්නාහු, 'ස්වාමිනි, මම නුඹවහන්සේලා පිරිවානා බණ වලකා සංඥා කෙළෙම් නො වෙමි. දෙවතාවෝ සදිව්‍ය ලොකයෙන් රථ සයක් ගෙනවුත් සිට තම තමන්ගේ දිව්‍ය ලොකයට මා යනු කැමැති ව ආරාධනා කළෝ ය. එ සේ හෙයින්, 'යම් තාක් මම බණ අසම්ද, ඒ තාක් බලව'යි කියා සංඥා කෙළෙමි,යි දැන්වූ හ. ඒ අසා සමහර කෙනෙක් සිතන්නාහු, "මේ දුටුගැමුණු මහ රජ්ජුරුවෝ මරණ භයින් භයපත්ව නන්දොඩන්නාහ. එ බැවින් මරණෙ හි නො බන කෙනෙක් නම් නැතැ"යි සිතූ හ. ඔවුන් ගේ සිත් දත් ඵෙරපුත්තාභය මහ තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට වදාරන සේක්, "දෙවයෙනි, සියල්ලවුන් ගේ සැක දුරුකොට සදෙව්ලොවින් ආ රථවල

මල්දම් එල්ව"යි වදාළසේක. එවේලෙ හි තෙරුන්වහන්සේ වදාළ බස් ඇසූ දුටුගැමුණු මහරජ්ජුරුවෝ ආකාශයට මල්දම් සයක් දමන්නට සම්මත කළ හ. එ සේ දැමූ මල්දම් සය ගොසින් වෙන වෙනම රථවල එලුණේය. එ වේලෙ හි බොහෝදෙන රථ ඉස්වල එලෙන්නාවූ මල්දම් දැක සැක දුරු කළ හ.

## ස්වර්ග ප්‍රාප්තිය

ඉක්බිති රජ්ජුරුවෝ තෙරුන්වහන්සේට දන්වන්නෝ, "ස්වාමිනි, සදෙව්ලොවින් කවර දෙව්ලොව යහපත්දැ"යි විචාළ හ. තෙරුන්වහන්සේ වදාරන සේක්, "දෙවයෙනි, තුසිතභවනය යහපත. බුදුවන සමය බලා හිඳිනා මෛත්‍රී, බොධිසත්වයෝ ත් එ හි ම වෙසෙති"යි වදාළ සේක. එබස් ඇසූ රජ්ජුරුවෝ ඒ තුසිත භවනයෙ හි ආලය කොට තමන් බැඳවූ රුවන්වැලිදාගබ් වහන්සේ බල බලා වැද හෙව මිය නිදා පිබිදියක්හු මෙන් තුසිතභවනයෙන් ගෙනා රථයෙ හි ඔපපාතිකව දිව්‍යපුත්‍රයෙක් ව ඉපද තමන් කළ කුශල විපාකය මහාජනයාට ප්‍රකාශ කරන පිණිස රථයෙ හි ම සිට සැට ගැලක් පුරා ලන ආභරණයෙන් සැරහී බොහෝදෙනා බල බලා සිටියදී ම රථයෙන් බැස තුන්විටක් රුවන්වැලි දාගබ්වහන්සේ වැඳ පැදකුණුකොට සයානුකෙළක් මහරහතුන් වහන්සේ වැඳ අවකාශ ඉල්වා ගෙන මලණු වන් ඇතුළුවූ රාජ්‍යවාසීන්ට "මා ලද්දා වූ මේ දිව්‍යම සම්පත් බලා හැම වේලෙ හි ම නො පමාව පින්කම් කරව"යි සියල්ලවුන්ට අවවාද කොට තුසිත දිව්‍ය ලොකයට ගියා හ.

ඉක්බිති රජ්ජුරුවන් මළ පසු රජ්ජුරුවන් ගේ සොළොස් දහසක් පුර ස්ත්‍රීහු රජ්ජුරුවන් මළ බැවූ දැන තම තමන් ගේ හිසකේවැටී මුදා පිට මැද හෙළා හැඬු ය. එ තැන් හි කරන ලද සාලාව මකුටසාලා නම් විය. නැවත රජ්ජුරුවන් සෑයට නැගු කල් හි බොහෝ දෙන දොහොත් මුදුනෙ හි තබා ගෙන හැඬූ හ. එ තැන් හි කරන ලද සාලාව විරවිත්ථසාලා නම් විය. රජ්ජුරුවන් දැවූ තැන්හි මළුව රාජමාලක නම් විය.

ඉක්බිති රජ්ජුරුවන්ගේ මලණුවෝ, තිස්ස කුමාරයෝ, ඔටුනු පැලඳ බෑණන් බැඳවූ ඒ දාගැබෙ හි නො නිමි කොත්කැරැල්ල හා සුනුමෙහෙවර කරවා කොත් පලඳවා පූජා කැරවූ හ.

එ සේ හෙයින් සත්පුරුෂයන් ගේ සිත් පහදවනු පිණිස කරන ලද ථූපවංසයෙ හි රුවන්වැලි දාගබ් කථාව මෙ ලෙසින් කියා නිමවන ලදි.

මේ දුටුගැමුණු රජ්ජුරුවන් ගේ පියාණෝ කාවන්තිස්ස රජ්ජුරුවෝ මතු බුදු වන මෛත්‍රී බුදුන්ට පියවන්නාහු ය. දුටුගැමුණු රජ්ජුරුවන් ගේ මෑණියෝ විහාරමහාදේවී ඒ මෙතේ බුදුන්වහන්සේට මවු වන්නාහු ය. මේ දුටුගැමුණු රජ්ජුරුවෝ ඔබට දකුණත් සවු වන්නා හ. තිස්ස නම් මලණු වෝ ඒ බුදුන්ට වමත් සවු වන්නා හ. කාවන්තිස්ස රජ්ජුරුවන්ට නං වූ දුටු ගැමුණු රජ්ජුරුවන්ට නැඳි වූ අනුලාදේවි ඒ මෙතේ බුදුන් බුදු වන ජාතියෙ හි ගිහිගෙයි වැඩ හිඳිනා කල ලක්ෂයක් බිසෝවරුන්ට ප්‍රධාන අග මෙහෙසුන් වන්නා හ. දුටුගැමුණු රජ්ජුරුවන් ගේ පුතණුවෝ සාලිය රාජ කුමාරයෝ, ඒ මෙතේ

බුදුන්වහන්සේට පුත් වන්නා හ. මේ දුටුගැමුණු රජ්ජුරුවන් ගේ භාණ්ඩාර රක්ෂාවෙ හි සිටි සංඝ නම් අමාත්‍ය ඒ මෛත්‍රී බුදුන්වහන්සේට අග්‍ර උපස්ථායක වන්නේ ය. ඒ භාණ්ඩාගාරින් ගේ දූ ඒ බුදුන්ට අග්‍ර උපස්ථායිකා වන්නා හ. මෙ සේ මොහු හැමදෙනම මාහැඟි කොට කරනලද පින්කම් ඇත්තාහු ඒ මෛත්‍රී බුදුන්ගෙන් බණ අසා සිවු පිළිසිඹියාපත් රහත් ව කෙළවර නිරුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පැ නිවන් පුර වදනා හ. සකල විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතයන් විසින් කරනලද ථූපවංස කථාව කියා නිමවන ලදි.

ථූපවංස කථා නිමි.